ශ්‍රී ලංකා යුද්ධ හමුදාව















# 2016 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## ප්‍රස්ථාවනාව



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය කීර්තිමත් ඉතිහාසය පුරාවට, රටෙහි ජාතික අවශ්‍යතාවන් වෙනුවෙන් සුවිශාල සේවාවක් සිදුකරමින් සිටී. විශේෂයෙන්ම ක්‍රියාන්විත සමයෙහි පමණක් නොව පශ්චාද් යුද සමයෙහිද ඔවුන් විසින් සිදුකරන එම කැපකිරීම් හේතුවෙන් සියලු ශ්‍රී ලාංකේය ජන හදවත් තුළ, යුද්ධ හමුදාව කෙරෙහි පවතිනුයේ අපමණ විශ්වාසයකි.

පුරා දශක තුනක් මුළුල්ලේ රට තුළ පැවැති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම උදෙසා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය අඛණ්ඩ දායකත්වය ලබාදුන් අතර, ඒ හේතුවෙන් විජයග්‍රාහී වෘත්තීයමය යුද්ධ හමුදාවක් බවට පත්වීමට අපට හැකි විය. විශේෂයෙන්ම අද වන විට උදාවී ඇත්තේ අන් කවරදාකටත් වඩා ශීඝ්‍රයෙන් විවිධ වෙනස්වීම්වලට ලක්වන ආරක්ෂිත තත්ත්වයන්ගෙන් සමන්විත යුගයකි. එබැවින් ඕනෑම අභියෝගයක් වෙත සාර්ථකව මුහුණ දී, රටෙහි ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට අප නිරන්තර අවධානයෙන් සිටිය යුතුය. ඒ සඳහා නූතන තාක්ෂණය උපරිම ප්‍රයෝජනයට ගනිමින් සිය වෘත්තීයමය හැකියාවන් තවදුරටත් වර්ධනය කර ගැනීමේ වගකීම අප සතුව පවතී.

එබැවින්, දේශයේ මුරදේවතාවුන් ලෙස අප වෙත පැවරී ඇති මූලික කාර්යභාරයට අමතරව, ජනතාවට අවැසි ඕනෑම අවස්ථාවකදී අපගේ දායකත්වය ඔවුන් වෙනුවෙන් ලබාදීමට අප බැඳී සිටී. එනම්, අද වන විට ක්‍රියාත්මක වන ජාතික සංවර්ධන ව්‍යාපෘති වෙත සක්‍රීයව දායක වෙමින්, ශ්‍රී ලංකාව දිළිඳුකමින් නිදහස් කිරීමේ ජාතික අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා අපගේ දායකත්වය තවදුරටත් ලබාදිය යුතුව ඇත. එමෙන්ම, රට තුළ ඇතිවන විවිධ හදිසි ආපදාවන්වලදීද ජනතාවට අවැසි සහනසේවා කඩිනම්ව ලබාදෙමින් වෘත්තීයමය, ජවසම්පන්න හා ආදර්ශමත් යුද්ධ හමුදාවක් ලෙස ඉදිරියේදීත් ක්‍රියා කිරීමේ ප්‍රමුඛ වගකීම අප සතුව පවතී.

ඒ අනුව, වර්ෂ 2017 දී අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා අතීතයෙන් ලද අත්දැකීම්ද ආදර්ශයට ගනිමින් මෙම කාර්යසාධන වාර්තාවෙන් නිසැක පිටුබලයක් ලැබෙනු ඇතැයි මම විශ්වාස කරමි.



**ඒ ඩබ්ලිව් ජේ සී ද සිල්වා ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී**
ලුතිනන් ජෙනරාල්
යුද්ධ හමුදාධිපති

# පටුන


| | | |
|---|---|---|
| | රූප සටහන් නාමාවලිය. | iv |
| | ප්‍රස්තාර නාමාවලිය. | v |
| | සංඛ්‍යා සටහන් නාමාවලිය. | vi |
| | කෙටි යෙදුම්. | viii |
| | පෙරවදන. | ix |
| | ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආයතන ව්‍යුහය. | x |
| 1. | හැඳින්වීම. | 1 |
| 2. | 2016 වර්ෂය සඳහා අයවැය වෙන්කිරීම. | 4 |
| 3. | අභිනවයෙන් ස්ථාපිත සංස්ථා. | 5 |
| 4. | පේටන්ට් බලපත්‍රය ලබාගැනීම සඳහා තෝරාගත් නව සොයාගැනීම්. | 6 |
| 5. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා ව්‍යාපෘති. | 9 |
| 7. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා හදිසි ආපදා කලමනාකරණ මෙහෙයුම්. | 11 |
| 8. | යුධ සේවා ලේකම් ශාඛාව. | 13 |
| 9. | ප්‍රධාන මාණ්ඩලික ශාඛාව. | 15 |
| 10. | මූල්‍ය කලමනාකරණ ශාඛාව. | 24 |
| 11. | විධායක ජෙනරාල් ශාඛාව. | 42 |
| 12. | උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව. | 60 |
| 13. | යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව. | 67 |
| 14. | අධ්‍යක්ෂ ජෙනරාල් පාබල කාර්යාලය. | 76 |
| 15. | මූලස්ථානය හය්කාර්ය සම්පාදන අණසක. | 78 |
| 16. | ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය. | 80 |
| 17. | ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය. | 85 |

| | | |
|---|---|---|
| 18. | ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය. | 88 |
| 19. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය. | 90 |
| 20. | විනිසුරු අධි නීතිඥ ජෙනරාල් කාර්යාලය. | 95 |
| 21. | යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථානය. | 96 |
| 22. | සමාලෝචනය. | 100 |

**ඇමුණුම:**

යුද්ධ හමුදා මූලස්ථාන ජ්‍යෙෂ්ඨ නිලධාරී තනතුරු නාමාවලිය.


නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## <u>රූප සටහන් නාමාවලිය</u>


| අනු අංක | මාතෘකාව | පිටුව |
|---|---|---|
| රූප සටහන 9.1: | ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ ඇති සංස්ථා. | 15 |
| රූප සටහන 10.1: | මූල්‍ය කලමනාකරණ ශාඛාව යටතේ ඇති සංස්ථා. | 24 |
| රූප සටහන 11.1: | විධායක ජෙනරාල් ශාඛාව යටතේ ඇති සංස්ථා. | 42 |
| රූප සටහන 12.1: | උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ ඇති සංස්ථා. | 60 |
| රූප සටහන 13.1: | යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ ඇති සංස්ථා. | 67 |
| රූප සටහන 17.1: | ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය යටතේ ඇති සංස්ථා. | 85 |
| රූප සටහන 19.1: | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය යටතේ ඇති සංස්ථා. | 90 |
| රූප සටහන 22.1: | යුද්ධ හමුදා පුහුණු අණසක යටතේ ඇති සංස්ථා. | 96 |


නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## ප්‍රස්ථාර නාමාවලිය


| අනු අංක | | මාතෘකාව | පිටු අංක |
|---|---|---|---|
| ප්‍රස්ථාරය | 1.1: | යුද්ධ හමුදා මානව සම්පත් සංයුතිය. | 1 |
| ප්‍රස්ථාරය | 1.2: | රෙජිමේන්තු අනුව මානව සම්පත් සංයුතිය. | 3 |
| ප්‍රස්ථාරය | 2.1: | අයවැය වෙන්කිරීම සහ වියදම. | 4 |
| ප්‍රස්ථාරය | 3.1: | බඳවා ගැනීමේ ප්‍රගතිය. | 21 |
| ප්‍රස්ථාරය | 10.1: | පුනරාවර්තන වෙන්කිරීම් සහ වියදම්. | 25 |
| ප්‍රස්ථාරය | 10.2: | මූලධන වෙන්කිරීම් සහ වියදම්. | 26 |
| ප්‍රස්ථාරය | 10.3: | වර්ෂය තුළ සිදුකරන ලද ගෙවීම්. | 36 |
| ප්‍රස්ථාරය | 15.1: | වෘත්තීය පරීක්ෂණ සාරාංශය. | 79 |

## සංඛ්‍යා සටහන් නාමාවලිය


| අනු අංක | මාතෘකාව | පිටු අංක |
|---|---|---|
| සංඛ්‍යා සටහන 1.1: | ශ්‍රී ලංකා යුද්ධ හමුදා මානව සම්පත් සංයුතිය. | 1 |
| සංඛ්‍යා සටහන 1.2: | රෙජිමේන්තු අනුව මානව සම්පත් සංයුතිය. | 2 |
| සංඛ්‍යා සටහන 2.1: | අයවැය වෙන්කිරීම සහ වියදම 2016 වර්ෂය. | 4 |
| සංඛ්‍යා සටහන 8.1: | නිලධාරී නිල උසස් කිරීම් 2016 වර්ෂය. | 15 |
| සංඛ්‍යා සටහන 8.2: | 2014/2015/2016 වර්ෂ තුළ විශ්‍රාම ගිය නිලධාරී සංඛ්‍යා සංසන්දනය. | 16 |
| සංඛ්‍යා සටහන 9.1: | බඳවාගැනීම් සහ දේශීය පුහුණුව. | 17 |
| සංඛ්‍යා සටහන 9.2: | ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාස. | 17 |
| සංඛ්‍යා සටහන 9.3: | විදේශීය පුහුණු අභ්‍යාස. | 18 |
| සංඛ්‍යා සටහන 9.4: | විදේශීය තරග. | 18 |
| සංඛ්‍යා සටහන 9.5: | දැනුවත් කිරීම, පුහුණු හා භාවනා වැඩසටහන්. | 20 |
| සංඛ්‍යා සටහන 9.6: | නිලධාරී සහ සෙසුනිල සංඛ්‍යා සංයුතිය. | 20 |
| සංඛ්‍යා සටහන 9.7: | අනුමත සහ බඳවාගත් සංඛ්‍යා සංයුතිය. | 20 |
| සංඛ්‍යා සටහන 9.8: | සිවිල් සේවක සංඛ්‍යා සංයුතිය. | 21 |
| සංඛ්‍යා සටහන 10.1: | පුනරාවර්තන වෙන්කිරීම් සහ වියදම්. | 25 |
| සංඛ්‍යා සටහන 10.2: | මූලධන වෙන්කිරීම් සහ වියදම්. | 26 |
| සංඛ්‍යා සටහන 10.3: | ඇස්මේන්තු ගත කරන ලද අයවැය වෙන්කිරීම්. | 27 |
| සංඛ්‍යා සටහන 10.4: | නිලධාරී සහ සෙසුනිල වැටුප්. | 29 |
| සංඛ්‍යා සටහන 10.5: | ක්‍රියාන්විතයේදී මියගිය/ආබාධිතවූ/ඉවත් කල අයවළුන් සඳහා කරන ලද ගෙවීම්. | 29 |
| සංඛ්‍යා සටහන 10.6: | විදේශිය පාඨමාලා සංචාර සහ සම්මන්ත්‍රණ සඳහා කරන ලද ගෙවීම්. | 29 |
| සංඛ්‍යා සටහන 10.7: | ආබාධිත විශ්‍රාමික වැටුප් හා පාරිතෝෂික මුදල් ගෙවීම්. | 30 |
| සංඛ්‍යා සටහන 10.8: | ප්‍රමුඛතා බී ගිණුම් අරමුදල. | 30 |
| සංඛ්‍යා සටහන 10.9 : | යුද්ධ හමුදා යහසාධක අරමුදල. | 30 |
| සංඛ්‍යා සටහන 10.10: | සුවසහන ණය ක්‍රමය ලෙස නගා සිටුවන ලද සුභසාධන ණය ක්‍රමය. | 31 |
| සංඛ්‍යා සටහන 10.11: | යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දෙමාපියන් සඳහා වූ විශේෂ දීමනා. | 31 |
| සංඛ්‍යා සටහන 10.12: | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්. | 31 |
| සංඛ්‍යා සටහන 10.13: | ආබාධිත තත්වය මත සේවයෙන් ඉවත් කරන ලද සෙසුනිල විස්තරය. | 32 |
| සංඛ්‍යා සටහන 10.14: | පුනරාවර්තන වියදම් සඳහා අපේක්ෂිත මූලික වෙන්කිරීම්. | 32 |
| සංඛ්‍යා සටහන 10.15: | වාර්ෂික මණ්ඩල සාරාංශය. | 33 |
| සංඛ්‍යා සටහන 10.16: | උපයාගත් ආදායම්. | 34 |
| සංඛ්‍යා සටහන 10.17: | අපේක්ෂිත ආදායම්. | 34 |
| සංඛ්‍යා සටහන 10.18: | ආයෝජන - ණය. | 35 |
| සංඛ්‍යා සටහන 10.19: | ආයෝජන සාරාංශය. | 36 |
| සංඛ්‍යා සටහන 10.20: | වර්ෂය තුළ සිදුකරන ලද ගෙවීම්. | 36 |
| සංඛ්‍යා සටහන 10.21: | ආයෝජන සැබෑදි සුභසාධන විස්තර. | 37 |
| සංඛ්‍යා සටහන 10.22: | ජාතික අයවැය වෙන්කිරීම. | 40 |
| සංඛ්‍යා සටහන 10.23: | සත්‍ය වාර්ෂික වෙන්කිරීම්. | 41 |
| සංඛ්‍යා සටහන 10.24: | ක්‍රියාන්විතයේදී මියගිය ආබාධිත වූ ඉවත් කල අයවළුන් සඳහා කරන ලද ගෙවීම්. | 41 |
| සංඛ්‍යා සටහන 11.1: | අරමුදල් වෙන් කිරීමේ ක්‍රමික වැඩි වීම් සහ අඩුවීම්. | 46 |
| සංඛ්‍යා සටහන 11.2: | වර්ෂය තුළ සිදු වූ මාර්ග අනතුරු. | 49 |
| සංඛ්‍යා සටහන 11.3: | නිවාඩු නොමැතිව නොපැමිණි සහ නැවත බඳවාගත් ප්‍රමාණය. | 50 |
| සංඛ්‍යා සටහන 11.4: | මාර්ග අනතුරු වළකා ගැනීම සැබෑදිව දැනුවත් කිරීම. | 50 |
| සංඛ්‍යා සටහන 11.5: | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්පාදනය කරන ලද සුභසාධන පහසුකම්. | 53 |
| සංඛ්‍යා සටහන 11.6: | රණවිරු නිවාස අරමුදල. | 54 |
| සංඛ්‍යා සටහන 11.7: | රණවිරු නිවාස අරමුදල. | 54 |
| සංඛ්‍යා සටහන 12.1: | මූල්‍ය තොරතුරු. | 63 |
| සංඛ්‍යා සටහන 12.2: | මෙම වර්ෂය තුළදී වැය ශීර්ෂ භාවිතය. | 61 |

| | | |
|---|---|---|
| සංඛ්‍යා සටහන 12.3: | මූල්‍ය විස්තරය. | 63 |
| සංඛ්‍යා සටහන 12.4: | මූලධන වෙන්කිරීම් සහ වියදම්. | 66 |
| සංඛ්‍යා සටහන 12.5: | පුනරාවර්තන වෙන්කිරීම් සහ වියදම්. | 66 |
| සංඛ්‍යා සටහන 13.1: | මූල්‍ය විස්තරය. | 68 |
| සංඛ්‍යා සටහන 13.2: | ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී පාරිභෝගික බලය ක්‍රියාවට නැංවීම. | 71 |
| සංඛ්‍යා සටහන 13.3: | වැය ශීර්ෂ අරමුදල් සාරාංශය. | 72 |
| සංඛ්‍යා සටහන 13.4: | මූල්‍ය ප්‍රගතිය. | 74 |
| සංඛ්‍යා සටහන 15.1: | වෘත්තිය පරීක්ෂණ සාරාංශය. | 79 |
| සංඛ්‍යා සටහන 16.1: | මානුෂවාදී බිම් බෝම්බ කළමනාකරණ පාඨමාලා. | 81 |
| සංඛ්‍යා සටහන 18.1: | වාර්ෂික ක්‍රීඩා ජයග්‍රහණ. | 89 |
| සංඛ්‍යා සටහන 19.1: | ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය. | 93 |

## කෙටියෙදුම් නාමාවලිය

| | |
|---|---|
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (යාපනය) | ආසේමු (යා) |
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (වන්නි) | ආසේමු (ව) |
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) | ආසේමු (නැ) |
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (කිළිනොච්චි) | ආසේමු (කිළි) |
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (මුලතිව්) | ආසේමු (මුල) |
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (බටහිර) | ආසේමු (බ) |
| ආරක්‍ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) | ආසේමු (ම) |
| ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය | ශ්‍රීලසසබ |
| ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව | ශ්‍රීලකාහ |
| ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය | ශ්‍රීලංඉබ |
| ශ්‍රී ලංකා සංඥා බලකාය | ශ්‍රීලංසංබ |
| ශ්‍රී ලංකා පාබල හමුදාව | ශ්‍රීලපාහ |
| ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | ශ්‍රීලංසිරෙ |
| ගැමුණු හේවා බලකාය | ගැහේබ |
| ගජබා රෙජිමේන්තුව | ගරෙ |
| විජයබාහු පාබල රෙජිමේන්තුව | විපාරෙ |
| යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව | යාපාරෙ |
| කමාන්ඩෝ රෙජිමේන්තුව | කරෙ |
| විශේෂ බලකාය | විබ |
| සන්නද්ධ බුද්ධි බලකාය | සබුබ |
| ඉංජිනේරු සේවා බලකාය | ඉසේබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය | ශ්‍රීලයුසේබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය | ශ්‍රීලයුයුබ |
| ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව | ශ්‍රීලවියාඉරෙ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය | ශ්‍රීලයුවෛබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය | ශ්‍රීලයුපොහේබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය | ශ්‍රීලයුපොදුසේබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය | ශ්‍රීලයුකාබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකාය | ශ්‍රීලයුපුබ |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදා රයිෆල් බලකාය | ශ්‍රීලංරබ |
| ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුව | ශ්‍රීලංජාආබමු |

# පෙරවදන

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූලික කාර්යභාරය වන භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කර ගැනීමට අමතරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය දායකත්වය සංවර්ධන ක්‍රියාවලින්ටද ලබා දී ඇත. ශ්‍රී ලංකා යුධ හමුදාව ජාතික ව්‍යසන හා හදිසි ආපදා තත්වයන්හීදි විශාල කාර්යභාරයක් සිදුකරන ලදී. 2016 ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කාර්ය සාධන වාර්ෂික වාර්තාව, ඉදිරි වර්ෂය සඳහා නිර්දේෂකයන් මෙන්ම මෙම වර්ෂය පුරාවට යුද්ධ හමුදාවේ කාර්ය සාධනය සහ වාර්ෂික අයවැය වාර්තාව සපයයි. සෑම පරිච්ඡේදයකින්ම යුද්ධ හමුදා ශාඛා හා අධ්‍යක්ෂ මණ්ඩල වල දළ විශ්ලේෂණයක් හා එම අවුරුද්ද තුළ එහි ක්‍රියාකාරීත්වයේ සමාලෝචනය අන්තර්ගත වේ.

2. 2016 වර්ෂය තුළ එම අදාල කාලය තුළ රුඃමිඃ 160,000.86 (මූලධන රුඃමිඃ 8,336.26 සහ පුනරාවර්තන රුඃමිඃ 151,664.60) ක මුදලක් මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා වෙන් කරන ලදී. මෙම වර්ෂය තුළ සිදු කරන ලද මුළු වියදම් වල වටිනාකම රුඃ මිඃ 147,552.76 කි.

3. භටපිරිස් වල පුහුණුව සඳහා ප්‍රමුඛත්වය ලබාදීම සිදු කරන ලදී. මෙම වර්ෂය තුළ නිලධාරි 552 ක් හා සෙසුනිල 8,190 ක් බඳවා ගන්නා ලදී.

4. කාන්තා ප්‍රභූ ආරක්ෂක කණ්ඩය, සුප සහායක බලඇණිය, යුධෝපකරණ පුහුණු පාසල, යුධෝපකරණ කර්මාන්ත ශාලාව සහ ඉපලෝගම හා හේනානිගල පුහුණු මධ්‍යස්ථාන අභිනවයෙන් ස්ථාපනය කරන ලදී. කොමිෂන් නොලත් නිලධාරී පුහුණු පාසල යුද්ධ හමුදා වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය ලෙස සංශෝධනය කර ප්‍රතිස්ථාපනය කල අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකාය ඒකක 2 ක් ලෙස බෙදාවෙන්කර ස්ථාපිත කරන ලදී. තවද 15 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව 15 නියමුවන් රහිත ගුවන් යානා ඒකකය ලෙස අනුවර්ථනය කරන ලදී.

5. ඉකුත් වසර තුළදී ශ්‍රී ලංකාවට හා යුද්ධ හමුදාවට කීර්තියන් අත්කර දෙමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික මට්ටමේ තරඟවලදී විශේෂ කුසලතා එලි දක්වමින් ජයග්‍රහණ කිහිපයක් අත්පත් කර ගැනීමට සමත් විය. ජාත්‍යාන්තර තරග වලදී රන් පදක්කම් 34 ක්, රිදී පදක්කම් 35 සහ ලෝකඩ පදක්කම් 41 ක් දිනා ගැනීමට යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් වී ඇත.

6. ශ්‍රී ලංකා යුද්ධ හමුදා මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරිමේ ඒකකය දැනට ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රමුඛතම බිම් බෝම්බ ඉවත් කිරීමේ ආයතනය ලෙස හඳුන්වා දිය හැකිය. 2016 වසර තුළ වර්ග මීටර් 3, 457,853 ක භූමි ප්‍රමාණයක බිම් බෝම්බ ඉවත් කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරීමේ ඒකකය සමත් වී ඇත.

7. සංවර්ධන කටයුතු සඳහා උපරිම දායකත්වය ලබාදුන් අතර කීරමලේ, සාලාව (කොස්ගම), අරනායක එලගපිටිය හා වැලිකන්ද යන ප්‍රදේශවල හදිසි ආපදා තත්වයන් හේතුවෙන් අවතැන් වූ පුද්ගලයන් බොහෝමයක් දෙනා වෙනුවෙන් නිවාස තනාදීමෙන්, ආහාර හා ජලය ලබාදීමෙන් හා අවශ්‍ය ඖෂධ වර්ග ලබාදීමෙන් සහාය ලබාදෙන ලදී.

8. යුද්ධ හමුදා සාමාජිකයන්ගේ සුභසාධනය වෙනුවෙන් විශාල කාර්යභාරයක් එම වසර තුළදී සිදුකරන ලදී. යුද්ධ හමුදා මානුෂීය මෙහෙයුමේදී මියගිය හා තුවාල ලැබූ සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් උදෙසා නව සුභසාධන වැඩසටහන් කිහිපයක් ආරම්භ කරන ලද අතරම දැනට සේවයේ නියුක්ත හා විශ්‍රාම ගිය සාමාජිකයින්ගේ සුභසාධනය වෙනුවෙන් නව සුභසාධන ක්‍රම නගාසිටුවන ලදී.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථාන සංවිධාන ව්‍යුහය**



# ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්ෂේත්‍ර සංවිධාන ව්‍යුහය



## ශ්‍රී ලංකා යුද්ධ හමුදා රෙජිමේන්තු



# ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුහුණු සංස්ථා

ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති

ආඥාපති යුද හමුදා පුහුණු අණසක

- ශ්‍රී ලංකා යුද හමුදා විද්‍යා පීඨය (දියතලාව)
- නිළධාරී ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානය (බුත්තල)
- යුද හමුදා පුහුණු පාසල (මාදුරුඔය)
- පාබල පුහුණු මධ්‍යස්ථානය (මින්නේරිය)
- සටන් පුහුණු පාසල (අම්පාර)
- යුද හමුදා ශාරීරික අධ්‍යන පුහුණු පාසල (පනාගොඩ)
- ස්වේච්ඡා බලසේනා පුහුණු පාසල (දියතලාව)
- ප්‍රගුණ හා සැගවුණු වෙඩික්කරු පුහුණු පාසල (දියතලාව)
- කොමිෂන් නොලත් නිළධාරී පුහුණු පාසල ( කලාඔය)
- ශ්‍රී ලංකා සාමසාධක මෙහෙයුම් පුහුණු ආයතනය ( කුකුලේගග)
- යුද හමුදා භට කාර්‍ය සම්පාදන විද්‍යාලය ( ත්‍රීකුණාමලය)

## හැඳින්වීම

1. 2016 වර්ෂය තුළදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූලික කාර්යභාරය වන භෞමික අඛණ්ඩත්වය ආරක්ෂා කරගැනීමට අමතරව යුද්ධ හමුදා මානව සම්පත ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහාද උපයෝජනය කිරීම තුළින් මහජන මුදල් සම්භාරයක් ඉතිරි කරදීමට සමත් විය. මෙය ජාතික ආර්ථිකයට විශාල රුකුලක් වේ. එමෙන්ම රටේ හදිසි අවස්ථාවන්හිදී යුද්ධ හමුදාවේ කාර්යක්ෂම දායකත්වය කැපී පෙනෙන කරුණකි.

2. 2016 වාර්ෂික කාර්ය සාධන වාර්තාව, වාර්ෂික කාර්ය සාධනය, අයවැය වෙන් කිරීම පිළිබඳ විශ්ලේෂනාත්මක වාර්තාවක් සපයනු ලබයි. එමෙන්ම 2016 වර්ෂය තුළ සැලසුම්ගත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමේ සංක්ෂිප්තභාවය විශ්ලේෂණය කොට 2017 වර්ෂය සැලසුම් කිරීමට බලාපොරොත්තු වේ.

**<u>යුද්ධ හමුදා මානව සම්පත් සංයුතිය</u>**

3. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා අනුමත සහ දැනට සිටින කාර්‍ය්‍ය මණ්ඩල සංයුතිය පහත පරිදි වේ:

| | නිලධාරී | | සෙසුනිල | |
|---|---|---|---|---|
| | අනුමත ප්‍රමාණය | දැනට සිටින | අනුමත ප්‍රමාණය | දැනට සිටින |
| නිත්‍ය | 7,743 | 7,175 | 119,570 | 106,332 |
| ස්වේච්ඡා | 2,899 | 2,559 | 70,149 | 61,072 |
| එකතුව | **10,642** | **9,734** | **189,719** | **167,404** |

සංඛ්‍යා සටහන 1.1: යුද්ධ හමුදා මානව සම්පත් සංයුතිය.




ප්‍රස්තාරය 1.1: යුද්ධ හමුදා මානව සම්පත් සංයුතිය.

4. **<u>රෙජිමේන්තු අනුව මානව සම්පත් සංයුතිය.</u>** ශ්‍රී ලංකා යුද්ධ හමුදාව රෙජිමේන්තු 24 කින් සමන්විත වන අතර ඒවා පාබල රෙජිමේන්තු, සහය රෙජිමේන්තු සහ සේවා රෙජිමේන්තු ලෙස වර්ග 03 කි.

| අ/අ | රෙජිමේන්තුව | නිත්‍ය | | ස්වේච්ඡා | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| | | නිලධාරී | සෙසුනිල | නිලධාරී | සෙසුනිල | නිලධාරී | සෙසුනිල |
| 1. | ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය | 262 | 4229 | 35 | 702 | **297** | **4931** |
| 2. | ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව | 371 | 5722 | 58 | 1090 | **429** | **6812** |
| 3. | ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය | 303 | 6177 | 44 | 1386 | **347** | **7563** |
| 4. | ශ්‍රී ලංකා සංඥා බලකාය | 327 | 4990 | 23 | 568 | **350** | **5558** |
| 5. | ශ්‍රී ලංකා පාබල හමුදාව | 429 | 9062 | 165 | 3664 | **594** | **12726** |
| 6. | ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | 452 | 9378 | 145 | 4014 | **597** | **13392** |
| 7. | ගැමුණු හේවා බලකාය | 448 | 9141 | 158 | 3494 | **606** | **12635** |
| 8. | ගජබා රෙජිමේන්තුව | 439 | 9430 | 179 | 4110 | **618** | **13540** |
| 9. | විජයබාහු පාබල රෙජිමේන්තුව | 421 | 8357 | 157 | 3578 | **578** | **11935** |
| 10. | යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව | 154 | 2529 | 23 | 502 | **177** | **3031** |
| 11. | කමාන්ඩෝ රෙජිමේන්තුව | 186 | 3148 | - | - | **186** | **3148** |
| 12. | විශේෂ බලකාය | 161 | 2430 | - | - | **161** | **2430** |
| 13. | සන්නද්ධ බුද්ධි බලකාය | 129 | 2611 | 42 | 1002 | **171** | **3613** |
| 14. | ඉංජිනේරු සේවා බලකාය | 158 | 2953 | 109 | 10212 | **267** | **13165** |
| 15. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය | 155 | 4107 | 28 | 823 | **183** | **4930** |
| 16. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය | 270 | 3904 | 19 | 521 | **289** | **4425** |
| 17. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය | 139 | 3329 | 14 | 393 | **153** | **3722** |
| 18. | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව | 182 | 3528 | 23 | 1525 | **205** | **5053** |
| 19. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය | 144 | 3261 | - | - | **144** | **3261** |
| 20. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය | 287 | 3058 | 173 | 2584 | **460** | **5642** |
| 21. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය | 74 | 715 | 94 | 2329 | **168** | **3044** |
| 22. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකාය | - | - | 30 | 1127 | **30** | **1127** |
| 23. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා රයිෆල් බලකාය | - | - | 45 | 1143 | **45** | **1143** |
| 24. | ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව | - | - | 553 | 13419 | **553** | **13419** |
| | එකතුව | **5,491** | **102,059** | **2,117** | **58,186** | **7,608** | **160,245** |

සංඛ්‍යා සටහන 1.2: රෙජිමේන්තු අනුව මානව සම්පත් සංයුතිය.




ප්‍රස්තාරය 1.2: රෙපිමේන්තු අනුව මානව සම්පත් සංයුතිය.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## 2016 වර්ෂය සඳහා අයවැය වෙන්කිරීම

1. 2016 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තු අනුව රාජ්‍ය භාණ්ඩාගාරය විසින් පුනරාවර්තන හා මුලධන වියදම් සඳහා වෙන්කරන ලද අයවැය වෙන්කිරීම් පහත සඳහන් පරිදි වේ.

| වැය ශීර්ෂ අංකය | විස්තරය | 2016 වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදන රු: | 2016.12.31 දිනට සත්‍ය වියදම රු: | 2016.12.31 දිනට සත්‍ය ඉතිරිය රු |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | |
| 1001 -1003 | පුද්ගලික වැටුප් | 121,250.19 | 117,651.84 | 3,598.34 |
| 1101-1508 | වෙනත් පුනරාවර්තන | 30,414.42 | 26,279.02 | 4,135.40 |
| | එකතුව | **151,664.60** | **143,930.86** | **7,733.74** |
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| 2001-2003 | මුලධන වත්කම් පුනුරුත්තාපනය කිරීම හා වැඩි දියුණු කිරීම | 480.70 | 340.53 | 140.17 |
| 2101-2105 | මුලධන වත්කම් අත්පත් කරගැනීම | 2,162.10 | 1,842.00 | 320.10 |
| 2401 | පුහුණු සහ ශාකාත්‍යා වර්ධනය | 1,100.00 | 1,102.93 | (2.93) |
| 2502 17 | වෙනත් ආයෝජන | 2,305.94 | 280.01 | 2,025.93 |
| 2502 17 | වෙනත් ආයෝජන (ණය සීමාව) | 2,287.52 | 56.44 | 2,231.08 |
| | **එකතුව** | **8,336.26** | **3,621.90** | **4,714.35** |
| | **මුළු වියදම** | **160,000.86** | **147,552.76** | **12,448.09** |

| ප්‍රමුඛතා ගිණුම | මුදල රු:මි |
|---|---|
| උපරිම සීමාව | 2,750.00 |
| 2016.12.31 දිනට වියදම | 2,749.59 |
| නැවත අයකරගත් මුදල | 2,732.28 |

සංඛ්‍යා සටහන 2.1: 2016 වර්ෂය සඳහා අයවැය වෙන්කිරීම.




ප්‍රස්තාරය 2.1: අයවැය වෙන්කිරීම සහ වියදම.

## අභිනවයෙන් ස්ථාපිත සංස්ථා හා ආයතන

**කාන්තා ප්‍රභූ ආරක්ෂක කණ්ඩය**. 2016.04.25 වන දින කාන්තා ප්‍රභූ ආරක්ෂක කණ්ඩය 04 වන කමාන්ඩෝ රෙජිමේන්තු සංස්ථාවට ඇතුලත් කරන ලදී. එමගින් විදේශීය ප්‍රභූ කාන්තාවන් සඳහා ආරක්ෂාව සැපයීමද නවීන හමුදාවක් ලෙස වෘත්තිමය හැකියාවන් වර්ධනය කිරීමද අපේක්ෂා කෙරේ.



**නියමුවන් රහිත ගුවන් යානා ඒකකය**. නවීන යුද්ධ හමුදාවක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් සහ සාම සාධක මෙහෙයුම් වලදි වැඩි අවස්ථාවක් ලබා ගැනීමේ අරමුණින් 2016.03.01 වන දින 15 වන ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තුව 15 වන නියමුවන් රහිත ගුවන් යානා ඒකකය ලෙස සංශෝධනය කරන ලදී.



**යුධෝපකරණ පුහුණු පාසල සහ යුධෝපකරණ කර්මාන්ත ශාලාව.** ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුධෝපකරණ නිෂ්පාදනය නඩත්තුව හා අළුත්වැඩියාව යුද්ධ හමුදාව තුලම සිදුකිරීම තුලින් වියදම් අඩු කරගැනීමේ අරමුණින් 2016.03.01 වන දින යුධෝපකරණ පුහුණු පාසල හා යුධෝපකරණ කර්මාන්ත ශාලාව ආයතන 02 ක් ලෙස නගා සිටුවීම.



**සූප සහයක බලඇණිය**. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සූප සහයක හැකියාව වර්ධනය කිරීමට සහ රාජ්‍ය උත්සව අවස්ථාවන් සඳහා අවශ්‍ය සහය ලබාදීමටද 2016.03.01 සූප සහයක බලඇණිය නගා සිටුවන ලදී.



**ආධුනික පුහුණු පාසල**. යුද්ධ හමුදාවට අලුතින් බඳවාගත් සිවිල් පුද්ගලයන් සම්පූර්ණ සොල්දාදුවෙක් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය ආධුනික පුහුණුව ලබාදීමටද ආධුනික පුහුණු පාසල්, පුහුණු පාඨමාලා සහ පුහුණු උපදේශකවරු සම්බන්ධිකරණය කිරීමේ අරමුණින් 2016.02.12 වන ඉපලෝගම සහ හේනානිගල පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කරන ලදී.

**යුධ හමුදා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය**. 2016.05.10 වන දින කොමිෂන් නොලත් නිලධාරී පුහුණු පාසල යුද්ධ හමුදා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ලෙස පරිවර්තනය කරන ලදී. මේ තුළින් විශ්‍රාම ගැනීමට නියමිත සොල්දාදුවන්ගේ වෘත්තීය දැනුම වැඩිදියුණු කිරීම හා ජීවන තත්වය නගා සිටුවීම අපේක්ෂා කරනු ලබයි.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නව නිපැයුම් සහ නව සොයාගැනීම්

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරී සහ සෙසුනිල නව නිපැයුම්කරුවන් හදුනාගෙන දිරිගැන්වීමේ අරමුණින් සහ යුධ හමුදා ආයතන දියුණු කිරීම සඳහා නව නිපැයුම් ප්‍රදර්ශනයක් හදුන්වා දෙන ලදී. එම ප්‍රදර්ශන ආරක්ෂක සේනා මුලස්ථාන මට්ටමින් පවත්වන ලද අතර එහිදී පේටන්ට් බලපත්‍රය ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමට නව නිපැයුම් කිහිපයක් තෝරා ගන්නා ලදී. එසේ තෝරා ගන්නා ලද නව නිපැයුම් කිහිපයක් පහත පරිදි වේ.

### ගුරුත්වාකර්ෂණ බලයෙන් ක්‍රියාත්මක වන ජල පොම්පය



ගුරුත්වාකර්ෂණ බලය උපයෝගී කරගෙන ක්‍රියාත්මක වන ජල පොම්පය සෙ/7Q01926 ලා/කෝ තිලකසිරි එස්ඩී (7 ශ්‍රීලංජාආබමු) විසින් නිපදවා ඇති අතර ඒ සඳහා දරන වියදම රුː 7,500.00 කි.

### මහ පරිමාණ ඉදිආප්ප සැකසීමේ යන්ත්‍රය



මෙමගින් එකවර ඉදිආප්ප විශාල ප්‍රමාණයක් සැකසීමේ හැකියාව ඇති අතර එය සෙ/9Q02007 සැරයන් නලින් කුමාර (9 ශ්‍රීලංජාආබමු) ගේ නව සොයා ගැනීමකි. මේ සඳහා දරන ලද දළ වියදම රුː 23,000.00

### චලන සංවේදක භාවිතයෙන් ස්වයංක්‍රීය කුඩා අවි පාලනය සහ විමර්ෂණ පද්ධතිය




මෙම නිපැයුම ආරක්ෂක වළල්ලෙහි ආරක්ෂාව සඳහා සොල්දාදුවන් නොමැතිව භාවිතා කල හැකි අතර එහි ආරක්ෂක පද්ධතිය ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වේ. මෙය නි/5652 මේජර් ඩබ්ජ්එස් ප්‍රියාන් (23 ශ්‍රීලංජාආබමු) විසින් නිපදවා ඇති අතර ඒ සඳහා වන දළ වියදම රුː 30,000.00 කි.

### පීඅයි පයිප්ප නැවීමේ උපකරණය



මෝටරයක් භාවිතයෙන් මෙම උපකරණය ක්‍රියාකරන අතර එය සෙ/628850 ලා/කෝ මධුශංඛ කේකේඑල් (2 ශ්‍රීලවියාඉරෙ) ගේ නව නිපැයුමකි. ඒ සඳහා වන දළ වියදම රුː 30,000.00 කි.

## ඉලෙක්ට්‍රොනික් ලෙවල් මීටරය




ලේසර් කදම්බයක් සහ එල්ඩිආර් සමග ඒකාබද්ධ කරන ලද මෙම ඉලෙක්ට්‍රෝනික් ලෙවල් මීටරය සෙ/367753 කෝප්‍රල් හේරත් එච්එම්එම් (26 ශ්‍රීලංසිරෙ) විසින් නිපදවා ඇති අතර ඒ සඳහා දරන ලද වියදම රුː 4,500.00 කි.

## ආහාර කපන යන්ත්‍රය




මහා පරිමාණ ආහාර පිසීමේ කටයුතු සඳහා භාවිතා කරන ලද එලවළු කපන යන්ත්‍රයක් සෙ/323485 සාසෙ විජෙසේකර ඩිපිඩිඑස්ඩබ්ලිව් (1 සබුබ) විසින් නිපදවන ලද අතර ඒ සඳහා දරණ ලද වියදම රුː 25,000.00 කි.

## පතොරම් ඉවත් කිරීමේ යන්ත්‍රය මිමි 7.62 X 39



මෙම උපකරණය මගින් මිමි 7.62 x 39 ප්‍රමාණයේ පතොරම් අවම කාලයක් තුල ඉවත් කිරීමට හැකියාව ඇති අතර මෙය සෙ/ 604959 සාසෙ ගුණවර්ධන ඩිඩිජ්අයි (2 ශ්‍රීලයුයුබ ) ගේ නව නිපැයුමක් වන අතර ඒ සඳහා දරන ලද දළ වියදම රුː1,000.00 කි.

## ස්වංක්‍රීය වාහනයක ප්‍රධාන විදුලි ලාම්පු ආලෝකය අවම කිරීමේ උපකරණය



මෙම උපකරණය ඉදිරියෙන් පැමිණෙන වාහනවල ප්‍රධාන විදුලි ලාම්පු තුලින් නිකුත් වන ආලෝකය නිසා ධාවනයේදී ඇතිවිය හැකි දුෂ්කරතා මගහැරවීම සඳහා නිපදවා ඇත. එය සෙ/2M01026 කෝප්‍රල් විජේසිංහ ඩබ්ලිව්එම්එල්ටි (5 ශ්‍රීලවියාඉරෙ) ගේ නව නිපැයුමක් වන අතර ඒ සඳහා දරන ලද වියදම රුː 6,500.00 කි.

## <u>නැවිය හැකි යතුරුපැදිය</u>



මෙම උපකරණයට කිලෝ ග්රෑම් 70 ක බරක් දැරිය හැකි අතර එහි උපරිම වේගය පැයට කිලෝ මීටර් 40 කි. මෙහි විශේෂත්වය වන්නේ එය නවා අඩු ඉඩ ප්‍රමාණයක් තුළ ප්‍රවාහනය සහ රඳවා තැබීමට ඇති හැකියාවයි. නි/67872 කපිතන් ඩීඑම්පීඑම් දිසානායක නිලධාරියාගේ (ගන්නෝරුව ශ්‍රීලවියාඉරෙ පාසල) නිපැයුමක් වන අතර ඒ සඳහා දරන ලද වියදම රුඃ 26,000.00 කි.

## <u>ස්වයංක්‍රීය සුළු අවි වෙඩි තැබීම සහ වෙඩි තැබීමේ දිශාව සහ විමර්ෂණය කිරීමේ පද්ධතිය</u>



මෙම උපකරණය අංශක 360 කරකැවිමට හැකි වනසේ නිපදවා ඇති අතර ඒ තුලින් සුළු අවි වෙඩි තැබීම සහ වෙඩි තැබීමේ දිශාව මෙන්ම විමර්ෂණ කටයුතුද ස්වයංක්‍රීයව සිදු වේ. මෙය නිපදවන ලද්දේ සෙ/516563 කෝප්‍රල් ගුණරත්න එස්එම්ජීඑස් (11 විපාරෙ) විසිනි. ඒ සඳහා දරන ලද වියදම රුඃ 8,600.00 කි.

## <u>සණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ඒකකය</u>



මෙම සණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ඒකකය මගින් ඉවත දමන ආහාර භාවිතයෙන් වියලි සත්ව ආහාර නිෂ්පාදනය කිරීමට හැකියාව ඇත. මෙම උපකරණය සෙ/676575 මා/සැරයන් සමරවීර එස්එම්ආර්පි (4 ශ්‍රීලයුපොහේබ) ගේ නව නිපැයුමක් වන අතර ඒ සඳහා දරන ලද වියදම රුඃ 23,000.00 කි.

## <u>තේ දළු නෙලන යන්ත්‍රය</u>




මෙම තේ දළු නෙලීමේ යන්ත්‍රය සතුව නෙලීය යුතු තේ දළුවෙහි තත්ත්වය සහ දිග ප්‍රමාණය තීරණය කිරීමේ හැකියාව ඇති අතර එය සෙ/21F00409 සාසෙ අජිත් කුමාර කේජ්ජී (21 සෙව් ගැහේබ) ගේ නව නිපැයුමකි. ඒ සඳහා දරණ වියදම රුඃ 20,000.00 කි.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ව්‍යාපෘති

1. දීපව්‍යාප්ත ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණය කිරීම් සහ බිම් සැකසීම වැනි සංවර්ධන ව්‍යාපෘතීන් රාශියකට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දායකත්වය ලබා දෙන ලදී. එසේ දායකත්වය ලබා දුන් ව්‍යාපෘති කිහිපයක් පහත පරිදි වේ:



නීතිපති නිවාඩු බංගලාව - මන්නාරම.



නිවාස ව්‍යාපෘතිය - කීරමලේ.



බැසලිකා දේවස්ථානය - රාගම.



ක්‍රීඩා අමාත්‍යාංශ නිල නිවාසය.



අගමැති නිවාඩු බංගලාව - නුවරඑළිය.



පිළිමගෙය - රුවන්වැලි මහා සෑය.



වහාකන්ද වැව - ගෝමරංකඩවල.



රාජකීය විද්‍යාලය - පොළොන්නරුව.



දිව්ලන අල් අක්ෂා මුස්ලිම් විද්‍යාලය - පොළොන්නරුව.



භාවනා අසපුව - කදුබොඩ.



වකුගඩු ප්‍රතිකාර රෝහල - අනුරාධපුරය.



ජල පිරිපහදු ඒකකය - බෝගස්වැව.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආපදා කළමනාකරණ මෙහෙයුම්

1. **අරණායක හා එලගපිටිය නායයෑම්.** අරණායක නාය යෑමේදී, සොල්දාදුවන් 300 කට වඩා වැඩි පිරිසක් මුදවා ගැනීමේ මෙහෙයුම් සඳහා යොදවන ලද අතර එහිදී සිරවී සිටි පුද්ගලයන් 150 ක් පමණ මුදවා ගැනීමට හැකියාව ලැබිණි. තවද එලගපිටිය ප්‍රදේශයේ සම්සරා කන්ද නාය ගිය අවස්ථාවේදී ආරක්ෂක සේනා මුලස්ථානය (බටහිර) අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ මුදවාගැනීමේ මෙහෙයුම් දියත් කරන ලදී.






2. **පිළිමතලාව රන්මාලක ප්‍රදේශයෙහි නාය යාම.** 2016 මැයි 17 වන දින සිදු වු මෙම නාය යාමේදී පිරිමි පුද්ගලයන් 04 ක් සහ කාන්තාවන් 02 ක් මිය ගිය අතර නිවාස 02 කට හානි සිදු විය. එහි මුදවාගැනීමේ මෙහෙයුම් ආරක්ෂක සේනා මුලස්ථානය (මධ්‍යම) අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ 2 (සෙව්) සිංහ රෙජිමේන්තුව විසින් සිදු කරන ලදී.




3. **ජලගැලීම්**. කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයේ 20,000 කට අධික පිරිසක් අධික වර්ෂාව හේතුවෙන් ඇති වු ජල ගැලීම් නිසා පීඩාවට පත්වු අතර ඔවුන් මුදවා ගැනීමට සහ මානුෂීය ආධාර ලබාදිම සඳහා සක්‍රීය දායකත්වය ලබා දෙන ලදී.









3. **නියඟය**. ආරක්ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) භටපිරිස් විසින් පොළොන්නරුව ප්‍රදේශයේ නියඟයෙන් පීඩාවිඳි ජනතාව සඳහා පානීය ජල පහසුකම් ලබා දෙන ලදී. 2016 වර්ෂයේ අග භාගයේදී සැළකිය යුතු ප්‍රමාණයක් නියඟය නිසා පීඩාවිඳි අතර එය සංඛ්‍යාත්මක වශයෙන් පවුල් 18951 ක පුද්ගලයින් 70431 කි. එය වැලිකන්ද, දිඹුලාගල, ලංකාපුර, තමන්කඩුව, මැදිරිගිරිය සහ හිගුරක්ගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල උග්‍ර පානීය ජලය ලබාගැනීම පිළිබඳ ගැටළුවක් ඇති කිරීමට සමත් විය. ඒ අනුව පීඩාවට පත්වු ජනතාව වෙනුවෙන් ජල බවුසර් ලබාදීම සම්බන්ධීකරණය කරන ලද්දේ ආරක්ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) විසිනි.





## යුධ සේවා ලේකම් ශාඛාව

1. මේජර් ජෙනරාල් නිලය හොබවන ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්ගෙන් අයෙකු වන යුධ සේවා ලේකම් යටතේ යුධ සේවා ලේකම් ශාඛාව පාලනය වේ. යුද්ධ හමුදාවේ නිලධාරීන් සබැඳිව මානව සම්පත් කළමනාකරණ රාජකාරී මෙම ශාඛාව මගින් සිදුකරනු ලැබේ.

2. **2016 වර්ෂය තුළ කාර්ය සාධනය**. පහත සඳහන් නිල උසස් කිරීමේ මණ්ඩල මෙම ශාඛාව විසින් සම්පූර්ණ කර ඇත:

අ. මෙම වර්ෂයන් තුළදී මෙම ශාඛාව පහත පරිදි නිල උසස් කිරීමේ මණ්ඩල කටයුතු අවසන් කර ඇත:

| අ/අ | විස්තරය | නිල උසස් කිරීම සඳහා සලකා බලන ලද නිලධාරීන් සංඛ්‍යාව | | නිල උසස් වූ නිලධාරීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | නිත්‍ය | ස්වේච්ඡා | නිත්‍ය | ස්වේච්ඡා |
| 1. | 2/ලුතිනන් සිට ලුතිනන් (මණ්ඩල 5) | 254 | 52 | 156 | 37 |
| 2. | ලුතිනන් සිට තා/කපිතන් (මණ්ඩල 9) | 952 | 220 | 565 | 117 |
| 3. | කපිතන් සිට මේජර් (මණ්ඩල 1) | 304 | 18 | 134 | 11 |
| 4. | මේජර් සිට තා/ලුතිනන් කර්නල් (මණ්ඩල 1) | 63 | - | 49 | - |
| 5. | ලුතිනන් කර්නල් සිට තා/කර්නල් (මණ්ඩල 1) | 61 | - | 28 | - |
| 6. | කර්නල් සිට තා/බ්‍රිගේඩියර් (මණ්ඩල 4) | 130 | 13 | 46 | 02 |
| 7. | බ්‍රිගේඩියර් සිට තා/මේජර් ජෙනරාල් (මණ්ඩල 3) | 110 | - | 20 | - |

සංඛ්‍යා සටහන 8.1: නිලධාරී නිල උසස් කිරීමේ විස්තරය.

ආ. 2014, 2015 සහ 2016 යන වර්ෂයන් තුළදී විශ්‍රාමගත් නිලධාරී ප්‍රමාණය සංසන්දනාත්මකව ගත් කල පහත පරිදි වේ:

| අ/අ | විස්තරය | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|
| 1. | 2/ලුතිනන් | 13 | 16 | 14 |
| 2. | ලුතිනන් | 163 | 93 | 49 |
| 3. | කපිතන් | 49 | 84 | 106 |
| 4. | මේජර් | 94 | 112 | 107 |
| 5. | ලුතිනන් කර්නල් | 21 | 17 | 23 |
| 6. | කර්නල් | 5 | 13 | 13 |
| 7. | බ්‍රිගේඩියර් | 5 | 5 | 10 |
| 8. | මේජර් ජෙනරාල් | 8 | 6 | 25 |
| 9. | ලුතිනන් ජෙනරාල් | - | 2 | - |
| | **එකතුව** | **358** | **348** | **398** |

සංඛ්‍යා සටහන 8.2: 2014, 2015 සහ 2016 යන වර්ෂයන් තුළදී විශ්‍රාමගත් නිලධාරී සංඛ්‍යා සංසන්දනය.

ඇ. රෙජිමේන්තු මූලස්ථානවල සහ අනෙකුත් හමුදා ආයතනවල පාලන ගැටලු නිරාකරණය කිරීමේ සහ එම ගැටලු අවම කර ගැනීමට මූලස්ථානවලට අධීක්ෂණ උපදෙස් ලබාදීමේ පාලන පරීක්ෂණ 05 ක් සඳහා මෙම ශාඛාව සහභාගි වී ඇත.

ඈ. යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් පරිදි යුද සේවා ලේකම් කාර්යාලය විසින් යුද්ධ හමුදාවේ දියුණුව සඳහා බලපාන ගැටලු හඳුනාගැනීමට සහ ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීමට යුද්ධ හමුදා පරිපාලන මණ්ඩල 32 ක් පත්කරන ලදී.

ඉ. යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් පරිදි යුද සේවා ලේකම් කාර්යාලය විසින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රතිපත්ති සහ නිර්ණායකයන් පහත පරිදි වේ:

(1) නිවාඩු නොමැතිව නොපැමිණීම සම්බන්ධ ප්‍රතිපත්ති.

(2) විදෙස් පාඨමාලා සහ සංචාර සඳහා නිලධාරීන් තෝරා ගැනීමේ නිර්ණායක.

(3) නිත්‍ය / ස්වේච්ඡා බලඇණි අණදෙන නිලධාරීන් පත්කිරීම සඳහා වන යුද්ධ හමුදා ප්‍රතිපත්තිය.

(4) අතිරේක රෙජිමේන්තු රාජකාරී සඳහා අනියුක්ත කිරීමේ ප්‍රතිපත්තිය - නිලධාරී (සංශෝධිත).

(5) දඬුවම් ලබාදීමේ නිරවුල් නිර්ණායක (ලිපි 02 ක්).

(6) කමිටු ප්‍රතිපත්ති ලිපියෙහි කාර්මික විශ්ලේෂණය.

3. **නිල උත්සව සංවිධානය**. යුද සේවා ලේකම් ශාඛාව විසින් පහත සඳහන් නිල උත්සව සංවිධාන කටයුතු සම්බන්ධීකරණය සාර්ථකව පවත්වන ලදී:

අ. **මාණ්ඩලික සාකච්ඡා.** යුද සේවා ලේකම් ශාඛාව විසින් සම්බන්ධීකරණය කරන ලද සාකච්ඡා සහ සම්මන්ත්‍රණ පහත පරිදි වේ.

(1) පස්වන යුද්ධ හමුදා මාණ්ඩලික සාකච්ඡා 2016 ජනවාරි 20 සිට 22 දක්වා ඉන්දියාවේදී පවත්වන ලදී.

(2) ශ්‍රී ලංකා ඉන්දියා සන්නද්ධ හමුදා අතර උපාය මාර්ගික සාකච්ඡා දෙවන වරටත් 2016 ජූලි 13 සිට 15 වනදා දක්වා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය තුළදී පවත්වන ලදී.

(3) හයවන වරටත් "මෘදු බලය සහ ගෝලීය ගැටලු සඳහා එහි බලපෑම" යන තේමාව යටතේ කොළඹදී පවත්වනු ලැබූ ආරක්ෂක සමුළුවෙහි සමස්ත සම්බන්ධීකරණ කටයුතු මෙහෙයවන ලදී.

4. **අනාගත දැක්ම**. යුධ සේවා ලේකම් ශාඛාවේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ අරමුණින් පහත සඳහන් අංශ ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ.

අ. **යුධ සේවා ලේකම් ශාඛාව ප්‍රතිව්‍යුහගත කිරීම සහ ව්‍යාප්ත කිරීම**. අනාගත අවශ්‍යතා වලට අනුචිත වන පරිදි යුද සේවා ලේකම් ශාඛා සංස්ථාව ප්‍රතිව්‍යුහ ගතකිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී.

ආ. **යුධ සේවා ලේකම් ශාඛාවේ සියලුම ලේඛණ ස්වයංක්‍රීයකරණය කිරීම**. පුද්ගල බලපෑම් සහ මැදිහත්වීම් අවම කර කාර්යක්ෂමතාවය සහ නිර්වද්‍යතාවය වැඩි කිරීමේ අරමුණින් යුද සේවා ලේකම් ශාඛාවෙහි දත්ත සහ ලේඛණ පරිගණකගත කිරීමට තීරණය කර ඇත.

**ප්‍රධාන මාණ්ඩලික ශාඛාව**

1. යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන ශාඛාවක් ලෙස ප්‍රධාන මාණ්ඩලික ශාඛාව හැඳින්විය හැකි අතර එහි මූලික වගකීම වනුයේ යුද්ධ හමුදාවේ මෙහෙයුම් පුහුණු සැලසුම් සහ යුද්ධ හමුදා බුද්ධි අංශ සම්බන්ධ කරුණු පිළිබඳ සමස්ත සම්බන්ධීකරණය සහ අධීක්ෂණයයි. අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මෙම ශාඛාවේ මූලසුන හොබවන අතර ඔහු මේජර් ජෙනරාල් නිලය හොබවන යුද්ධ හමුදා මාණ්ඩලික නිලධාරීන් 06 දෙනා අතුරින් එක් අයෙකු වේ. තවද ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ අධ්‍යක්ෂ මණ්ඩල 08 ක් සහ බලසේනා මූලස්ථාන 04 ක් ක්‍රියාත්මක වේ.




රූප සටහන 9.1: ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ පවතින සංස්ථා.

2. **2016 වර්ෂය තුළදී සපුරාගත් ඉලක්ක.** මෙම වර්ෂය තුළ විවිධ අංශ වෙතින් බලාපොරොත්තු වූ ඉලක්කයන් විශාල ප්‍රමාණයක් සාර්ථකව සපුරා ගැනීමට හැකි විය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් 02 ක් සඳහා හටපිරිස් අනියුක්ත කිරීමට සමත් විය (නිලධාරී - 26, සෙසුනිල - 190). ශ්‍රී ලංකා භූමියෙහි ප්‍රධාන ආරක්ෂකයා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හටපිරිස් හදිසි ආපදා තත්වයන්හිදී ක්‍රියාකිරීම සඳහා, අත්‍යාවශ්‍ය රාජකාරී සඳහා රජයට සහය දැක්වීමට, නීතිය හා සාමය ආරක්ෂා කිරීමට මෙන්ම නීති විරෝධී කටයුතු වල නියැලී සිටින්නන් අත්අඩංගුවට ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලිසියට සහය වීම ආදී කටයුතු වල යෙදීම, සන්නිවේදන කටයුතු පිළිබඳ සලකා බැලීමේදී නව සන්නිවේදන පහසුකම් සමග සන්නිවේදන යටිතල පහසුකම් බලගන්වා ඇති අතර යුද්ධ හමුදා දත්ත පද්ධතිය සහ ජංගම සන්නිවේදන ජාලය වඩාත් පුළුල් කොට ඇත. තවද මෙම වර්ෂය තුළදී මනෝ විද්‍යාත්මක මෙහෙයුම් අංශයේ හිද සැලකිය යුතු දියුණුවක් දැකිය හැකි විය. සොල්දාදුවන්ගේ සුභසාධනය සඳහා දීපව්‍යාප්තව මත්ද්‍රව්‍ය පිටුදැකීමේ වැඩමුළු ඇතුළු මනෝ විද්‍යාතමක වැඩ සටහන් රාශියක් මෙහෙයවන ලදී. එමෙන්ම කාන්තා ප්‍රහු ආරක්ෂක කණ්ඩය (4 වන කමාන්ඩෝ රෙජිමේන්තුව යටතේ), සුප සහයක බලඇණිය, යුද්ධ හමුදා වෘත්තීය පුහුණු මූලස්ථානය, 15 වන නියමුවන් රහිත ගුවන් යානා ඒකකය (කාලතුවක්කු රෙජිමේන්තුව යටතේ), යුධෝපකරණ කර්මාන්ත ශාලාව, යුධෝපකරණ පුහුණු පාසල, ආධුණික පුහුණු පාසල, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංස්ථාව නව්‍යකරණය කරමින් අභිනවයෙන් ස්ථාපිත කරන ලදී.

<u>ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලය</u>

3. ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා ක්‍රියාන්විත, (යුද්ධ හමුදා උපාය මාර්ග) ක්‍රියාන්විත සංකල්ප, සැලසුම්, ක්‍රියාන්විත නියෝග සහ උපදෙස් සම්බන්ධ මාණ්ඩලික කටයුතු සඳහා වගකිව යුතු වේ.

4. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය</u>**. මෙම වර්ෂය තුළදී ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය පහත පරිදි වේ:

අ. ආරක්ෂක සේනා මුලස්ථාන යාපනය, වන්නි, නැගෙනහිර, කිළිනොච්චි සහ මධ්‍යම යටතේ ඇති සේනාංක හා ඒකක අණ හා පාලනය යටතේ මුර සංචාර සිදුකිරීම මඟින් භූමිය සාර්ථකව තහවුරු කර ගැනීමට සමත් වී ඇති අතර පීරා සෙවීමේ මෙහෙයුම් මඟින් සැඟවූ හා අත්හැර දමන ලද යුධමය උපකරණ, අවි සහ පතොරම් සොයා ගැනීමට හැකියාව ලැබිණ.

ආ. තවද නැවත පදිංචි කිරීම හා ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘති සඳහා රාජ්‍ය යාන්ත්‍රනය මගින් දියත් කරන ලද දීප ව්‍යාප්ත වැඩ සටහන් කඩිනම් කිරීම සඳහා සක්‍රීය දායකත්වය ලබාදුනි. එසේම පශ්චාත් ආපදා කළමනාකරණ අවස්ථාවන් සඳහා සාලාව ප්‍රදේශය වෙත හටපිරිස් යොදවන ලදී. නවීන උපකරණ වලින් සමන්විත සෙවීමේ සහ මුදවා ගැනීමේ කණ්ඩායම් 55 ක් දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි, ආපදා අවස්ථාවන් වලදී ක්ෂණිකව ක්‍රියාකිරීමට හා කළමණාකරණය කරගැනීම සඳහා ස්ථානගත කරන ලදී.

5. **<u>එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා හටපිරිස් අනියුක්ත කිරීම</u>**. එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා පහත සඳහන් පරිදි සාම සාධක හටපිරිස් යොදවන ලදී:

අ. නිලධාරීන් 10 ක් සහ සෙසුනිල 140 ක් (10 වැනි බළකා ආරක්ෂක කණ්ඩායම) - එක්සත් ජාතීන්ගේ ලෙබනන්හි සාමසාධක මෙහෙයුම සඳහා 2016.02.16 වන දින සිට වසරක කාලයක් සඳහා අනියුක්ත කරන ලදී.

ආ. නිලධාරීන් 16 ක් සහ සෙසුනිල 50 ක් (04 වැනි දෙවන මට්ටමේ යුද්ධ හමුදා රෝහල) - එක්සත් ජාතීන්ගේ දකුණු සූඩාන් සාමසාධක මෙහෙයුම සඳහා 2016.06.07 වන දින සිට වසරක කාලයක් සඳහා හටපිරිස් යොදවන ලදී.

6. **<u>ශාක්‍යතා සංවර්ධන ක්‍රියාකාරකම්.</u>** සෙවීමේ සහ මුදවා ගැනීමේ කණ්ඩායම්හි සාක්‍යතාවය සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩ සටහන් සඳහා රුපියල් මිලියන 04 ක මුදලක් වෙන් කරන ලද අතර එම සෙවීමේ සහ මුදවා ගැනීමේ කණ්ඩායම් නවතම තාක්‍ෂණික මෙවලම් ලබාදී නව්‍යකරණය කිරීම සඳහා තවත් රුපියල් මිලියන 36 ක් මුදලක් වෙන්කරන ලදී.

<u>පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය</u>

7. යුද්ධ හමුදාධිපති තුමාගේ මග පෙන්වීම යටතේ සියලුම යුද්ධ හමුදා පුහුණු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහ සියලුම ආකාරයේ යුද්ධ හමුදා සහ යුද්ධ හමුදා නොවන පුහුණු කටයුතු සම්බන්ධීකරණය කිරීම පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීම වේ. ඒ අනුව 2016 වර්ෂයේ යුද්ධ හමුදාවේ සියලුම පුහුණු ආයතන පුහුණු සැලැස්මෙහි අරමුණු සාක්ශාත් කරගැනීම සඳහා කැපවන ලදී. නුදුරේදී විශ්‍රාම ගැනීමට නියමිත සියලුම යුද්ධ හමුදා සාමාජිකයින් සහ තෝරාගත් මේජර් ලේඛණයට ඇතුලත් නොවූ නිලධාරීන් මූලික කොට ගෙන හමුදා නොවන පුහුණු පාඨමාලා පවත්වන ලදී. මෙම සියලුම පුහුණු කටයුතු අනුමත මුදල් ප්‍රතිපාදන මත සිදුකර ගන්නා ලදී. එසේම සියලුම ආරක්ෂක සේනා මුලස්ථාන, සේනාංක හා අනෙකුත් ඒකක මෙම පුහුණු කටයුතු සාර්ථක කරගැනීම සඳහා හමුදා සෙබළුන් පුහුණු කටයුතු වෙනුවෙන් මුදවාලීම හා අනෙකුත් හැකි සෑම ආකාරයකින්ම සහයෝගය සහ දායකත්වය ඉතා ඉහලින්ම ලබා දෙන ලදී.

8. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය</u>**. ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය හා ආරක්ෂක සේනා මුලස්ථාන සම්බන්ධතාවයෙන් හටපිරිස්හි දෙමළ භාෂාව පිළිබඳ අවබෝධය දියුණු කිරීම සඳහා දෙමළ භාෂා පාඨමාලා (දින 12 වැඩසටහන්) පවත්වන ලදී. විදේශීය හමුදා හටපිරිස්වල ඉහල සහභාගීත්වයක් ඇතිව 2016 වසර තුළදී දියකාවා ප්‍රහාරය හා මිත්‍ර ශක්ති අභ්‍යාසය පැවැත්විය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, විදේශීය මිත්‍ර රටවල් වල හමුදා සාමාජිකයන් සඳහා හටකාර්ය සම්පාදන මාණ්ඩලික පාඨමාලාව සහ ඒකාබද්ධ මාණ්ඩලික අණ පාඨමාලාව සඳහා සහභාගීවීමට අවස්ථාව උදා කර ඇත.

ජාතික වෘත්තීය පුහුණු අධිකාරිය වෙතින් වසර 22 ක සේවාකාලය අවසානයේ විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරී සහ සෙසුනිලයින් සඳහා වැඩි වෘත්තිය පුහුණු අවස්ථා ලබාගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලදී. තවද යුද්ධ හමුදා පුහුණු පාසල් 05 ක් සඳහා රුපියල් මිලියන 75 ක්ද ආධුණික පුහුණු පාසල් 05 සඳහා රුපියල් මිලියන 97 ක්ද යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා වැය කර ඇත. තවද නිලධාරීන් සඳහා පිළිගත් විශ්ව විද්‍යාල වෙතින් උපාධි ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා හැදෑරීම සඳහා වැඩි අවස්ථාවන් ප්‍රමාණයක් ලබා දී ඇති අතරම පිළිගත් ආයතන වෙතින් ඉංග්‍රීසි, දමිළ හා ප්‍රංශ භාෂා හැදෑරීම සඳහා දිරිමත් කර ඇත. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හඳුන්වා දෙන ලද විශේෂ නිර්ණායක යටතේ යුද්ධ හමුදා සාමාජිකයන්ට විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබාගැනීමට අවශ්‍ය උපරිම අවස්ථාවන් ප්‍රමාණයක් විවෘත කරන ලදී.

9. **<u>බඳවාගැනීම් සහ දේශීය පුහුණුව</u>.** 2016 වර්ෂය තුලදී ශ්‍රී ලංකා යුද්ධ විද්‍යා පීඨයෙහි කෙඩෙට් නිලධාරී 214 ක් අධිකාරියට පත් වු අතර 552 ක් අලුතෙන් බඳවා ගන්නා ලදී. යුද්ධ හමුදාවේ ලිපිකරු රියදුරු ආදී වෘත්තීය පුරප්පාඩු පියවා ගැනීම සඳහා ආධුනික සෙබළුන් 8190 දෙනෙකු බඳවාගත් අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය සඳහා 2016 වර්ෂය වෙනුවෙන් බඳවාගත් ආධුනික කාන්තා සෙබලියන් ගණන 256 කි.

10. යුද්ධ හමුදා පුහුණු පාසල් සහ රෙජිමේන්තු පුහුණු පාසල් මගින් මෙහෙයවන ලද පාඨමාලා සඳහා සහභාගීත්වය සාරාංශයක් ලෙස පහත පරිදි වේ:

| අ/අ | ආයතනය | ඇබෑර්තු ප්‍රමාණය | සහභාගී වු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | යුද්ධ හමුදා පුහුණු පාසැල් | 6,163 | 3,835 |
| 2. | රෙජිමේන්තු පුහුණු පාසැල් | 3,170 | 2,792 |
| | **එකතුව** | **9,332** | **6,627** |

සංඛ්‍යා සටහන 9.1: බඳවාගැනීම් සහ දේශීය පුහුණුව.

11. **<u>ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාස</u>.** 2016 වර්ෂයේදී මෙහෙයවන ලද ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාස පහත පරිදි වේ.

| අ/අ | විස්තරය | ස්ථානය | කාලසීමාව | සහභාගී වු මුලු සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | | | නිලධාරී | සෙසුනිල |
| 1. | දියකාවා ප්‍රහාරක පුහුණු අභ්‍යාසය | කෝකිලායි - පානම | 2016.09.23 - 2016.09.25 | 5,441 | 58 |
| 2. | මිත්‍ර ශක්ති යුධ අභ්‍යාසය | රෙම ශ්‍රීලංසිරෙ | 2016.10.24 - 2016.11.06 | 90 | 45 |
| | **එකතුව** | | | **5,531** | **103** |

සංඛ්‍යා සටහන 9.2: ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාස.

12. **<u>හමුදාමය නොවන පුහුණු කටයුතු</u>.** 2016 වර්ෂයේදී නිලධාරීන් 383 දෙනෙකුට සහ සෙසුනිලයන් 2742 දෙනෙකු සඳහා විශ්ව විද්‍යාල වල සහ විවිධ සිවිල් ආයතන මගින් මෙහෙයවනු ලබන හමුදාමය නොවන පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථාව උදා කර දෙන ලදී. තවත් නිලධාරීන් 352 ක් සහ සෙසු නිල 517 ක් පිලිගත් පුහුණු ආයතන මගින් මෙහෙයවන ලද විවිධ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සමුළු සඳහා සහභාගී කරවන ලදී. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා බාහිර පුහුණු පාඨමාලා වැඩසටහන් සංවිධානය කිරීමද සිදු කරන ලදී.

13. **<u>විදේශීය පුහුණු පාඨමාලා</u>.** නිලධාරීන් සහ සෙසු නිලයන් වෙනුවෙන් විදේශීය පාඨමාලා, සංචාර සම්මන්ත්‍රණ, සමුළු සහ අභ්‍යාස සඳහා අවස්ථාවන් ලබා දුන් අතර එහි සාරාංශ ගත විස්තරය පහත සඳහන් පරිදි වේ:

| අ/අ | විස්තරය | නිලධාරි | සෙසුනිළ |
|---|---|---|---|
| 1. | විදේශීය සංචාර / සම්මන්ත්‍රණ / සමුළු සහ අභ්‍යාස | 140 | 78 |
| 2. | විදේශීය පාඨමාලා | 693 | 388 |
| 3. | එක්සත් ජාතීන්ගේ පාඨමාලා/ සම්මන්ත්‍රණ / සමුළු | 26 | - |
| | **එකතුව** | **589** | **466** |

සංඛ්‍යා සටහන 9.3: විදේශීය පුහුණු පාඨමාලා.

14. මෙම වර්ෂය තුළදී මෙම අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් විදේශ නියෝජිත කණ්ඩායම් 04 ගේ සංචාර සඳහා පහසුකම් සපයන ලදී. නිලධාරීන් 13 ක් සහ සෙසු නිලයන් 34 ක් පකිස්ථානයේදී මෙහෙයවන ලද ඊගල් ඩෑෂ් ත්‍රෛයි පාර්ශවික අභ්‍යාසය - 1 (2016) සඳහා සහභාගී කරවන ලදී.

අ. 2016 වර්ෂයේදී විදේශීය තරඟ සඳහා නිලධාරීන් සහ සෙසු නිලයන්ගේ සහභාගීත්වය පහත පරිදි වේ:

| අ/අ | විස්තරය | රට | කාලසීමාව | | සහභාගී වූ සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | නිලධාරී | සෙසුනිල |
| 1. | පකිස්ථාන යුද්ධ හමුදාවේ ශාරීරික තරගාවලිය හා සන්නද්ධ සටන් කාර්යක්‍ෂමතා (PACES) තරඟය | පකිස්ථානය | 2016.10.18 | 2016.10.26 | 04 | 23 |
| 2. | බ්‍රසීල 2 වන ජාත්‍යාන්තර මුර සංචාරක තරගාවලිය | බ්‍රසීලය | 2016.08.15 | 2016.08.26 | 03 | 08 |
| 3. | පැරෂුට් පැනීම උපකරණ සහිතව | පකිස්ථානය | 2016.05.30 | 2016.06.11 | 04 | 28 |
| 4. | පකිස්ථාන යුද්ධ හමුදා කණ්ඩායම් තරගාවලිය (PATS) | පකිස්ථානය | 2016.03.31 | 2016.04.08 | 04 | 07 |

සංඛ්‍යා සටහන 9.4: විදේශීය තරඟ.

15. **<u>ශාක්‍යතා වර්ධන ක්‍රියාකාරකම්</u>.** යුද්ධ හමුදා මාණ්ඩලික සාකච්ඡා ඉන්දියානු සහ පකිස්ථාන යුද්ධ හමුදා වල සහභාගීත්වයෙන් මෙහෙයවන ලද අතර එහිදී අත්දැකීම් හුවමාරු කරගැනීමේ වැදගත්කම වැඩි වශයෙන් ඉස්මතු කර දෙන ලදී. ඉගැන්වීමේ ක්‍රමවේදයන්ට අදාල තාක්‍ෂණික උපකරණයන් සහ විදේශීය පාඨමාලා සහ අභ්‍යාස සඳහා වැඩි අවස්ථාවන් ප්‍රමාණයක් ලබා ගැනීම පිලිබඳ මෙහිදි වැඩි දුරටත් අවධානය යොමු කරන ලදී.

16. **<u>ගැටලු සහ අභියෝග</u>.** පුහුණු වැය ශීර්ෂය යටතේ වෙන්කරන ලද මූල්‍ය අරමුදල් වල සීමිත බව නිසා උසස් අධ්‍යාපනය සඳහා මූල්‍යමය වශයෙන් සහන සැලසීමට හැකිවුයේ සීමිත නිලධාරීන් ප්‍රමාණයකට පමණි. වර්තමානයේදී මිලිමීටර් 81 ප්‍රමාණයේ මෝටාර් සහ අධිබලැති අවි පුහුණුවීම් කටයුතු සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් කල්පිටිය වෙඩි පිටියේදී වන අතර යුද්ධ හමුදාව සතුව කාලතුවක්කු සහ ආධාරක අවි සහ අත්හදා බැලීම සඳහා වෙඩි පිටියක් නොමැතිවීම ගැටලුවක්ව පවතී.

<u>**සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය**</u>

17. සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදාවේ නිසි ක්‍රියාකාරීත්වය උදෙසා සන්නද්ධ හැකියාව ඒකාකාරීව පවත්වා ගෙන යාමේ අරමුණින් අවි, පතොරම්, සන්නද්ධ උපකරණ, විශේෂඥ උපකරණ සැපයීම උදෙසා ස්ථාපිත කර ඇත.

18. 2016 වර්ෂය තුළදී සන්නද්ධ උපදේශන කමිටු - 2017, කමාන්ඩෝ සහ විශේෂ බලකා බලසේනා නව්‍යකරණය කිරීම, තුන් අවුරුදු සහ පස් අවුරුදු පතොරම් සැලැස්ම, මාලි දේශයෙහි එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් වල හටපිරිස් අනියුක්ත කිරීම ආදී කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දුන් අතරම යුද්ධ හමුදාවේ අත්‍යාවශ්‍ය උපකරණ ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදී.

19. <u>**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය**</u>. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වැලිසර නාවික හමුදා පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙතින් සිදුකරනු ලබන මිලියන 05 ක වටිනාකමින් යුත් සුළු අවි ක්‍රියාකාරීත්වය පිළිබඳ පුහුණුව ලබා දෙනු ලබන පද්ධතීන් 04 ක සංවර්ධන කටයුතු ක්‍රියාවලිය වැඩිදියුණු කරන ලදී. මාලි දේශයෙහි සාම සාධක රාජකාරී සඳහා අනියුක්ත හටපිරිස් සඳහා අවශ්‍ය සන්නද්ධ වාහන ප්‍රතිසංස්කරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා මුලපුරන ලදී. ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව කමාන්ඩෝ සහ විශේෂ බලකා බලසේනා නව්‍යකරණය ආරම්භ කරමින් එහි පලමු වන අධියර පටන් ගන්නා ලදී. තවද ඉන්දියානු ණය පදනම යටතේ පතොරම් නැවත පිරවීමේ ස්ථානයක් ඉංජිනේරු බලසේනාව සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සහ පතොරම් නිෂ්පාදන ස්ථානය සහ කාලතුවක්කු ඇදගෙන යන වාහන ලබාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. බිම් බෝම්බ සහ පුපුරණ ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා මුගටියන් සහ සුනඛයින් පුහුණු කිරීම සඳහා මුලපුරන ලදී.

20. <u>**ගැටලු සහ අභියෝග**</u>. තාක්ෂණික ඇගයීම් කමිටු සම්පූර්ණ කිරීමේදී හා භාවිතා කරන්නන්ගේ සහ අදාල අධ්‍යක්ෂ මණ්ඩල වෙතින් නිර්දේශ ලබාගැනීමේදී හටගත් යම් යම් බාධා හේතුවෙන් සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි ප්‍රමාදවීමක් ඇති විය. ප්‍රසම්පාදන උපකරණ, සාම්පල විදේශ රටවල් වලින් ලබා ගැනීමේදී හා ඒවායේ ක්‍රියාකාරීත්වය මැන බැලීමට හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් ඒවායෙහි උචිත බව මැනබැලීම සඳහා අතිරේක කාලයක් ගත වීම.

<u>**මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය**</u>

21. මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය ආරක්ෂක සේනා මුලස්ථාන හා සේනාංක මුලස්ථාන යටතේ ස්ථාපිත කර ඇති මනෝවිද්‍යා මෙහෙයුම් අංශ සමඟ එක්ව කාලානුරූපීව තෝරාගත් පිරිසක් සඳහා මනෝ විද්‍යාත්මක මෙහෙයුම් සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීම සහ දෘෂ්‍ය හා මුද්‍රිත මාධ්‍ය මගින් දැනුවත් කිරීම සිදු කරනු ලබයි.

22. <u>**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය**</u>. මෙම වර්ෂය තුලද මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය පහත පරිදි වේ:

අ. මෙම වර්ෂය තුළදී පිටු 32 කින් යුත් රණවිරුවා සඟරාව පිටපත් 1000 බැගින් සෑම මසකම ප්‍රකාශයට පත් කොට යුද්ධ හමුදා සාමාජිකයන් අතර හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පුද්ගලයන් අතර බෙදාහරින ලදී.

ආ. මෙම වර්ෂය තුළදී මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩ සටහන්, පුහුණු වැඩ සටහන් රාශියක් දියත් කිරීම තුලින් නීති ගැටලු පිළිබඳ, කාන්තා අයිතිවාසිකම් පිළිබඳ දැනුම වර්ධනය කිරීමට හා සොල්දාදුවන්ගේ ජීවන තත්වය හා ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම සඳහා භාවනා වැඩසටහන් මෙහෙයවීමද සිදුකරන ලදී.

| අ/අ | වැඩ සටහන | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 1. | භාවනා වැඩසටහන් | සේවයේ යෙදී සිටින සාමාජිකයන් 599 |
| 2. | දැනුවත් කිරීම් / පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් | සේවයේ යෙදී සිටින සාමාජිකයන් 8,456 |
| 3. | නීති ගැටළු, කාන්තා අයිතිවාසිකම් පිළිබඳ කාන්තා සෙබලියන්ගේ දැනුම වර්ධනය කිරීම හා ඔවුන්ගේ ජීවන තත්ත්වය හා ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම | සේවයේ යෙදී සිටින කාන්තා සාමාජිකයන් 1,164 |
| 4. | නීති විරෝධී කටයුතු වලින් වැළකී සිටීමේ වැඩසටහන් | සේවයේ යෙදී සිටින කාන්තා සාමාජිකයන් 8,332 |
| 5. | 'ජීවත් වීමේ කලාව' වැඩසටහන් | සේවයේ යෙදී සිටින සාමාජිකයන් 210 |

සංඛ්‍යා සටහන 9.5: දැනුවත් කිරීම, පුහුණු හා භවනා වැඩසටහන්.

23. **<u>අනාගත සැලසුම්</u>**. දැනට ආරක්ෂක සේනා මූලස්ථාන 04 ක මනෝවිද්‍යා මෙහෙයුම් අංශ 04 ක් ක්‍රියාත්මක වන අතර අනෙකුත් ආරක්ෂක සේනා මූලස්ථාන හා සියලුම සේනාංක මූලස්ථාන තුළ එවැනි මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අංශයක් ස්ථාපිත කිරීම සුදුසු බව නිර්දේශ කල හැක. තවද නිලධාරීන් පුහුණු කිරීම තුළින් වඩා ඵලදායී මනෝවිද්‍යා මෙහෙයුම් සිදුකිරීම සඳහා විදේශ පුහුණු පාඨමාලා සහ සම්මන්ත්‍රණ වලට සහභාගී කරවීමට අවශ්‍ය කටයුතු යෙදිය යුතු බව නිර්දේශ කල හැක.

**<u>මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

24. මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලයේ මුලසුන හොබවනු ලබන්නේ අධ්‍යක්ෂ මාණ්ඩලික රාජකාරී විසින් වන අතර ඔහු බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විය යුතුය. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වනුයේ යුද්ධ හමුදා සංයුතිය අධීක්ෂණය කර නිසි පරිදි පවත්වාගෙන යාම හා නිලධාරී සහ සෙසුනිල බඳවාගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමයි. තවද එය යුද්ධ හමුදාවේ සියලුම සංස්ථා සංශෝධනය සහ සිවිල් සේවකයින් වෙන්කිරීම පිළිබඳ වගකියනු ලබයි.

25. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය වෙනුවෙන් යුද්ධ හමුදා සංස්ථා නඩත්තු කිරීම ඇතුලු සියලුම මාණ්ඩලික රාජකාරී ඉටුකිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරයයි.

26. **<u>වාර්ෂික කාර්ය සාධනය</u>**. 2016 වර්ෂයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරී සහ සෙසුනිල සංයුතිය පහත පරිදි වේ (2016 දෙසැම්බර් මස වැටුප් ගෙවීමේ නාම ලේඛණයට අනුව).

| | නිලධාරී | | සෙසුනිල | |
|---|---|---|---|---|
| | අනුමත | දැනට සිටින | අනුමත | දැනට සිටින |
| නිත්‍ය බලසේනාව | 7,743 | 7,175 | 119,570 | 106,332 |
| ස්වේච්ඡා බලසේනාව | 2,899 | 2,559 | 70,149 | 61,072 |
| **එකතුව** | **10,642** | **9,734** | **189,719** | **167,404** |

සංඛ්‍යා සටහන 9.6: නිලධාරී සහ සෙසුනිල සංයුතිය.

27. **<u>සපුරාගත් ඉලක්කයන්</u>**. 2014 සිට 2016 වර්ෂය දක්වා අනුමැතිය ලබාගැනීම සහ බඳවාගැනීම පහත පරිදි වේ:

| | | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත | බඳවාගත් | අනුමත | බඳවාගත් | අනුමත | බඳවාගත් |
| නිලධාරී | නිත්‍ය | 492 | 356 | 360 | 243 | 558 | 318 |
| | ස්වේච්ඡා | 201 | 110 | 111 | 33 | 25 | 16 |
| සෙසුනිල | නිත්‍ය | 9,814 | 8,130 | 6,173 | 5,999 | 14,320 | 1,098 |
| | ස්වේච්ඡා | 10,517 | 7,399 | 3,891 | 3,825 | 3,134 | 459 |

සංඛ්‍යා සටහන 9.7: අනුමත සහ බඳවාගත් සංඛ්‍යාව.

28. බඳවා ගැනීමේ ප්‍රගතිය.







ප්‍රස්තාරය 9.1: බඳවා ගැනීමේ ප්‍රගතිය.

29. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සිවිල් සේවක සංයුතිය පහත සඳහන් පරිදි වේ. දෛනික රාජකාරි කටයුතු සිදුකරගෙන යාම සඳහා සිවිල් සේවකයින් එම අවශ්‍යතා ඇති ස්ථාන සඳහා යා කර ඇත.

| අ/අ | වෘත්තීය | ස්ථිර | කොන්ත්‍රාත් පදනම මත | එකතුව |
|---|---|---|---|---|
| 1. | අරක්කැමි | 2,132 | 1,227 | **3,359** |
| 2. | හෝ/සේවක | 1,204 | 1,233 | **2,437** |
| 3. | III කම්කරු | 1,397 | 1,094 | **2,491** |
| 4. | සනි/කම්කරු | 812 | 783 | **1,595** |
| 5. | වෙනත් | 1,056 | 200 | **1,256** |
| | එකතුව | **6,601** | **4,537** | **11,138** |

සංඛ්‍යා සටහන 9.8: සිවිල් සේවක සංඛ්‍යා සංයුතිය.

30. **ගැටලු සහ අභියෝග.** යුද්ධ හමුදාවට බැඳීම පිළිබඳ සෙසුනිල වෘත්තිකයන්ගේ ඇති උනන්දුව අවම වීම නිසා රෙජිමේන්තු විසින් අවම අධ්‍යාපන සුදුසුකම් මත සෙසුනිල වෘත්තිකයන් බඳවා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලනු ලබන අතරම ඒ ඒ නිලයන්ට අනුකූල සුදුසු අධ්‍යාපන සුදුසුකම් ප්‍රකාශයට පත්කිරීම සිදුකරනු නොලබයි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන් සඳහා පුරප්පාඩු පැවතියද ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨය සතුව ප්‍රමාණවත් නිලධාරී පිරිසක් පුහුණු කිරීමට අවශ්‍ය පහසුකම් නොමැත. තවද අනුමත සංඛ්‍යාවට වඩා බඳවා ගනු ලබන සංඛ්‍යාව නිරන්තරයෙන් අඩුවීම සඳහා පහත සඳහන් කරුණුද බලපාන බව නිරීක්ෂණය වී ඇත:

- අ. බඳවා ගැනීම් ක්‍රියාවලියෙහි ප්‍රමාදය.
- ආ. ප්‍රචාරක කටයුතු වල ඇති සීමා සහිත බව.
- ඇ. බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය වර්ධනය කිරීමේ අරමුණින් නිවැරදි යාන්ත්‍රණයක් හඳුන්වා දීම.
- ඈ. වර්තමාන සමාජයේ විවිධ රැකියා සඳහා අවස්ථාවන් වැඩි වීම හා ප්‍රමාණවත් මාර්ගෝපදේශණයක් නොමැති වීම හේතුවෙන් යුද්ධ හමුදාවට බැඳීමේ හිඟයක් පවතින බව නිරීක්ෂණය කර හැක.

## ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

31. ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයුම් සහ පරිපාලන අංශය, වෙබ් අඩවි අංශය, විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය අංශය, තාක්ෂණික අංශය හා ප්‍රචාරණය කිරීමේ අංශය යන අංශ වලින් සමන්විත වේ. තවද ආරක්ෂක සේනා මුලස්ථානය යාපනය, වන්නි හා කිලිනොච්චි යන ස්ථානවලද ජනමාධ්‍ය අංශ 03 ක් ක්‍රියාත්මක වේ. ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රතිරූපය වඩා හොඳින් පවත්වා ගෙන යාම සඳහා අධිකාරිලත් ආයතනය වන අතර යුද්ධ හමුදාවේ වැදගත් උත්සව අවස්ථා හා විශේෂ තොරතුරු මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා අනිකුත් මාධ්‍ය වෙත මුදාහරිනු ලබයි. තවද යුද්ධ හමුදා වෙබ් අඩවිය මෙහෙයවනු ලබන්නේ මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.

32. **සපුරාගත් ඉලක්කයන්.** 2016 වර්ෂයේදී විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය අංශය මගින් ආවරණය කරන ලද යුද්ධ හමුදා සහ නිල උත්සව අවස්ථා ගණන 108 කි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුලු කාලය පුරාවටම යුද්ධ හමුදා උත්සව වලට අවශ්‍ය ඡායාරූප සහ වීඩියෝ කැමරා ආවරණය, ආවේක්ෂණ ශබ්ද හා දෘශ්‍ය සේවා ලබා දෙන ලදී. වර්තමානයේ සිටින නිවේදකයන් දෙදෙනා මගින් යුද්ධ හමුදා උත්සව අවස්ථා වලට අවශ්‍ය නිවේදකයන් සැපයීමද සිදුකරන ලදී (සිංහල හා දමිළ). මාධ්‍ය උපදේශක (සිවිල්) හරහා අවස්ථාවන් ගණනකදී අවශ්‍ය මාධ්‍ය කටයුතු සම්බන්ධ දේශන සහය හා උපදෙස් ලබා දෙන ලදී. වීඩියෝ හා ඡායාරූපකරණ පාඨමාලාවක් මහරගම ජාතික තරුණ සේවා සභාවේ සහය ඇතිව 2016.03.09 - 2016.04.25 දක්වා මෙහෙයවන ලද අතර ඒ තුළින් යුද්ධ හමුදා සාමාජිකයන් 33 ක් පුහුණු කරන ලදී. 2016 වර්ෂයේදී තාක්ෂණික අංශය මගින් උත්සව අවස්ථාවන් 370 ක් සඳහා නිශ්චල ඡායාරූපකරණ ශිල්පී සහය ලබාදී ඇත.

## තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය

33. ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුලස්ථානයේ සිට ආරක්ෂක සේනා මුලස්ථාන හා ස්වාධීන යුද්ධ හමුදා ස්ථාන වල ඇති තොරතුරු තාක්ෂණ පද්ධතීන් වැඩි දියුණු කිරීම, ස්ථාපනය කිරීම, නඩත්තු කිරීම, නව්‍යකරණය කිරීම හා යාවත්කාලීන කිරීම සම්බන්ධව තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

34. **ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය.** මෙම වර්ෂය තුළදී ආරක්ෂක අමාත්‍යාංශය තොරතුරු පද්ධතිය ඇතුලුව මෘදුකාංග ව්‍යාපෘති 24 ක් සාර්ථකව සම්පූර්ණ කල අතර ඒ ඒ යුද්ධ හමුදා ස්ථාන මගින් වඩා වැඩි දැනුමක් ලබාගැනීම සඳහා පුහුණුවාර කිහිපයක්ද මෙහෙයවන ලදී. විශේෂ උත්සව අවස්ථාවන් කිහිපයක් හා සමගාමීව විවිධ යුද්ධ හමුදා ආයතන සඳහා අභිනවයෙන් වෙබ් අඩවි 10 ක් නිර්මාණය කරන ලදී. 2016 වර්ෂයේදී අයිපි සහ විපිඑන් පහසුකම් සහිතව යුද්ධ හමුදා දත්ත ජාලය තවදුරටත් ව්‍යාප්ත කරන ලදී.

35. එමෙන්ම යුද්ධ හමුදා මූලස්ථානය හා පනාගොඩ දත්ත මධ්‍යස්ථානය අතර සංඛ්‍යාත පරාසය තත්පරයට මෙගා බයිට් 16 ක වේගයකින් වැඩිකිරීම තුළින් යුද්ධ හමුදා දත්ත ජාලයෙහි හුවමාරු වේගය වැඩි දියුණු කරන ලදී. දත්ත ජාලයෙහි බෙදාහැරීමේ ඒකකය නව නිෂ්පාදනයක් (Check point firewall product) සමග යාවත්කාලීන කරන ලදී. සයිබර් ආරක්‍ෂාව සහ සයිබර් තර්ජන අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිලිබඳ වගකිව යුතු නිලධාරීන් දැනුවත් කිරීමේ අරමුණින් විශේෂ වැඩමුළු මෙහෙයවන ලද අතරම මෙම වර්ෂය තුළදී පහත සඳහන් පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරන ලදී:

අ. සුළු අවි සිමියුලේටර්.
ආ. ජීපීඑස් තාක්‍ෂණය තුළින් ක්‍රියාත්මක කල හැකි ඩ්‍රෝන වර්ගයේ කුඩා හෙලිකොප්ටර්.
ඇ. චලනය කල හැකි රොබෝ යන්ත්‍ර (Throw Robot).
ඈ. රේඩියෝ ස්ථානගත කර ඇති ස්ථාන හඳුනාගැනීමේ යන්ත්‍රය (Radio Set Locator).
ඉ. සයිබර් ආරක්‍ෂක සිමියුලේටර් (Cyber Security Simulator).
ඊ. පුද්ගලයන් හඳුනාගැනීමේ පද්ධතිය (Facial Recognition System).

36. **<u>අනාගත සැලසුම්.</u>** මෘදුකාංග දත්ත ඉංජිනේරු වෘත්තිකයන් හා තොරතුරු තාක්‍ෂණ නිලධාරීන් ස්ථාන මාරුකිරීම් සහ යා කිරීම් සම්බන්ධව වඩා සවිස්තරාත්මක හා තත්වයෙන් උසස් ප්‍රතිපත්තියක් හඳුන්වාදීම තුළින් මෘදුකාංග ව්‍යාපෘති කඩිනම් කිරීම හා ඔවුන් යුද්ධ හමුදාව තුළ රඳවා තබා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම අපේක්‍ෂා කර ඇත. තවද ශ්‍රී ලංකා සංඥා බලකායේ නිලධාරී සහ සෙසු නිලයන්ගේ තොරතුරු තාක්‍ෂණ ක්ෂේත්‍රය පිලිබඳ දැනුම යාවත්කාලීන කිරීම උදෙසා තොරතුරු තාක්‍ෂණ පාඨමාලා හැදෑරීම සඳහා වැඩි අවස්ථාවක් ලබා දිය යුතු බව නිර්දේශ කල හැක.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## මූල්‍ය කළමනාකරණ ශාඛාව

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියලුම මූල්‍ය ගැටලු වඩා කාර්යක්ෂමව හා කඩිනමින් කළමනාකරණය කිරීමේ අරමුණින් 2005.11.04 වන දින යුද්ධ හමුදා මූලස්ථානය තුළ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී ශාඛාවක් ලෙස මූල්‍ය කළමනාකරණ ශාඛාව ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන ගණක නිලධාරී ලෙස යුද්ධ හමුදාවේ මූල්‍ය කළමණාකරණය පිලිබඳ පුරෝකථනය, සැලසුම්කරණය, පාලනය සහ සමාලෝචනය පිලිබඳ යුද්ධ හමුදාධිපතිට වගකිව යුතු වේ.

2. එමෙන්ම මූල්‍ය කළමනාකරණ අධ්‍යක්ෂ ජෙනරාල් යුද්ධ හමුදාවේ සියලුම ගණක නිලධාරීන්ගේ විනය, නිල උසස් කිරීම්, රාජකාරි සඳහා යා කිරීම් සහ වෘත්තිය කළමණාකරණය ඇතුලු සියලුම පරිපාලනමය ගැටලු සම්බන්ධයෙන් වගකිව යුතු වේ.




රූප සටහන 10.1: මූල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ ඇති සංස්ථා.

3. **සපුරාගත් ඉලක්කයන්**. මහජන අරමුදල් සහ අනිකුත් අරමුදල් 97% දක්වා භාවිතා කිරීම තුළින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉලක්කයන් සපුරා ගැනීමට හැකි වූ අතර මූල්‍ය ගැටලු වඩා කාර්යක්ෂමව නිරාකරණය කරගන්නා ලදී.

### අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය

4. අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ පාලනය වන අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය කළමණාකරණය, අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම හා වැය ශීර්ෂ වෙන්කිරීම, මූල්‍ය කළමනාකරණ තොරතුරු අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ට අවශ්‍යතාවය අනුව සැපයීම යන කාර්යයන් කාර්‍යක්ෂමව හා ඵලදායී ලෙස සිදුකිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

5. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය.</u>** 2016.12.31 වන දිනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පුනරාවර්තන වියදම් සහ මූලධන වියදම් වල ප්‍රගතිය හා වැය ශීර්ෂ අරමුදල් විස්තරය පහත පරිදි වේ.

අ. **<u>පුනරාවර්තන වියදම්.</u>**

| අ/අ | වැය ශීර්ෂ විස්තරය | 2016.12.31 දිනට වැය ශීර්ෂ වෙන්කිරීම (රුපියල් මිලියන) | 2016.12.31 දිනට වියදම (රුපියල් මිලියන) | භාවිතා කරන ලද අරමුදල් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1. | පුද්ගලික වැටුප් | 121,250.19 | 117,663.83 | 97% |
| 2. | ගමන් වියදම් | 296.50 | 258.20 | 87% |
| 3. | වෙනත් සැපයීම් | 22,985.30 | 22,229.87 | 97% |
| 4. | නඩත්තු වියදම් | 587.00 | 585.57 | 100% |
| 5. | වෙනත් සේවා | 5,915.32 | 5,783.54 | 98% |
| 6. | මාරු කිරීම් | 556.00 | 526.17 | 95% |
| 7. | වෙනත් පුනරාවර්තන වියදම් | 74.30 | 74.24 | 100% |
| | **මුළු එකතුව** | **151,664.60** | **147,121.43** | **97%** |

සංඛ්‍යා සටහන 10.1: 2016 වර්ෂය සඳහා වෙන්කරන ලද පුනරාවර්තන අරමුදල් සහ වියදම්.




ප්‍රස්තාරය 10.1: 2016 වර්ෂය සඳහා වෙන්කරන ලද පුනරාවර්තන වෙන්කිරීම් සහ වියදම්.

ආ. **මූලධන වියදම්.**

| අ/අ | වැය ශීර්ෂ විස්තරය | 2016.12.31 දිනට වැය ශීර්ෂ වෙන්කිරීම (රුපියල් මිලියන) | 2016.12.31 දිනට වියදම (රුපියල් මිලියන) | භාවිතා කරන ලද අරමුදල් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1. | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 480.70 | 477.22 | 99% |
| 2. | මූලධන වත්කම් අත්පත් කරගැනීම | 2,162.10 | 2,132.16 | 99% |
| 3. | මානව සම්පත් සංවර්ධනය | 1,100.00 | 1,092.90 | 99% |
| | **එකතුව** | **3,742.80** | **3,702.27** | **99%** |
| **වෙනත් මූලධන වියදම්** | | | | |
| 4. | වෙනත් ආයෝජන | 2,305.94 | 497.90 | 22% |
| 5. | ණය යෝජනා ක්‍රම | 2,287.52 | 56.44 | 2% |
| | **එකතුව** | **4,593.46** | **554.34** | **12%** |
| | **මුළු එකතුව** | **8,336.26** | **4,256.60** | **51%** |

සංඛ්‍යා සටහන 10.2: 2016 වර්ෂය සඳහා වෙන්කරන ලද මූලධන වෙන්කිරීම් සහ වියදම්.




ප්‍රස්තාරය 10.2: 2016 වර්ෂය සඳහා වෙන්කරන ලද මූලධන වෙන්කිරීම් සහ වියදම්.

6. **<u>එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා ලද ආදායම්.</u>** 2016 මූල්‍ය වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ලෙබනන් සහ සූඩාන් වල එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් වල අනියුක්ත හටපිරිස් සඳහා අවශ්‍ය උපකරණ සහ ද්‍රව්‍ය මිල්දී ගැනීම සඳහා රුපියල් මිලියන 69.06 (ඇ.ඩෝ.මි 0.479) ක මුදලක් වියදම් කරන ලද අතර ඒ තුළින් උපයන ලද ආදායම රුපියල් මිලියන 423.40 (ඇ.ඩෝ.මි 2.92 ) කි.

7. **<u>ගැටලු සහ අභියෝග</u>**. 2016 වර්ෂයේ ඇස්තමේන්තු ගත අයවැය වෙන්කිරීම සහ සත්‍ය අයවැය වෙන්කිරීම පහත පරිදි වේ.

| අ/අ | විස්තරය | 2016 වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත මුදල (රුපියල් මිලියන) | 2016 වර්ෂයේ වාර්ෂික ප්‍රතිපාදන වෙන්කිරීම් (රුපියල් මිලියන) | වෙනස | |
|---|---|---|---|---|---|
| | | | | (රුපියල් මිලියන) | % |
| 1. | පුනරාවර්තන | 161,577.96 | 151,893.69 | 9,684.27 | 6% |
| 2. | මූලධන * | 8,910.45 | 3,150.00 | 5,760.45 | 65% |
| | **එකතුව** | **170,488.41** | **155,043.69** | **15,444.72** | |

* ණය යෝජනා ක්‍රම යටතේ ප්‍රතිපාදන වෙන්කිරීම් මෙම සංඛ්‍යා සටහනෙහි අන්තර් ගත නොවේ.

සංඛ්‍යා සටහන 10.3: ඇස්තමේන්තු ගත අයවැය වෙන්කිරීම.

අ. 2016 වර්ෂය සඳහා අයවැයෙන් වෙන්කරන ලද මුළු මුදල වන රුපියල් මිලියන 155,043.69 ක ඇස්තමේන්තු ගත මුදල හා සංසන්දනය කිරීමේදී එය රුපියල් මිලියන 15,444.72 අඩුය.

ආ. පහත සඳහන් වැය ශීර්ෂ සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන එහි මූලික කටයුතු සිදුකරගෙන යාම සඳහා අභියෝගයක් විය.

(1) **<u>පුනරාවර්තන වැය ශීර්ෂ</u>**.

(අ) වාහන වියදම් (විදේශ).
(ආ) වාහන කුලියට ගැනීම සඳහා වන වියදම්.
(ඇ) වාහන නඩත්තු කටයුතු සඳහා වන වියදම්.

(2) **<u>මූලධන වැය ශීර්ෂ</u>**.

(අ) ගොඩනැගිලි සහ සැළසුම් අත්පත් කරගැනීම.
(ආ) යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ අත්පත් කරගැනීම.
(ඇ) ශාක්‍යතා වර්ධනය (කාර්ය මණ්ඩල පුහුණුව).

ඇ. දුවශීලී මුදල් නොමැති කම හේතුවෙන් 2016.12.31 දිනට ගෙවීමට ඇති බිල්පත් වටිනාකම රුපියල් මිලියන 3,699.42 කි.

<u>අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය</u>

8. මූල්‍ය කටයුතු වලට අදාලව පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්ය සාධනය අධීක්ෂණය, ඇගයීම සහ කාලීනව වෙනස් වන මූලික රෙගුලාසි වලට අනුකූලව පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කිරීම.

අ. අඛණ්ඩ සමීක්ෂණ සිදුකිරීම තුළින් පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම.

ආ. වත්කම්, අලාභ, නාස්තිය හා යල් පැනීම් වලින් සුරක්ෂිත කිරීම.

ඇ. දුර්වල පද්ධති හඳුනාගෙන එම පද්ධති වැඩිදියුණු කිරීම.

ඈ. වැරදි හා වංචා වැළැක්වීම සහ හෙළිදරව් කරගැනීම සඳහා අවශ්‍ය වන අභ්‍යන්තර පාලන ක්‍රියාත්මක කිරීම.

9. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය</u>**. මෙම වර්ෂය තුළද අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය පහත පරිදි වේ:

අ. විගණන ජෙනරාල් දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලද සියලුම විගණන නිරීක්ෂණ සඳහා පිලිතුරු සපයන ලදී.

ආ. යුද්ධ හමුදා චර්යා නියෝග 29/2006 උපදෙස් පරිදි ප්‍රධාන මාණ්ඩලික නිලධාරිගේ ප්‍රධානත්වයෙන් දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 2016.03.28 සහ 2016.12.28 යන දිනයන්හිදී පවත්වන ලදී.

ඇ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් 2016.05.05 සහ 2016.10.26 යන දිනයන්හිදී ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ආරක්ෂක අමාත්‍යාංශය තුළ පැවැති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගි වන ලදී.

ඈ. 2016.06.24 වන දින පාර්ලිමේන්තු කමිටු රැස්වීම් කාමර අංක 06 හි පැවැත්වූ මහජන ගිණුම් කමිටු රැස්වීම සඳහා යුද්ධ හමුදාධිපති තුමා සමග සහභාගී විය.

10. **<u>ශාක්‍යතා සංවර්ධන ක්‍රියාකාරකම්</u>**. 2016 මූල්‍ය වර්ෂය තුළ විගණන නිරීක්ෂණ අවම කිරීමේ අරමුණින් 'දැනුවත් වීම තුලින් වැලකීම' යන සංකල්පය මූලික කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩ සටහන් සේනාංක මූලස්ථාන, රෙජිමේන්තු මධ්‍යස්ථාන සහ බළඇණි මට්ටමින් මෙහෙයවන ලදී. මෙහිදී ඒ ඒ ආයතන මහජන හා මහජන නොවන අරමුදල් පිලිබඳ දැනුවත් කරන ලද අතර මෙම වැඩ සටහන සඳහා නිලධාරීන් 160 ක් හා සෙසුනිල 1112 ක් සහභාගී විය.

11. **<u>ගැටලු සහ අභියෝග</u>**. මෙම වර්ෂය තුළදී මුහුණ දුන් ප්‍රධාන ගැටලු සහ අභියෝග පහත පරිදි වේ:

අ. විශේෂ විගණන පරීක්ෂණ රාශියක් සඳහා බලාපොරොත්තු නොවූ අයුරින් විගණන නිලධාරීන් සහභාගී කරවීමට සිදු වූ නිසා දැනට සිදු කරමින් පවතින විගණන පරීක්ෂණ කටයුතු අඩාල වීම.

ආ. නිරීක්ෂණ ප්‍රමාණය වැඩිවීම හා එම නිරීක්ෂණ වලින් වැඩි ප්‍රමාණයක් සාවද්‍ය වීම හේතුවෙන් නියමිත කාලය තුළ විගණන පරීක්ෂණ සිදු කිරීමට නොහැකි වීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් විගණන සැලසුමට අනුව විගණන පරීක්ෂණ සම්පූර්ණ කිරීමට නොහැකි වීම.

**<u>වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

12. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දැනට සේවයේ නියුක්ත නිලධාරීන්ගේ සහ සෙසු නිලයන්ගේ මෙන්ම ක්‍රියාන්විතයේදී මිය ගිය හා අබාධිත වූ අයවලුන්ගේ වැටුප් හා දීමනා ගෙවීම, වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීමයි. තවද වැටුප්, දීමනා, වන්දි ගෙවීම හා සම්බන්ධ ප්‍රතිපත්ති නගා සිටුවීම, පුද්ගලික ලිපි ලේඛණ නඩත්තු කිරීම, වාර්ෂික පරිපූරක ඇස්තමේන්තු සැකසීම හා ස්ථායි පිරිස් බලයක් නඩත්තු කිරීම වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

13. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය</u>**. 2016.01.31 දින සිට 2016.12.31 දින දක්වා නිලධාරීන් සහ සෙසු නිලයන් වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීම හා ක්‍රියාන්විතයේදී මිය ගිය හා අබාධිත වූ අයවලුන් සඳහා කරන ලද වැටුප් හා දීමනා සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

අ. නිලධාරී සහ සෙසු නිල වැටුප්.

| අ/අ | විස්තරය | නිත්‍ය (රුපියල් මිලියන) | ස්වේච්ඡා (රුපියල් මිලියන) | එකතුව (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| 1. | නිලධාරී | 6,330.33 | 2,116.22 | 8,446.55 |
| 2. | සෙසුනිල | 66,818.36 | 37,885.51 | 104,703.87 |

සංඛ්‍යා සටහන 10.4: නිලධාරී සහ සෙසු නිල වැටුප්.

ආ. 2016.01.31 දින සිට 2016.12.31 දින දක්වා ක්‍රියාන්විතයේදී මිය ගිය හා අබාධිත වූ පුද්ගලයන් සඳහා කරන ලද ගෙවීම්.

| අ/අ | විස්තරය | නිත්‍ය (රුපියල් මිලියන) | ස්වේච්ඡා (රුපියල් මිලියන) | එකතුව (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| 1. | නිලධාරී | 1,237.86 | 132.68 | 1,370.55 |
| 2. | සෙසුනිල | 18,808.43 | 3,636.69 | 22,445.12 |

සංඛ්‍යා සටහන 10.5: ක්‍රියාන්විතයේදී මිය ගිය හා අබාධිත වූ අයවලුන් සඳහා කරන ලද ගෙවීම්.

ඇ. 2016 ජනවාරි 1 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වන කාල පරාසය තුළ විදේශීය පාඨමාලා සංචාර සහ සම්මන්ත්‍රණ සඳහා නිලධාරී සහ සෙසුනිල වෙනුවෙන් කරන ලද ගෙවීම් පහත පරිදි වේ:

| අ/අ | විස්තරය | සහභාගී වූ සංඛ්‍යාව | ගෙවන ලද මුදල් ප්‍රමාණය (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 1. | සංචාර | 557 | 177.3 |
| 2. | පාඨමාලා | 1279 | 1004.3 |
| | **එකතුව** | **1836** | **1181.6** |

සංඛ්‍යා සටහන 10.6: විදේශීය පාඨමාලා සංචාර සහ සම්මන්ත්‍රණ සඳහා කරන ලද ගෙවීම්.

ඈ. 2016 ජනවාරි 31 සිට 2016 දෙසැම්බර් 31 කාලපරාසය තුල ආබාධිත / විශ්‍රාමික වැටුප් හා පාරිතෝෂිත මුදල් ගෙවීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ:

| අ/අ | විස්තරය | හිමිගැන්වූ පුද්ගලයින් සංඛ්‍යාව | ගෙවන ලද මුදල් ප්‍රමාණය (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 1. | පරිවර්තිත පාරිතෝෂික | 4,829 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ගෙවන ලදී |
| 2. | සේවා පාරිතෝෂික | 371 | 166.81 |
| 3. | දුබලතා විශ්‍රාම වැටුප් | 2,725 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ගෙවන ලදී |
| | **එකතුව** | **7,925** | **166.81** |

සංඛ්‍යා සටහන 10.7: ආබාධිත විශ්‍රාමික වැටුප් හා පාරිතෝෂික මුදල් ගෙවීම්.

ඉ. ආපදා ණය ගෙවීම් පිළිබඳ විස්තරය (මාස 10 සහනදායී ගෙවීම් හෝ උපරිමය රු: 250,000.00) හා සලකා බලන ලද අයදුම්පත් ප්‍රමාණය සහ වාහන ණය හා දේපල ණය ලබාගැනීම සඳහා අදාල රාජ්‍ය බැංකු වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රමාණය:

(1) ප්‍රමුඛතා බී ගිණුම් අරමුදල.

| අ/අ | විස්තරය | හිමිගැන්වූ පුද්ගලයින් සංඛ්‍යාව | ගෙවන ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවන ලද සංඛ්‍යාව රුපියල් මිලියන | 2016 12.31 දිනට අයදුම්පත් ක්‍රියාවලිය |
|---|---|---|---|---|---|
| 1. | ආපදා ණය | 3,933 | 3,040 | 531.00 | 369 |
| 2. | දේපල ණය | 536 | - | - | - |
| 3. | වාහන ණය | - | - | - | - |
| | **එකතුව** | **4,469** | **3,040** | **531.00** | **369** |

සංඛ්‍යා සටහන 10.8: ප්‍රමුඛතා බී ගිණුම් අරමුදල.

(2) යුද්ධ හමුදා යහසාධක අරමුදල.

| අ/අ | විස්තරය | හිමිගැන්වූ පුද්ගලයින් සංඛ්‍යාව | ගෙවන ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවන ලද සංඛ්‍යාව රුපියල් මිලියන |
|---|---|---|---|---|
| 1. | ආපදා ණය | - | - | - |
| 2. | දේපල ණය | 07 | 03 | 8.00 |
| 3. | වාහන ණය | - | - | - |
| | **එකතුව** | **07** | **03** | **8.00** |

සංඛ්‍යා සටහන 10.9: යුද්ධ හමුදා යහසාධක අරමුදල.

ඊ. ශ්‍රී ලංකා යුද හමුදාවේ නිලධාරීන් සහ සෙසුනිල දෙපිරිසකගේම ජීවන තත්ත්වය නගාසිටුවීම වස් සුවසහන නමින් 9% ක වාර්ෂික පොලියක් සහිතව නිලධාරී හා සෙසුනිලයින්ගේ යහසාධක අරමුදලේ තැන්පත් කරන ලද මුදල් වලින් ලබාදීම සඳහා සුභසාධන ණය ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. එය 2014 මැයි මස සිට ආරම්භ කරන ලද අතර ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අ/අ | විස්තරය | සළකා බලන ලද අයදුම්පත් ප්‍රමාණය | ගෙවන ලද මුදල් ප්‍රමාණය රුපියල් මිලියන |
|---|---|---|---|
| 1 | පෞද්ගලික ණය | 898 | 826.65 |
| 2 | පූර්ව ණය නිදහස් කරගැනීම සඳහා වූ ණය | 178 | 168.35 |
| | **එකතුව** | **1076** | **995.00** |

සංඛ්‍යා සටහන 10.10: ‘සුවසහන’ ණය ක්‍රමය ලෙස නගා සිටුවන ලද සුභසාධන ණය ක්‍රමය.

උ. සොල්දාදුවන්ගේ දෙමාපියන් සඳහා වන රු: 750.00 ක විශේෂ දීමනාව 2012 ඔක්තෝබර් සිට මාසික දීමනාවක් වශයෙන් රජය විසින් වෙන්කරන ලදී. ඒ අනුව 2016 දෙසැම්බර් දක්වා නිලධාරී / සෙසුනිලයන්ගේ දෙමාපියන් සඳහා කරන ලද ගෙවීම් පහත සඳහන් පරිදි වේ.

| විස්තරය | දෙමාපියන් සංඛ්‍යාව | රුපියල් මිලියන |
|---|---|---|
| දෙමාපියන් | 154,478 | 115,85.00 |

සංඛ්‍යා සටහන 10.11: යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දෙමාපියන් සඳහා වු විශේෂ දීමනා.

ඌ. 2016 ජනවාරි මස 01 දින සිට 2016 දෙසැම්බර් 31 දක්වා සිදුකරන ලද වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් විශේෂ වන්දි වැන්දඹු දායකත්ව අරමුදල් යැපෙන්නන් වෙනුවෙන් කරන ලද ගෙවීම් මරණාධාර දීමනා පිළිබඳ විස්තර පහත පරිදි වේ:

| අ/අ | විස්තරය | අයදුම්පත් සංඛ්‍යාව | ගෙවන ලද මුදල් ප්‍රමාණය රුපියල් මිලියන |
|---|---|---|---|
| 1. | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | 412 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවන ලදී |
| 2. | විශේෂ වන්දි | 66 | 102.60 |
| 3. | වන්දි - පි. ඒ. සි. 21/88 | 4 | 0.33 |
| 4. | වන්දි - පි. ඒ. සි. 22/93 | 227 | 51.96 |
| 5. | වන්දි - හ. ච. නි. 12/86 | 2,677 | 116.17 |
| 6. | නැවත විවාහය පිළිබඳ වැන්දඹු වන්දි | 57 | 199.37 |
| 7. | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල | 209 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවන ලදී |
| 8. | යැපෙන්නන් සඳහා කරන ලද ගෙවීම් | 170 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවන ලදී |
| 9. | මරණාධාර දීමනා | 155 | 83.42 |
| | **එකතුව** | **3,977** | **553.85** |

සංඛ්‍යා සටහන 10.12: වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්.

14. **ශාක්‍යතා වර්ධන ක්‍රියාකාරකම්**. මෙම වර්ෂය තුළදී සිදුකරන ලද ශාක්‍යතා වර්ධන ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

අ. වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඔවුනොවුන්ගේ වැටුප් හා ගැටලු විසඳා ගැනීමට පැමිණෙන පුද්ගලයින් සඳහා විශේෂිත වූ ස්ථානයක් නිර්මාණය කරන ලදී (ක්‍රියාන්විතයේදී මියගිය පුද්ගලයින්ගේ යැපෙන්නන් සඳහා කරන ලද ගෙවීම්, නිලධාරී / සෙසුනිල වැටුප් හා විශ්‍රාම වැටුප්, සේවයෙන් ඉවත් කල පුද්ගලයින්ගේ වැටුප් හා දීමනා පාරිතෝෂික දීමනා හා විවිධ ගැටලු සලකා බැලීම සඳහා).

ආ. ශ්‍රී ලංකා යුද හමුදාවේ ආබාධිතව සේවයෙන් ඉවත්කල නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සහ ක්‍රියාන්විතයේදී මියගිය සාමාජිකයන්ගේ යැපෙන්නන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා යුද හමුදා යහසාධක අරමුදල විසින් රණවිරු සහන නමින් 9% ක වාර්ෂික පොලියක් සහිත ණය ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. එය 2016 ජූලි මස සිට ආරම්භ කරන ලද අතර එහි විස්තර පහත පරිදි වේ.

| අ/අ | විස්තරය | සලකා බලන ලද අයදුම්පත් ප්‍රමාණය | ගෙවන ලද මුදල් ප්‍රමාණය රුපියල් මිලියන |
|---|---|---|---|
| 1. | වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගිය නිලධාරින් / සෙසුනිලයන් | 967 | 642.90 |
| 2. | මියගිය අයවලුන්ගේ යැපෙන්නන් | 591 | 322.40 |
| | **එකතුව** | **1558** | **965.30** |

සංඛ්‍යා සටහන 10.13: ආබාධිත තත්ත්වය මත සේවයෙන් ඉවත් කරන ලද සෙසුනිල විස්තරය.

15. **අනාගත සැලසුම්.** 2017 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා අපේක්ෂිත මූලික වෙන්කිරීම් පහත සඳහන් පරිදි වේ.

| අ/අ | විස්තරය | රුපියල් මිලියන |
|---|---|---|
| 1. | වැටුප් හා දීමනා | 113,635.31 |
| 2. | විදේශ පාඨමාලා | 1,046.37 |
| 3. | සංචාර දීමනා | 150.00 |
| 4. | දේපළ ණය පොලිය | 224.00 |
| 5. | වන්දි | 120.00 |
| 6. | ගමනාගමන කටයුතු සඳහා දීමනා | 1.50 |
| 7. | ආබාධිත යුද හමුදා සාමාජිකයින් සහ ක්‍රියාන්විතයේදී මියගිය පුද්ගලයන්ගේ යැපෙන්නන් සඳහා කරන ලද ගෙවීම් | 26,022.00 |
| 8. | රණවිරු දෙමාපියන් සඳහා කරන ලද දීමනා | 1,400.00 |
| 9. | වෙනත් දීමනා | 185.24 |
| | **වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වූ මුළු වෙන්කිරීම්** | **142,784.44** |

සංඛ්‍යා සටහන 10.14: පුනරාවර්තන වියදම් සඳහා අපේක්ෂිත මූලික වෙන්කිරීම්.

**<u>වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

16. යුද හමුදා චර්යා නියෝග 21/2006 ට අනුව 2005 නොවැම්බර් 14 දින වත්කම් කළමණාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය පිහිටුවන ලදී. එය යුද හමුදා මූලස්ථානයේ මූල්‍ය කළමණාකරණ ශාඛාව යටතේ පාලනය වන අතර එහි වගකීම් වනුයේ ශ්‍රී ලංකා යුද හමුදාවේ සියලු වත්කම් වඩා ඵලදායී හා කාර්යක්ෂමව කළමණාකරණය කිරීමය.

17. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය</u>.** වත්කම් කළමණාකරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ පහත සඳහන් අංශ මගින් ප්‍රධාන ක්‍රියාකාරකම් 04 ක් ක්‍රියාවට නංවන ලදී.

අ. වාර්ෂික සමීක්ෂණ මණ්ඩල සාරාංශය.

| අ/අ | මණ්ඩල වර්ගය | වත්කම් මධ්‍යස්ථාන වෙතින් කැඳවීමට නියමිත මණ්ඩල සංඛ්‍යාව | කැඳවන ලද මණ්ඩල සංඛ්‍යාව | සම්පූර්ණ කරන ලද මණ්ඩල සංඛ්‍යාව | සම්පූර්ණ කිරීමට නියමිත මණ්ඩල සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | 2016 වර්ෂයට අදාල වාර්ෂික වර්ග කිරීමේ මණ්ඩල | 627 | 627 | 502 | 125 |
| 2. | වාර්ෂික අයෝග්‍ය කිරීමේ මණ්ඩල (2015 වර්ෂයට අදාල) | 627 | 627 | 627 | - |
| 3. | වාර්ෂික විනාශ කිරීමේ මණ්ඩල (2015 වර්ෂයට අදාල) | 627 | 627 | 627 | - |

සංඛ්‍යා සටහන 10.15: වාර්ෂික මණ්ඩල සාරාංශය.

ආ. **<u>ස්ථාවර වත්කම් වර්ගීකරණය.</u>** රාජ්‍ය මූල්‍ය රෙගුලාසි 507(2) ට අනුව සෑම මූල්‍ය වර්ෂයකම දෙසැම්බර් 31 දිනට සෑම ස්ථාවර වත්කම් වර්ගීකරණය සිදුකර එහි වර්තමාන තත්ත්වය දැක්විය යුතුය. ඒ සඳහා මණ්ඩල පත්කරන ලද අතර 2015 වර්ෂයට අදාල මණ්ඩල 499ක් 2016 වර්ෂයේදී හා 2016 ට අදාල වර්ගීකරණ මණ්ඩල 500ක් 2017 වර්ෂයේදීද අනුමත කරන ලදී.

ඇ. මෙම වර්ෂය තුළදී සිදුවූ නැතිවීම් හා හානිවීම් පිළිබඳ සාරාංශ ගත වාර්තාව පහත සඳහන් පරිදි වේ.

(1) 2016.01.01 දිනට ක්‍රියාවට නංවන ලද සිදුවීම් ගණන - 318
(2) 2016.01.01 - 2016.12.31 දින දක්වා වාර්තා වූ සිදුවීම් ගණන - 175
(3) 2016.01.01 - 2016.12.31 දින දක්වා සම්පූර්ණ කරන ලද සිදුවීම් ගණන- (200)
(4) 2016.01.01 - 2016.12.31 දින දක්වා අවලංගු කරන ලද සිදුවීම් ගණන - (09)
(5) 2016.12.31 දිනට ක්‍රියාත්මක සිදුවීම් ගණන - 284

ත්‍රස්ථවාදී ක්‍රියාකාරකම් හේතුවෙන් යුද හමුදා දේපල නැතිවීම් සහ හානිවීම් පිළිබඳ සිදුවීම් සැළකිය යුතු ප්‍රමාණයක් වාර්තා වී ඇති බව නිරීක්ෂණය වේ. සිද්ධීන් 200ක් වෙනුවෙන්, මූල්‍ය රෙගුලාසි 109 අනුව කපා හරින ලද නැවත යථා තත්ත්වයට පත්කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී. නැතිවීම් හා අලාභහානි වෙනුවෙන් කපාහරින ලද මුලු වටිනාකම රුː 176,182,736.70 කි.

ඈ. **<u>මිල ගණන්පත් කැඳවීම් අංශයේ සාරාංශය.</u>** යුද හමුදා යුධෝපකරණ ඒකකවලට අයත් සියලුම භාවිතයට ගත නොහැකි වාහන සහ උපකරණ එකතු කර මහජන මිල ගණන්පත් කැඳවීම් මගින් ඉවත් කිරීම සිදුකරන ලදී. ඒ තුළින් ලද ආදායම් පහත සඳහන් පරිදි වේ.

(1) 2016 වර්ෂයේදී උපයන ලද ආදායම - I මිල ගණන්පත්.

| අ/අ | විස්තරය | ප්‍රමාණය | ආදායම රුපියල් |
|---|---|---|---|
| 1. | වාහන | 243 | 64.336,877.00 |
| 2. | පොදු භාණ්ඩ | 68 | 12,443,558.00 |
| | **එකතුව** | **311** | **76,780,435.00** |

සංඛ්‍යා සටහන 10.16: උපයාගත් ආදායම්.

(2) 2016 වර්ෂයේදී අපේක්ෂිත ආදායම - II මිල ගණන්පත්

| අ/අ | විස්තරය | ප්‍රමාණය | ආදායම රුපියල් |
|---|---|---|---|
| 1. | වාහන | 205 | 37,339,201.00 |
| 2. | පොදු භාණ්ඩ | 103 | 32,486,074.70 |
| | **එකතුව** | **308** | **69,825,275.70** |

(මිල ගණන්පත් කැඳවීමේ ක්‍රියාවලියෙන් අනතුරුව මුලු ආදායම සහතික කල හැක)

සංඛ්‍යා සටහන 10.17 අපේක්ෂිත ආදායම්.

18. **<u>ශාක්‍යතා වර්ධන ක්‍රියාකාරකම්.</u>** ශ්‍රී ලංකා යුද හමුදාවේ සියලු ස්ථාවර වත්කම් වඩා කාර්යක්ෂමව කළමණාකරණය කිරීම සඳහා ස්වයංක්‍රීය වත්කම් පද්ධතිය හඳුන්වා දෙන ලදී.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

**<u>යුද හමුදා යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

19. යුද හමුදා සාමාජිකයින් තුළ සකසුරුවම හා ඉතිරි කිරීම පිළිබඳ සංකල්පය ප්‍රචලිත කිරීමේ අරමුණින් 1981 වර්ෂයේදී යුද හමුදා සුභසාධන අරමුදල ස්ථාපිත කරන ලදී. ඉන් අනතුරුව 1996 ජනවාරි 1 දින සිට එය ශ්‍රී ලංකා යුද හමුදා යහසාධක අරමුදල නමින් නාමය වෙනස් කරන ලදී. එයට පැවරුණ කාර්යභාරයේ වැඩිවීමත් සමග 2009 අගෝස්තු 30 දින එය අධ්‍යක්ෂ මණ්ඩලයක් ලෙස උසස් කරන ලදී.

20. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය.</u>** මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික පරමාර්ථය වනුයේ යුද හමුදා සාමාජිකයින් තුළ සකසුරුවම පිළිබඳ සංකල්පය ප්‍රචලිත කිරීමයි. ඒ සඳහා මෙම වර්ෂය තුළ කරන ලද ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

අ. ප්‍රධාන ක්‍රියාකාරකම්.

(1) සාමාජිකත්වය ලබාදීම.
(2) දායකත්ව අරමුදල් එකතු කිරීම.
(3) ආරක්ෂිත ස්ථාවර අදායම් සඳහා ආයෝජනය කිරීම.
(4) කාර්තුවකට පොළිය ප්‍රකාශයට පත්කිරීම.
(5) සාමාජිකයින් සඳහා ණය ලබාදීම (දායකත්ව මුදලින් 85% ).
(6) සාමාජිකයින් සඳහා තැන්පතු මුදලින් 80% නැවත ලබාගැනීමට පහසුකම් සැපයීම.
(7) සාමාජිකයින් සඳහා නැවත අරමුදල් ලබාදීම.
(8) ප්‍රතිලාභීන් සඳහා නැවත අරමුදල් ලබාදීම.
(9) සුව සහන, ආපදා හා දේපල ණය ක්‍රමයන් සඳහා අරමුදල් ලබාදීම.

ආ. ඉහත සඳහන් ක්‍රියාකාරකම් වලට අමතරව ක්‍රියාන්විතයේදී ආබාධිත වූ සාමාජිකයින්ට හා මියගිය සාමාජිකයින්ගේ යැපෙන්නන් සඳහා ක්‍රියාවට නංවන ලද රණවිරු සහන ණය ක්‍රමය සඳහා අරමුදල් සැපයීමද සිදුකරනු ලබයි.

ඇ. **<u>අරමුදල් හා සාමාජිකත්ව විස්තර.</u>** 2016 වර්ෂයේදී යුද හමුදා සාමාජිකයින් 8819 සඳහා සාමාජිත්වය පිරිනැමූ අතර, 2016 දෙසැම්බර් 31 දිනට අරමුදලෙහි මුලු ක්‍රියාකාරී සාමාජික සංඛ්‍යාව 168581 කි. 2016 වර්ෂය තුළදී මෙම අරමුදල රුැමි: 3070 කින් වැඩිවූ අතර, 2016 සැප්තැම්බර් 30 දිනට අරමුදලෙහි මුලු වටිනාකම රුැමි: 58250 කි. (මූල්‍ය ගිණුම් කටයුතු තවමත් සිදු කරමින් පවතින බැවින් 2016 දෙසැම්බර් 31 දිනට වටිනාකම ගණනය කිරීමට නොහැකි වී තිබේ).

ඈ. **<u>ආයෝජන - ණය.</u>** 2016 දෙසැම්බර් 31 දිනට සුව සහන, ආපදා, දේපල, රණවිරු සහන හා 85% ණය ක්‍රමය යටතේ සිදුකරන ලද ආයෝජන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අ/අ | ණය ක්‍රමය | සාමාජිකයන් සංඛ්‍යාව | ගෙවන ලද මුදල් ප්‍රමාණය රුපියල් මිලියන |
|---|---|---|---|
| 1. | සුව සහන | 25,795 | 19,017.00 |
| 2. | ආපදා | 13,870 | 2,250.00 |
| 3. | දේපල | 16 | 32.00 |
| 4. | රණවිරු සහන | 1,591 | 965.00 |
| 5. | 85% ණය | 6,813 | 1,667.00 |
| | **එකතුව** | **48,085** | **23,931.00** |

සංඛ්‍යා සටහන 10.18: ආයෝජන - ණය.

ඉ. 2016.12.31 වන දිනට ආයෝජන සාරාංශය (රුපියල් මිලියන).

| බැංකු වර්ගය | ලංකා බැංකුව | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | මහජන බැංකුව | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | ගල් වැඩපල සඳහා ආයෝජන | එකතුව | % |
|---|---|---|---|---|---|---|---|
| නැවත මිලදී ගැනීමේ තැන්පතු | 1,950.92 | 21,173.83 | - | - | - | 23,124.75 | 60.38% |
| ස්ථාවර තැන්පතු | 4,344.71 | 8,751.38 | 853.00 | 1,066.69 | - | 15,015.78 | 39.20% |
| භාණ්ඩාගාර බිල්පත් | - | - | 143.99 | | - | 143.99 | 0.38% |
| ගල් වැඩපල සඳහා ආයෝජන | - | - | - | - | 15.00 | 15.00 | 0.04% |
| එකතුව | **6,295.63** | **29,925.21** | **996.99** | **1,066.69** | **15.00** | **38,299.52** | **100%** |
| ප්‍රතිශතය | 16.44% | 78.13% | 2.60% | 2.79% | 0.04% | - | 100% |

සංඛ්‍යා සටහන 10.19: ආයෝජන සාරාංශය.

ඊ. 2016 ජනවාරි 1 සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ සිදුකරන ලද ගෙවීම්.

| අ/අ | විස්තරය | ගෙවීම් සිදුකරන ලද සංඛ්‍යාව | ගෙවන ලද මුදල් ප්‍රමාණය රුපියල් මිලියන |
|---|---|---|---|
| 1. | 80% දක්වා තැන්පතු නැවත ලබාදීම | 4,127 | 2,233.00 |
| 2. | අවසන් ගෙවීම් | 18,453 | 4,784.00 |
| 3. | 85 % දක්වා ණය | 6,813 | 1,667.00 |
| 4. | පොලී ගෙවීම් | 5,372 | 72.00 |
| 5. | අත්තිකාරම් ගිණුම - බී | 6,980 | 34.00 |

සංඛ්‍යා සටහන 10.20: වර්ෂය තුල සිදුකරන ලද ගෙවීම්.







ප්‍රස්තාරය 10.3: වර්ෂය තුළ සිදුකරන ලද ගෙවීම්.

උ. ශ්‍රී ලංකා යුද හමුදා හදිසි අනතුරු ප්‍රතිපාදන ක්‍රමය තුළ සිදු කරන ලද ආයෝජන 2016.12.31 දිනට ඉතිරිය.

| අ/අ | ආයතනය | වර්ගය | මුදල (රුපියල්) | මුහුණත වටිනාකම (රුපියල්) | මුළු වටිනාකම (රුපියල්) |
|---|---|---|---|---|---|
| 1. | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 5,765,526.84 | 6,354,874.25 | 589,347.41 |
| 2. | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 1,396,514.71 | 1,538,568.95 | 142,054.24 |
| 3. | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 3,597,375.00 | 3,965,095.72 | 367,720.72 |
| 4. | මහජන බැංකුව | ස්ථාවර තැන්පතු | 20,000,000.00 | 21,032,164.38 | 1,032,164.38 |
| | **මුළු එකතුව** | | **30,759,416.55** | **32,890,703.31** | **2,131,286.75** |

සංඛ්‍යා සටහන 10.21: ආයෝජන සැබැඳි සුහසාධන විස්තර.

**<u>කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

21. ශ්‍රී ලංකා යුද හමුදාව මගින් කළමණාකරණය කරනු ලබන යුද හමුදා ගොවිපලවල් සඳහා වඩා හොඳ තාක්ෂණික හා සම්බන්ධීකරණ සහාය ලබාදීමේ අරමුණින් 2011 නොවැම්බර් මස කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපිත කරන ලදී. පසුගිය වසර 03 ක කාලසීමාව තුළ මධ්‍යම මට්ටමෙහි සම්බන්ධතාවයක් සහ ආධාරක යාන්ත්‍රණයක් තිබීම තුළින් යුද හමුදා ගොවිපලවල නිෂ්පාදනයේ සහ ලාභයෙහි සැලකිය යුතු වර්ධනයක් දැකිය හැකි විය. වර්තමානය වන විට මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ සෘජු අධීක්ෂණය යටතේ යුද හමුදා ගොවිපලවල් 06ක් ක්‍රියාත්මක වන අතර එම ගොවිපලවල් මගින් වී / කිරි නිෂ්පාදන / එළවලු සහ පළතුරු නිෂ්පාදනය කරනු ලබයි. මීට අමතරව කෘෂිකර්ම හා පශු සම්පත් අධක්‍ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බලකාය යටතේ පවතින යුද හමුදා ගොවිපලවල් 7 හි හා අනෙකුත් විවිධ යුද හමුදා ආයතන යටතේ පවතින යුද හමුදා ගොවිපල කිහිපයෙහිද සියලු කෘෂිකාර්මික කටයුතු මෙහෙයවනු ලබයි.

22. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් හා ඒවායෙහි ප්‍රගතිය.</u>** මෙම වර්ෂය තුළදී කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාවට නංවන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් හා ඒවායේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

අ. තිරසාර කෘෂිකාර්මික ක්‍රමය ප්‍රචලිත කිරීමේ අරමුණින් සාම්ප්‍රදායික සහල් වර්ග අක්කර 100ක් තුළ වගා කිරීම.





ආ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව දිගුකාලීන සහ කෙටිකාලීන වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.





ඇ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව බඩ ඉරිඟු හා අනෙකුත් වගා ඇට නිෂ්පාදන වැඩසටහනක් මෙහෙයවීම.

ඈ. ජලවිදුලි බලාගාර ආශ්‍රිතව පැළ සිටුවීමේ වැඩසටහනක් ආරම්භ කිරීම.

ඉ. “ස්පිරුලිනා” ඇල්ගී විශේෂය නිෂ්පාදනය.





ඊ. බ්‍රවුන්ස් ග්ලෝබල් ෆාර්මින් ආයතනය හා අත්තම කොලිටි ඇග්‍රෝ පුද්ගලික සමාගම එක්ව ඒකාබද්ධ කෘෂිකාර්මික කටයුතු ආරම්භ කිරීම.

උ. කෘෂි පාරිසරික සංචාර කටයුතු අඛණ්ඩව සිදුකිරීම.

ඌ. කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානවල කටයුතු සිදුකර ගෙනයාම .

එ. මිලගණන්පත් වල මිල අඩු කිරීම තුළින් යුද හමුදාව සඳහා එළවලු / පළතුරු / බිත්තර සහ කුකුලු මස් සැපයීම.

ඒ. ශ්‍රී ලංකාවේ වන ව්‍යාප්තිය වැඩිකිරීමේ අරමුණින් පුනරුදය ශාක රෝපණ වැඩසටහන යටතේ කන්දකාඩු යුද හමුදා ගොවිපල හා අනෙකුත් යුද හමුදා කඳවුරු අවට පිළිවෙලින් අක්කර 100 හා අක්කර 2197 ක ප්‍රමාණයක වනවගා කටයුතු සිදුකිරීම.

ඔ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ දෙමුහුන් බඩ ඉරිඟු ඇට නිෂ්පාදනය හා අනෙකුත් වගා කටයුතු සිදුකිරීම.

ඕ. ස්පිරිනා ඇල්ගී විශේෂය භාවිතා කරමින් වැඩි වටිනාකමකින් යුත් නිෂ්පාදන හඳුන්වාදීම.

ක. 2017 දුප්පත්කම තුරන් කිරීමේ වර්ෂය යන තේමාව යටතේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල කෘෂිකර්මය පිළිබඳ උනන්දුවක් දක්වන සිවිල් ජනතාව වෙනුවෙන් ත්‍රෛමාසික කෘෂිකාර්මික පාඨමාලාවක් මෙහෙයවීම.

ග. ජනාධිපති පදවිප්‍රාප්තියේ දෙවන සංවත්සරය සැමරීමේ අරමුණින් සියලුම ආරක්ෂක සේනා මූලස්ථාන සියලුම රෙජිමේන්තු මූලස්ථාන හා සියලුම පුහුණු පාසල්වල පැළ 41000 ක් රෝපණය කිරීම.

ච. කොත්මලේ ජල විදුලි බලාගාරය ආශ්‍රිතව පැළ රෝපණය කිරීමේ වැඩසටහනේ දෙවන අධියර ක්‍රියාවට නැංවීම.

ට. ‘වසවිස නැති රටක් ගිලිසිරියා පැළ බිලියනයක්’ යන තේමාව යටතේ ශාක රෝපණය කිරීම තුළින් විදුලි නිෂ්පාදනය ජෛව ගල් අඟුරු නිෂ්පාදනයට හා කාබනික කෘෂිකාර්මික කටයුතු සඳහා පොහොර නිෂ්පාදනය සඳහා යුද හමුදා ගොවිපල හා අනෙකුත් යුද හමුදා කඳවුරු තුල ගිලිඩිසිරියා පැළ 385000 ක් රෝපණය කිරීම.

ඩ. යාපනය අර්ධද්වීපයේ වන ව්‍යාප්තිය වැඩි කිරීමේ අරමුණින් ශාක 50000 ක් රෝපණය කිරීම.

න. සාලාව යුද හමුදා කඳවුරු ප්‍රදේශයට අවට සිවිල් ජනතාව වෙනුවෙන් වී වගා කිරීම උදෙසා අක්කර 240ක බිම් සකස් කිරීමේ කටයුතු.





23. **<u>ශාකශාස්ත්‍ර වර්ධන ක්‍රියාකාරකම්.</u>** මෙම වර්ෂය තුළදී ක්‍රියාවට නංවන ලද ශාකශාස්ත්‍ර වර්ධන ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

අ. සාම්ප්‍රදායික කෘෂිකාර්මික ගොවිතැන පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවේ සිසුන් සඳහා මූලධර්ම හා ප්‍රායෝගික දේශන වාර කලාවැව ශ්‍රී ලංකා යුද හමුදා සේවා බළකායේ වෘත්තීය පුහුණු පාසල් මගින් මෙහෙය වන ලදී.

ආ. කන්දකාඩු යුද හමුදා ගොවිපලෙහි ජාන වැඩිදියුණු කරන ලද කිරි දෙනුන් 100 මගින් කිරි ආහාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම.

<u>**මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය**</u>

24. රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුව යුද හමුදාවට අදාල මහජන මුදල් ගිණුම්ගත කිරීම හා අනෙකුත් මූල්‍ය ක්‍රියාකාරකම් සිදුකිරීම මුදල් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වන අතර මහාභාණ්ඩාගාරය විසින් ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශය හා චක්‍රලේඛ නිකුත් කිරීම සිදුකරනු ලබයි.

25. <u>**ප්‍රධාන ක්‍රියාකාරකම් හා ඒවායේ ප්‍රගතිය**</u>. මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම වර්ෂය තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම් හා ඒවායේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

අ. වාර්ෂික ගිණුම් සැකසීම (විසර්ජන ගිණුම් සහ අත්තිකාරම් බි ගිණුම) හා විගණන ජෙනරාල් සහ අනෙකුත් අදාල රාජ්‍ය අධිකාරීන් වෙත ඉදිරිපත් කිරීම.

ආ. 2016 වර්ෂය සඳහා රාජ්‍ය අයවැයෙන් මුලධන හා පුනරාවර්තන වියදම් සඳහා වෙන්කරන ලද මුදල රු:මි: 160,000.86. 2016 වර්ෂයේ වෙන්කරන ලද අරමුදල් හා සත්‍ය වියදම සවිස්තරාත්මකව පහත සඳහන් පරිදි වේ.

| වැය ශිර්ෂය | විස්තරය | 2016 වර්ෂයේ වෙන්කිරීම් (රුපියල් මිලියන) (අ) | 2016.12.31 දිනට වියදම (රුපියල් මිලියන) (ආ) | 2016.12.31 දිනට ශේෂය (රුපියල් මිලියන) (ඇ) = (අ) – (ආ) |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | |
| 1001 -1003 | පුද්ගලික වැටුප් හා දීමනා | 121,250.19 | 117,651.84 | 3,598.34 |
| 1101-1508 | වෙනත් පුනරාවර්තන | 30,414.42 | 26,279.02 | 4,135.40 |
| | එකතුව | **151,664.60** | **143,930.86** | **7,733.74** |
| **මූලධන වියදම්** | | | | |
| 2001-2003 | මූල්‍ය වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 480.70 | 340.53 | 140.17 |
| 2101-2105 | මූල්‍ය වත්කම් අත්පත් කරගැනිම | 2,162.10 | 1,842.00 | 320.10 |
| 2401 | පුහුණු හා ශාක්‍යතා ඉහල නැංවිම | 1,100.00 | 1,102.93 | (2.93) |
| 2502 17 | වෙනත් ආයෝජන | 2,305.94 | 280.01 | 2,025.93 |
| 2502 17 | වෙනත් ආයෝජන (ණය යෝජනා) | 2,287.52 | 56.44 | 2,231.08 |
| | **එකතුව** | **8,336.26** | **3,621.90** | **4,714.35** |
| | **මුළු එකතුව** | **160,000.86** | **147,552.76** | **12,448.09** |

| අත්තිකාරම් ගිණුම් | මුදල (රුපියල් මිලියන) |
|---|---|
| උපරිම සීමාව | 2,750.00 |
| 2016.12.31 දිනට වියදම | 2,749.59 |
| ආපසු අයකර ගැනිමේ මුදල් | 2,732.28 |

සංඛ්‍යා සටහන 10.22: ජාතික අයවැය වෙන්කිරීම.

26. **<u>ක්‍රියාකාරකම් විශ්ලේශණය සහ ඇගයීම.</u>** මෙම කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් විශ්ලේශණය හා ඇගයීම පහත පරිදි වේ.

අ. 2010 වර්ෂයේ ඇස්තමේන්තුගත මුදල හා සැසඳීමේදී ශ්‍රී ලංකා යුද හමුදාව වෙනුවෙන් වෙන්කරන ලද සත්‍ය වාර්ෂික ප්‍රතිපාදන වෙන්කිරීම් ප්‍රමාණවත් නොවුනද ඒ තුළින් කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමට හැකියාව ලැබුණි.

| අ/අ | විස්තරය | 2016 වර්ෂයේ ව්‍යාපෘති සඳහා තක්සේරු මුදල (රුපියල් මිලියන) | 2016 වර්ෂයේ ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වෙනස | |
|---|---|---|---|---|---|
| | | | | (රුපියල් මිලියන) | % |
| 1 | පුනරාවර්තන | 161,577.96 | 151,893.69 | 9,684.27 | 6% |
| 2 | ප්‍රාග්ධන* | 8,910.45 | 3,150.00 | 5,760.45 | 65% |
| | එකතුව | **170,488.41** | **155,043.69** | **15,444.72** | |

* ණය සීමා වෙන්කිරීම් මෙම සංඛ්‍යා සටහනේ අන්තර්ගත නොවේ.

සංඛ්‍යා සටහන 10.23: සත්‍ය වාර්ෂික වෙන්කිරීම්.

ආ. කෘෂිකාර්මික හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය කරුණක්ව පවතී. මන්ද යත් මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරකම් තුළින් අවම වියදමකින් ශ්‍රී ලංකා කෘෂිකාර්මික හා ගොවිපල නිෂ්පාදනයට දායකවීමට හැකියාව ලැබී ඇති බැවිනි. එමෙන්ම ඔවුන් ශ්‍රී ලාංකික පරිසරය ආරක්ෂා කිරීම සඳහාද විවිධාකාරයෙන් දායකත්වය සපයා ඇත. එනම්,

(1) කෙටිකාලීන හා දිගුකාලීන වගා ව්‍යාපෘති.
(2) රුක්රෝපණ වැඩසටහන්.

ඇ. 2016 වර්ෂයේදී ක්‍රියාන්විතයේදී මියගිය හා ආබාධිතව යුද හමුදා සේවයෙන් ඉවත්කළ සාමාජිකයින් සඳහා කරන ලද ගෙවීම්, නිලධාරින් 32% කින්ද සෙසුනිල 15% කින්ද වැඩි වී ඇති බව නිරීක්ෂණය වේ. 2015 වර්ෂය හා සැසඳීමේදී වෛද්‍ය හේතුන් මත සේවයෙන් ඉවත් කළ නිලධාරි / සෙසුනිල සංඛ්‍යාවේ වැඩිවීම මිට හේතු වී ඇත.

| අ/අ | විස්තරය | 2015 | 2016 | වෙනස (රුපියල් මිලියන) | % |
|---|---|---|---|---|---|
| 1. | නිලධාරී | 1,040.39 | 1,370.55 | 330.16 | 32% |
| 2. | සෙසුනිල | 19,490.18 | 22,445.13 | 2,954.95 | 15% |
| | **එකතුව** | **20,530.57** | **23,815.68** | **3,285.11** | **16%** |

සංඛ්‍යා සටහන 10.24: ක්‍රියාන්විතයේදී මියගිය, ආබාධිත ව ඉවත් කල අයවළුන් සඳහා කරන ලද ගෙවීම්.

## විධායක ජෙනරාල් ශාඛාව

1. ප්‍රධාන මාණ්ඩලික නිලධාරී තනතුර හොබවන ලද මේජර් ජෙනරාල් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන යුද හමුදා මූලස්ථානයේ විධායක ජෙනරාල් ශාඛාවේ ආයතන ප්‍රධානි, විධායක ජෙනරාල් විසින් සියලුම පරිපාලන විෂය පථයට අදාලව යුද්ධ හමුදාධිපති වෙත වගකිව යුතු වේ.




රූප සටහන 11.1: විධායක ජෙනරාල් ශාඛාව යටතේ ඇති සංස්ථා.

2. **<u>සපුරාගත් ඉලක්කයන් සහ වාර්ෂික කාර්ය සාධනය.</u>** මෙම කාල පරිච්ඡේදය තුළදී පහත සඳහන් වැඩසටහන් සහ උත්සව විධායක ජෙනරාල් ශාඛාව යටතේ මෙහෙයවන ලදී.

අ. **<u>රණවිරු රියල් ස්ටාර් තරඟයේ V වන අදියරෙහි සම්බන්ධීකරණ කටයුතු.</u>** ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි 2016 සැප්තැම්බර් 11 දින රණවිරු රියල් ස්ටාර් V වන අදියරෙහි අවසන් මහා තරඟය සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. එහි ප්‍රථම ස්ථානය දිනාගනු ලැබුයේ ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තුවට අයත් සෙ/163263 බොම්බඩියර් පලංසූරිය පීඑම්එස්එස් විසිනි. එහි දෙවන ස්ථානය ශ්‍රී ලංකා නාවික හමුදාවේ එන්ආර්එක්ස් 2895 ලුතිතන් අමිල ලක්මාල් සිරිවර්ධන විසින් දිනාගත් අතර ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 40114 ප්‍රධාන ගුවන් භට ප්‍රසන්න සංජීව විසින් තෙවන ස්ථානය දිනා ගන්නා ලදී.

ආ. **<u>කොමන් බොන්ඩ් ව්‍යාපෘතිය (Project Common Bond).</u>** 2016 ජුලි 24 සිට 2016 අගෝස්තු 04 දක්වා ඇමෙරිකා එක්සත් ජනපදයේ පවත්වන ලද කොමන් බොන්ඩ් ව්‍යාපෘතිය (Project Common Bond) සඳහා මියගිය රණවිරුවන්ගේ දරුවන් තිදෙනකු සහභාගී කරවන ලදී. එම වැඩසටහන තුළින් දෙමාපියන් නැති දරුවන්ගේ මානසික ආතතිය අඩු කිරීමට මෙන්ම විදේශීය දරුවන් සමඟ එක්ව වැඩ කිරීමේ අවස්ථාවද ලැබුණි. එහි මූලික පරමාර්ථය වූයේ මෙම දරුවන්ගේ කුසලතා ඔප්නැංවීමයි.

ඇ. **2016 වර්ෂයේ පොදු සමා කාලය සම්බන්ධීකරණය.**

(1) 2016 පොදු සමා කාලය පළමු අධියර යටතේ 2016 ජුනි 13 දින සිට 2016 ජුලි 12 දින දක්වා කාලසීමාව තුළ වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෙසුනිල 12934 ක් සේවයෙන් ඉවත් කරන ලදී.

(2) 2016 දෙසැම්බර් 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා 2016 ට අදාල පොදු සමා කාලයෙහි දෙවන අධියර ක්‍රියාත්මක කරමින් වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිලධාරී 04 ක් සහ සෙසුනිල 4871 ක් සේවයෙන් ඉවත් කරන ලදී.

ඈ. **අධ්‍යක්ෂ මණ්ඩලවල සම්බන්ධීකරණයෙන් යුතුව මෙහෙයවන ලද ජාතික උත්සව.**

(1) **නිදහස් උත්සවය.** 2016 පෙබරවාරි 04 දින ආචාර වෙඩිමුර හා නිදහස් උත්සව පෙළපාලිය ගාලුමුවදොරදී පැවැත්වීය.

(2) **විජයග්‍රහණ සැමරුම (සංස්කෘතික සංදර්ශණය).** 2016 මැයි 16 දින බත්තරමුල්ල හිදී විජයග්‍රහණ සැමරුම මෙහෙයවන ලද අතර ඊට සමගාමීව කොළඹ නිදහස් චතුරස්‍රයේදී 2016 මැයි 18 දින 'සංහිඳියාව සඳහා පියවර' යන තේමාව ඔස්සේ සංස්කෘතික සංදර්ශණයක් පවත්වන ලදී.

(3) **බක්මහ උළෙල.** මෙය 2016 අප්‍රේල් 11 දින යුද හමුදාධිපති තුමාගේ සහභාගීත්වයෙන් මැලේවීදියේ පිහිටි ක්‍රීඩාංගණයේදී පැවැත් විය.

(4) **ජාතික වෙසක් උත්සවය.** මෙය යුද හමුදාධිපති තුමාගේ සහභාගීත්වයෙන් 2016 මැයි 21 දින සිට සතියක් පුරාවට කොළඹ ගංගාරාම විහාරය අවට වෙසක් කූඩු ප්‍රදර්ශන, වෙසක් බැති ගී සහ දන්සැල් ද සමඟ පවත්වන ලදී.

(5) **ජාතික පොසොන් උත්සවය.** මෙය යුද හමුදාධිපති තුමාගේ සහභාගීත්වයෙන් 2016 ජුනි 19 දින මහියංගණ විහාරයේදී පවත්වන ලදී.

(6) **ආරක්ෂක සම්මන්ත්‍රණය.** මෙය 2016 සැප්තැම්බර් 01 දින සිට සැප්තැම්බර් 02 දින දක්වා කොළඹ සිනමන්ගෑන්ඩ් හෝටලයේදී සාර්ථකව මෙහෙයවන ලදී.

(7) **67 වන යුද හමුදා දින සංවත්සරය.** යුද හමුදාධිපතිගේ සහභාගීත්වයෙන් 2016 ඔක්තෝබර් 10 දින 6 වන ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තු ක්‍රීඩාංගණයේදී පවත්වන ලදී.

**පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය**

3. යුද හමුදා නියෝග අනුකුලව පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, විධායක ජෙනරාල් ශාඛාව යටතේ ක්‍රියාත්මක වන අතර මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වනුයේ සෙසුනිලයින්ගේ බඳවාගැනීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා සියලු පරිපාලන කටයුතු මෙහෙයවීම, කෙඩෙට් නිලධාරින් බඳවාගැනීම, සියලු නිලයන් වෙනුවෙන් වීර පදක්කම් හා සේවා පදක්කම් පිරිනැමීම හා රාජ්‍ය හා යුද හමුදා උත්සව සංවිධානය කිරීමයි.

4. තවද පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය පිරිස් පරිපාලනය හා සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කාර්යක්ෂම මානව සම්පත් කළමණාකරණය හා බඳවාගැනීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා පිරිස් පරිපාලන කටයුතු මෙහෙයවීම, ප්‍රතිපත්ති නගාසිටුවීම හා සමාලෝචනය, සේවා සම්බන්ධීකරණය සහ රාජ්‍ය හා යුද හමුදා උත්සව සංවිධානය හා මෙහෙයවීම සම්බන්ධව වගකිව යුතු වේ.

5. **උත්සව.** 2016 ජනවාරි 01 සිට 2016 දෙසැම්බර් 31 දක්වා කාලසීමාව තුළ මෙහෙයවන ලද යුද හමුදා උත්සව සහ අනෙකුත් උත්සව පහත සඳහන් පරිදි වේ.

අ. **රාජ්‍ය උත්සව**

(1) **2016 පෙබරවාරි 04.** 68 වන නිදහස් දින උත්සවය ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහභාගීත්වයෙන් ගාලුමුවදොරදී පැවැත්විණි. මෙහිදී අතිගරු ජනාධිපතිතුමා වෙත ත්‍රිවිධ හමුදා උත්තමාචාරය ආචාර වෙඩිමුර 21කින් හා ආචාර පෙළපාලියක් මගින් දක්වන ලදී.

(2) **2016 ඔක්තෝබර් 27.** ත්‍රිවිධ හමුදාවේ වීර පදක්කම්ලාභී නිලධාරී / සෙසුනිල 8213 ක් නියෝජනය කරමින් 300 දෙනකු හට පදක්කම් ප්‍රදානය කිරීමේ උත්සවයක් කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. අතිගරු ජනාධිපති තුමා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී විය.

ආ. **බෞද්ධ ආගමික උත්සව**

(1) **2016 පෙබරවාරි 21, 22, 23.** කොළඹ ගංගාරාම විහාරස්ථානය මගින් සංවිධානය කරන ලද නවම් පෙරහැරට ශ්‍රී ලංකා යුද හමුදාව දායකත්වය සපයන ලදී.

(2) **2016 මැයි 21 සිට 25.** වෙසක් උත්සවයට සමගාමීව දියවන්නාව, කොල්ලුපිටිය වාලුකාරාමය, බෞද්ධාලෝක මාවත, මහර කඩවත, යුද හමුදා මූලස්ථානය හා සම්බෝධි විහාරය බුද්ධ රශ්මි වෙසක් කලාපයන් සඳහා පහන් කූඩු සැරසිලි හා විදුලි ආලෝකය ආදිය සපයමින් ශ්‍රී ලංකා යුද හමුදාව සිය දායකත්වය සපයන ලදී.

(3) **2016 ජුලි 23.** අනුරාධපුර ජාතික පිච්ච මල් පූජාව සඳහා අවශ්‍ය සේවා සපයන ලදී.

(4) **2016 සැප්තැම්බර් 12.** රාමාන්‍ය නිකායේ අනුනායක අති පූජ්‍ය නාඋයනේ අරියධම්ම නාහිමිගේ අවමංගල්‍ය උත්සවය රාජ්‍ය හා හමුදා ගෞරවය ඇතිව මෙහෙය වන ලද අතර රාජ්‍ය අවමංගල්‍යයකට අදාල භට පිරිස් හා අනෙකුත් සේවා සැපයීම මගින් යුද හමුදාව ස්වයකීය දායකත්වය ලබාදෙන ලදී.

ඇ. **විදේශීය රාජ්‍ය නායකයන් නියෝජිතයන් හා හමුදා නිලධාරීන් සඳහා උත්තමාචාර පෙළපාලියක් පැවැත්වීම**

(1) **2016 ජනවාරි 05 දින.** පකිස්ථාන අගමැති තුමාගේ ශ්‍රී ලංකා සංචාරයේදී ජනාධිපති ලේකම් කාර්යාලයේදී එතුමා වෙනුවෙන් උත්තමාචාර පෙළපාලියක් පවත්වන ලදී.

(2) **2016 අප්‍රේල් 27 දින.** තායිලන්ත ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිගේ ශ්‍රී ලංකා සංචාරයේදී ආරක්ෂක අමාත්‍යාංශය ඉදිරිපිට ගුවන් පථයේදී එතුමා වෙනුවෙන් උත්තමාචාර පෙළපාලියක් පැවැත් විය.

(3) **2016 අගෝස්තු 08 දින.** පකිස්ථාන ගුවන් හමුදාපතිගේ ශ්‍රී ලංකා සංචාරයේදී ආරක්ෂක අමාත්‍යාංශය ඉදිරිපිට ගුවන් පථයේදී එතුමා වෙනුවෙන් උත්තමාචාර පෙළපාලියක් පැවැත් විය.

(4) **2016 අගෝස්තු 12 දින.** නෝර්වේ අගමැතිනියගේ ශ්‍රී ලංකා සංචාරයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ආරක්ෂක අමාත්‍යාංශය ඉදිරිපිට ගුවන් පථයේදී එතුමිය වෙනුවෙන් උත්තමාචාර පෙළපාලියක් පවත්වන ලද අතර යුද හමුදාව කාල තුවක්කු වෙඩිමුර ආචාර හා සංස්කෘතික නර්තන කණ්ඩායම ලබාදීම තුළින් දායකත්වය සපයන ලදී.

(5) **<u>2016 දෙසැම්බර් 13 දින</u>.** තජිකිස්ථාන ජනාධිපති තුමාගේ ශ්‍රී ලංකා සංචාරයේදී ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිටදී එතුමා වෙනුවෙන් ත්‍රිවිධ හමුදා උත්තමාචාර පෙළපාලියක් පවත්වන ලද අතර එම උත්තමාචාර පෙළපාලියට හටපිරිස් සම්පාදනය කිරීමෙන්, කාලතුවක්කු ආචාර වෙඩිමුර 21 ක් පිරිනැමීමෙන් හා සංස්කෘතික කණ්ඩායම ලබාදීම තුළින් ශ්‍රී ලංකා යුද හමුදාව ස්වයක්‍රීය දායකත්වය ලබාදෙන ලදී.

(6) **<u>2016 දෙසැම්බර් 13 දින</u>.** පකිස්ථාන ජනාධිපතිතුමා සඳහා රාජ්‍ය රාත්‍රී භෝජන සංග්‍රහයක් 1930 පැයට ජනාධිපති නිල නිවසේදී පැවැත්වන ලද අතර එම අවස්ථාව සඳහා යුද හමුදාව, පෙරදිග තූර්යවාදක කණ්ඩායම, කාන්තා නිලධාරිණියන් 06 දෙනකුගෙන් යුත් ආසන පිළිගැන්වීමේ කණ්ඩායමක් හා විශේෂ හටපිරිස් සම්පාදනය කරන ලදී.

6. **<u>මූල්‍ය විස්තරය</u>**. මෙම වර්ෂයේ මූල්‍ය විස්තරය පහත සඳහන් පරිදි වේ:

අ. **<u>දිරි දීමනා</u>.** 2016 වර්ෂය සඳහා අදාල දිරි දීමනා ලබාගැනීම සඳහා අවශ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය ලබාදෙන ලදී.

ආ. **<u>ආබාධිතව සේවයෙන් ඉවත් කල සාමාජිකයින් සඳහා වැටුප් හා වන්දි මුදල් ලබාදීම</u>.** ත්‍රස්ථවාදී ක්‍රියාකාරකම් හේතුවෙන් ආබාධිත වූ නිලධාරී 114 ක් සහ සෙසුනිල 1915 ක් වෛද්‍ය වර්ග කිරීම් මත වන්දි වැටුප් හා දීමනා ගෙවීමෙන් අනතුරුව සේවයෙන් ඉවත් කරන ලදී.

ඇ. **<u>වන්දි ගෙවීමෙන් අනතුරුව සේවයේ රඳවා තබා ගැනීම</u>.** නිලධාරීන් 18 ක් හා සෙසුනිල 276 ක් වන්දි ගෙවීමෙන් අනතුරුව යුද හමුදාවට ආවේනික හේතූන් මත නැවත සේවයේ රඳවා තබා ගන්නා ලදී.

ඈ. **<u>යුද හමුදා සේවයේ යෙදී සිටියදී මියගිය සාමාජිකයින්ගේ යැපෙන්නන් සඳහා වන්දි පිරිනැමීම</u>.** මෙම වර්ෂය තුලදී නිලධාරී 04 ක් සහ සෙසුනිල 28 ක් යුද හමුදා සේවයේ යෙදී සිටියදී මියගිය අතර ඔවුන්ගේ යැපෙන්නන් සඳහා මාස 60 සහ මාස 120 යන අනුපාතයන්ට මහජන පරිපාලන චක්‍රලේඛ 346 හා මහජන පරිපාලන චක්‍රලේඛ 22/96 ට අනුකූලව වන්දි ලබාදෙන ලදී.

ඉ **<u>දැන්වීම් හා ප්‍රචාරක කටයුතු</u>.** 2016 වර්ෂය වෙනුවෙන් ලද මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය රුː 13,281,295.00 කි. එම මුදලින් රුː 11,344,884.44 ක මුදලක් ගෙවීම් කටයුතු සඳහා භාවිතා කල අතර වර්ෂය අවසානය වන විට ඉතිරිව පවතින මුදල රුː 1,936,410.56 කි.

ඊ. **<u>ඇගයීම් මණ්ඩල සඳහා කරන ලද ගෙවීම්</u>.** මෙම වර්ෂයේදී මේ සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රුː 2,000,000.00 කි. මෙම මුළු ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රුː 1,316,186.00 ක් ගෙවීම් කටයුතු භාවිතා කරන ලද අතර වර්ෂය අවසානයේ ඉතිරි මුදල රුː 683,814.00 කි.

උ. **<u>පදක්කම් හා පළඳනා සැකසීම</u>.** 2016 වර්ෂය සඳහා මේ සඳහා වෙන් කරන ලද මුදල රුː 500,000.00 කි. එම මුළු ප්‍රතිපාදන ප්‍රමාණයයෙන් ගෙවීම් කටයුතු සඳහා භාවිතා කරන ලද මුදල රුː 75,480.00 ක් වන අතර වර්ෂය අවසානයේ වැය ශීර්ෂයේ ඉතිරි මුදල රුː 424,520.00 කි.

ඌ. **<u>පරිවර්තන ගාස්තු</u>.** 2016 වර්ෂය සඳහා මේ සඳහා වෙන් කරන ලද මුදල රුː 200,000.00 කි. එම මුළු ප්‍රතිපාදන ප්‍රමාණයයෙන් ගෙවීම් කටයුතු සඳහා භාවිතා කරන ලද මුදල රුː 131,259.00 ක් වන අතර වර්ෂය අවසානයේ වැය ශීර්ෂයේ ඉතිරි මුදල රුː 68,741.00 කි.

එ. මෙම වර්ෂයේ සහ පසුගිය වර්ෂ කිහිපය තුල ඉහත සඳහන් වැය ශිර්ෂයන් සඳහා අරමුදල් වෙන්කිරීම ක්‍රමික අඩුවීම සහ වැඩිවීම පහත සංඛ්‍යා සටහනින් දැක්වේ.

| වර්ෂය | දැන්වීම් සහ ප්‍රචාරක | සම්මුඛ පරීක්ෂණ සහ ඇගයීම් මණ්ඩල | ප්‍රචණ්ඩකාරී තත්වයන් තුළ සිදුවන නිවාස හා දේපල හානි සඳහා ගෙවන ලද වන්දි | පදක්කම් සහ පළඳනා සැකසීම |
|---|---|---|---|---|
| 2011 | රු. 8,830,900.00 | රු. 3,150,000.00 | රු. 300,000.00 | රු. 150,000.00 |
| 2012 | රු. 10,454,053.00 | රු. 3,300,300.00 | රු. 900,000.00 | රු. 1,325,000.00 |
| 2013 | රු. 12,000,000.00 | රු. 2,200,000.00 | රු. 312,500.00 | රු. 800,000.00 |
| 2014 | රු. 15,222,650.00 | රු. 1,500,000.00 | රු. 1,026,500.00 | රු. 5,806,301.73 |
| 2015 | රු. 8,394,493.88 | රු. 891,677.50 | රු. 714.00 | රු. 400,000.00 |
| 2016 | රු. 11,344,844.44 | රු. 1,316,186.00 | - | රු. 75,480.00 |

සංඛ්‍යා සටහන 11.1: අරමුදල් වෙන් කිරීමේ ක්‍රමික වැඩිවීම් සහ අඩුවීම්.

**<u>ශ්‍රී ලංකා යුද්ධ හමුදා තූර්ය වාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

7. ශ්‍රී ලංකා යුද්ධ හමුදා තූර්ය වාදක අධ්‍යක්ෂ මණ්ඩලය 2014.07.29 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා තූර්ය වාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලය යන්වෙන් ප්‍රතිස්ථාපනය කර අංක 92 තෙලවල පාර රත්මලාන යන ලිපිනයෙහි ස්ථාපනය කොට ඇත. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරුණු වගකීම් වනුයේ යුද්ධ හමුදා රාජ්‍ය හෝ රාජ්‍ය නොවන උත්සව අවස්ථා සඳහා යුද්ධ හමුදා තූර්ය වාදක කණ්ඩායම හා නර්තන කණ්ඩායම ලබාදීම වඩා කාර්යක්ෂම හා ඵලදායි ලෙස කළමණාකරණය කිරීමයි.

8. ශ්‍රී ලංකා යුද්ධ හමුදා තූර්ය වාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සපයනු ලබන සේවාවන්:

අ. යුද්ධ හමුදා තූර්ය වාදක උත්සව බ්‍රාස් බෑන්ඩ්.
ආ. බීට් ගෲප්, අපරදිග (Oriental).
ඇ. හේවිසි වාදක කණ්ඩායම් (Orchest¾).
ඈ. නෘත්‍ය කණ්ඩායම්.
ඉ. කැලිප්සෝ වාදක කණ්ඩායම්.
ඊ. මිනි බීට් වාදක කණ්ඩායම්.
උ. පැදුර.
ඌ. සාම්ප්‍රදායික නෘත්‍ය කණ්ඩායම්.
එ. බටහිර නෘත්‍ය කණ්ඩායම්.
ඒ. හේවිසි වාදක කණ්ඩායම්.
ඔ. පයිප් වාදක කණ්ඩායම්.
ඕ. අන්ප්ලග් වාදක කණ්ඩායම්.

9. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය</u>**. මෙම කාලපරිච්ඡේදය තුල සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ:

අ. සංස්ථාවේ දැනට සිටින නිලධාරී 28 දෙනා සහ සෙසුනිල 678 දෙනාට අමතරව තවත් නිලධාරීන් 11 ක් හා සෙසුනිල 184 දෙනෙකු සඳහා අවශ්‍ය අනුමැතිය යුද්ධ හමුදා මූලස්ථානයෙන් ලබාගන්නා ලදී.

ආ. අන්ප්ලග් සංගීත කණ්ඩායම් නිර්මාණය කිරීම.

ඇ. සියලු අංග උපාංගයන්ගෙන් සමන්විත රූපලාවන්‍යාගාරයක් ස්ථාපිත කිරීම.




10. **<u>අභියෝග සහ අවධානය යොමු කල යුතු අංශ.</u>** අභියෝග සහ අවධානය යොමු කල යුතු අංශ පහත සඳහන් පරිදි වේ.

අ. ප්‍රධාන අභියෝග

(1) නිදහස් දින පෙළපාලිය.
(2) යුද්ධ හමුදා මුලස්ථානයේ නව අවුරුදු සැමරුම්.
(3) වෙසක් බැති ගීත.
(4) පොසොන් බැති ගීත.
(5) විජයග්‍රහණ පෙළපාලිය.
(6) සරඹ තරඟාවලිය.
(7) ආරක්ෂක සමුළුව.
(8) යුද්ධ හමුදා වර්ණ රාත්‍රිය.
(9) යුද්ධ හමුදා දිනය සැමරීම.
(10) යුද්ධ හමුදා නර්තනය.
(10) නත්තල් බැති ගී.
(11) වාර්ෂික ආහාර උළෙල.
(12) වාර්ෂික ක්‍රීඩා ඉසව්.
(13) විදේශ දූත කණ්ඩායම් පිළිගැනීම.
(14) විසිර යාමේ පෙළපාලිය (දියතලාව).
(15) උපාධි ප්‍රධානෝත්සවය (කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය).
(16) උපාධි ප්‍රධානෝත්සවය (භඨකාර්‍ය සම්පාදන පාසල).
(17) නිලධාරී යුද්ධ හමුදා මංගල උත්සව.
(18) නිලධාරී කණ්ඩායම් සංවත්සර සැමරීමේ උත්සව (Get-together).
(19) නිලධාරී සංවත්සර සැමරීමේ උත්සව.
(20) සේවාවනිතා වාර්ෂික රැස්වීම.
(21) විදේශ නියෝජිතයන්ගේ රාත්‍රී ආහාරය.
(22) ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සමුගැනීමේ රාත්‍රී භෝජන සංග්‍රහ.
(23) ආරක්ෂක සේනා මුලස්ථානයේ වාර්ෂික සංවත්සර සැමරුම.
(24) කෙඩෙට් නිලධාරීන්ගේ රාත්‍රී භෝජන සංග්‍රහ.

ආ. ඉහත සඳහන් සේවා සැපයීමේදී සැළකියයුතු කරුණු.

(1) ඉල්ලන ලද ප්‍රමාණයට අනුව තූර්යවාදක කණ්ඩායම් පිරිස් හා නෘත්‍ය කණ්ඩායම් පිරිස්වල හිඟකම.

(2) සංගීත භාණ්ඩ ප්‍රමාණවත් නොවීම.

(3) තූර්ය වාදක කණ්ඩායමට හා නෘත්‍ය කණ්ඩායමට ප්‍රමාණවත් ඇඳුම් කට්ටල නොමැතිවීම.

(4) ප්‍රවාහන දුෂ්කරතා.

11. **අනාගත සැලසුම්.** මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනාගත සැලසුම් පහත පරිදි වේ.

අ. ආධුනික සෙබළුන් සඳහා, ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බළකා රෙජිමේන්තු සාමාජිකයින් සඳහා, තූර්ය වාදක හා නෘත්‍ය කණ්ඩායමේ සාමාජිකයින් සඳහා නව නේවාසිකාගාර ඉදිකිරීම.

ආ. යුද හමුදාධිපති තුමාගේ නව සංකල්පයට අනුව 'ශ්‍රී ලංකා යුද හමුදා ඔකේස්ට්‍රා - 2017, ස්ථාපිත කිරීම.

ඇ. ශ්‍රී ලංකා යුද හමුදා තූර්ය වාදක කණ්ඩායම නව මුහුණුවරක් ලබාදීම.

**නීතිසේවා අධ්‍යක්ෂ මණ්ඩලය**

12. යුද හමුදාවට අදාල සියලුම නීති කරුණු පිළිබඳව කටයුතු කරනු ලබන්නේ නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලයයි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ නීති ගැටළු සම්බන්ධයෙන් යුද හමුදාධිපතිට හා යුද හමුදාවේ සෑම මට්ටමකම අණදෙන නිලධාරීන් සඳහා උපදෙස් ලබාදීමයි.

13. **ප්‍රධාන ක්‍රියාකාරකම් සහ සපුරාගත් ඉලක්කයන්.** නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.01.01 - 2016.12.31 දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

අ. යුද හමුදා ඒකක හා ආයතන 60 ක් ආවරණය වන පරිදි යුද හමුදා නීතිය සහ අදාල විෂය කරුණු සම්බන්ධ දේශන සහ වැඩමුළු මෙහෙයවීම සඳහා යුද හමුදා පුහුණු පාසල් වෙත නීති නිලධාරීන් වාර්තා කරවන ලදී.

ආ. පුරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩල විසින් ආබාධිත රණවිරුවන් සඳහා මෙහෙය වන ලද පුනරුත්ථාපන හා සුභසාධන වැඩසටහන් 08ක් සඳහා නීති නිලධාරීන් සහභාගී කරවන ලදී.

ඇ. රණසේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාන්විතයේදී මියගිය නිලධාරීන් හා සෙසුනිලයින්ගේ යැපෙන්නන් සඳහා මෙහෙය වන ලද වැඩසටහන් 08ක් සඳහා නීති නිලධාරීන් සහභාගී කරවන ලදී.

ඈ. යුද හමුදා නීති වැය ශීර්ෂය මගින් මෙම වර්ෂය තුළදී කරන ලද මූළු ගෙවීම් ප්‍රමාණයේ වටිනාකම රුः 1,159,480.00 කි.

14. **ශාක්‍යතා වර්ධන වැඩසටහන්.** මෙම වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද ශාක්‍යතා වර්ධන වැඩසටහන් පහත පරිදි වේ.

අ. ශ්‍රී ලංකා නීති සංගමය විසින් මෙහෙය වන ලද සමුළු හා වැඩසටහන් සඳහා යුද හමුදා නීති නිලධාරීන් සහභාගී කරවූ අතර ඒ තුළින් නීති ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා පිළිබඳ ඔවුන්ගේ දැනුම යාවත්කාලීන විය.

ආ. 2016.03.18 - 2016.03.20 දින දක්වා වාද්දුව බ්ලූ වෝටර් හෝටලයේදී පැවති ජාතික නීති සමුළුව 2016 සඳහා නීති නිලධාරීන් 06 දෙනකු සහභාගී කරවන ලදී.

ඇ. 2016.08.18 - 2016.08.15 දින දක්වා කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී සහ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පැවති නීති ආසියා ස්වර්ණ ජුබිලි සමුළුව සඳහා නීති නිලධාරීන් 10 දෙනෙකු සහභාගී කරවන ලදී.

ඈ. 2016.08.26 - 2016.08.28 දින දක්වා කොළඹ බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලවේදී මානව අයිතිවාසිකම් මධ්‍යස්ථානයේ හා කොළඹ විශ්ව විද්‍යාලයේ එකමුතුවෙන් මෙහෙයවන ලද පුරවැසි ප්‍රජාතන්ත්‍රවාදී මානව අයිතිවාසිකම් සමුළුව 2016 සඳහා නීති නිලධාරී 05 දෙනකු සහභාගී කරවන ලදී.

15. 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාකාරකම් පහත පරිදි වේ:

අ. ශ්‍රී ලංකා නීති සංගමය විසින් මෙහෙය වීමට නියමිත දේශීය හා ජාත්‍යන්තර වැඩසටහන් සහ සමුළු සඳහා සහභාගී වීමට උපරිම නීති නිලධාරීන් සංඛ්‍යාවක් නම් කිරීම.

ආ. නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනට ලිපිකරු රාජකාරියේ නියුතු පුද්ගලයින්ගේ පරිගණක සාක්ෂරතාව සහ ලිපිකරු රාජකාරි පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීමට ඔවුන් ඒ සඳහා වූ වැඩමුළු සඳහා සහභාගී කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

**විනයාරක්ෂක අධ්‍යක්ෂ මණ්ඩලය**

16. විනයාරක්ෂක අධ්‍යක්ෂ මණ්ඩලය විධායක ජෙනරාල් ශාඛාව යටතේ ක්‍රියාත්මක වන අධ්‍යක්ෂ මණ්ඩලයක් වන අතර යුද හමුදා පොලිස් රාජකාරි පිළිබඳ සම්පූර්ණ පාලනය සහ අණසක මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරනු ලබයි. තවද මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වනුයේ එහි සාමාන්‍ය සංස්ථාව, තාක්ෂණික තත්ත්වය, පුහුණු හා උපකරණ නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාමයි.

17. තවද මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සියලුම විනයාරක්ෂක ගැටළු සම්බන්ධව යුද හමුදාධිපතිට උපදෙස් දීමට බැඳී සිටින අතර විනයාරක්ෂක අධිකාරිය ක්‍රියාත්මක කරමින් යුද හමුදාව තුල ඉහළ විනයක් පවත්වාගෙන යාම සැබඳිව වගකිව යුතු වේ.

18. **සපුරාගත් ඉලක්කයන් හා වාර්ෂික කාර්ය සාධනය.** සළකා බලන කාලය තුළ මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සපුරාගත් ඉලක්කයන් හා වාර්ෂික කාර්ය සාධනය පහත පරිදි වේ.

අ. ශ්‍රී ලංකා යුද හමුදාව පොලිස් බළකාය විසින් වාර්තාගත සිද්ධීන් 1356 ක් පිළිබඳ පරීක්ෂණ පවත්වන ලදී.

ආ. මෙම වර්ෂය තුළදී සිදුවූ මාර්ග අනතුරු ප්‍රමාණය හා එමගින් සිදුවූ හානි පිළිබඳ විස්තර පහත පරිදි වේ:

| බලපාන හේතු | හදිසි අනතුරු සංඛ්‍යාව |
|---|---|
| යුද්ධ හමුදා රියදුරන්ගේ වැරදි | 94 |
| සිවිල් රියදුරන්ගේ වැරදි | 54 |
| යාන්ත්‍රික දෝෂ | 10 |
| මාර්ගයෙහි දෝෂ | - |
| නොවැලැක්විය හේතු | 13 |
| **එකතුව** | **171** |

| හදිසි අනතුරු ස්වභාවය | හදිසි අනතුරු සංඛ්‍යාව |
|---|---|
| නොවැදගත් | 133 |
| බරපතල | 22 |
| මාරක | 16 |
| **එකතුව** | **171** |

සංඛ්‍යා සටහන 11.2: වර්ෂය තුළ සිදු වු මාර්ග අනතුරු.

ඇ. 2016 වර්ෂයේදී පරීක්ෂණ, පීරා සෙවීම්, පාබල මුර සංචාර හා ජංගම මුර සංචාර මගින් අත්අඩංගුවට ගත් ද්‍රව්‍ය හා නිවාඩු නොමැතිව නොපැමිණි සාමාජික සංඛ්‍යාවන් පහත පරිදි වේ:

| අ/අ | අත්අඩංගුවට ගැනීම් අංක | | අංක |
|---|---|---|---|
| 1. | නිවාඩු නොමැතිව නොපැමිණීම | නිලධාරී/සෙසුනිල | 12 x 3927 |
| 2. | පතොරම් | 7.62මිමි x 39 සජීවි වට | 172 අංක |
| | | 7.62මිමි x 39 පුහුණු වට | 75 අංක |
| 3. | පුපුරණ ද්‍රව්‍ය | සි 4 | 835 ග්‍රෑම් |
| 4. | ඉන්ධන | ඩීසල් | 2130 ලී, 25 මිලි |
| | | පෙට්‍රල් | 215 ලී, 500 මිල |
| 5. | නීති විරෝධී මත් ද්‍රව්‍ය | ගංජා | 10 කිඃ ග්‍රෑම් 58 ග්‍රෑම් 259 මිලි ග්‍රෑම් |
| | | හෙරොයින් | 22 ග්‍රෑම් 305 මිලි ග්‍රෑම් |

සංඛ්‍යා සටහන 11.3: නිවාඩු නොමැතිව නොපැමිණි සහ නැවත බඳවාගත් ප්‍රමාණය (නිනොනො)

ඈ. 2016 වර්ෂයේදී මෙහෙය වන ලද පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පිළිබඳ විස්තරය පහත සඳහන් පරිදි වේ:

(1) පනාගොඩදී රියදුරු දැනුවත් කිරීමේ වැඩමුළු (සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේ හා සිවිල් පොලිසියේ සහාය ඇතිව) 18 ක් මෙහෙය වන ලද අතර ඒ සඳහා සහභාගී වූ රියදුරන් සංඛ්‍යාව 1051 කි.

(2) 2016.03.03 - 2016.03.04 දින දක්වා සහ 2016.04.05 - 2016.04.06 දින දක්වා වූ කාල පරිච්ජේද තුළ පනාගොඩ ශ්‍රී ලංකා සේවා බළකා රෙජිමේන්තු මූලස්ථානයේදී මාර්ග අනතුරු වළක්වා ගැනීම පිළිබඳ හා වාහන නඩත්තුව පිළිබඳ දෙදින වැඩමුළු සඳහා 456 x 161 ප්‍රවාහන නිලධාරීන් හා ප්‍රවාහන අංශ ප්‍රධානීන් හා රියදුරන් සහභාගී විය.

(3) ශ්‍රී ලංකා යුද හමුදා පොලිස් ඒකක මගින් ඒ ඒ ඒකකයට අදාල වගකීම් ප්‍රදේශය තුළ මාර්ග අනතුරු වළක්වා ගැනීම පිළිබඳ වැඩමුළු මෙහෙයවන ලදී. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අ/අ | ඒකකය | ස්ථානය | වැඩමුළු අංකය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | 1 ශ්‍රීලයුපොහේබ | ආසේමු (බටහිර) | 08 | නිලධාරීන් 04 ක් සහ සෙසුනිල 220 |
| 2. | 2 ශ්‍රීලයුපොහේබ | ආසේමු (නැ) | 08 | නිලධාරීන් 06 ක් සහ සෙසුනිල 310 |
| 3. | 3 ශ්‍රීලයුපොහේබ | ආසේමු (ව) | 22 | නිලධාරීන් 29 ක් සහ සෙසුනිල 708 |
| 4. | 4 ශ්‍රීලයුපොහේබ | ආසේමු (යා) | 02 | නිලධාරීන් 30 ක් සහ සෙසුනිල 323 |
| 5. | 5 ශ්‍රීලයුපොහේබ | ආසේමු (කිළි) | 24 | නිලධාරීන් 11 ක් සහ සෙසුනිල 913 |
| 6. | 6 ශ්‍රීලයුපොහේබ | ආසේමු (මු) | 04 | සෙසුනිල 84 |
| | **එකතුව** | | **68** | |

සංඛ්‍යා සටහන 11.4: මාර්ග අනතුරු වලකා ගැනීම සැබැඳිව දැනුවත් කිරීම.

ඉ. විශේෂ රාජකාරි.





ඊ. පුහුණු වැඩසටහන් සහ වැඩමුළු.



අපරාධ විමර්ශන පාඨමාලා



රියදුරු දැනුවත් කිරීමේ වැඩසටහන

19. **<u>අනාගත සැලසුම්.</u>** යුද හමුදා පොලිස් සේවා බළකායේ සංවර්ධනය සඳහා පහත සඳහන් දෑ ලබා ගැනීමට මෙම අධ්‍යක්ෂ මණ්ඩලය බලාපොරොත්තු වේ:

අ. 2017 වර්ෂයේදී පහත සඳහන් ද්‍රව්‍ය ලබාගැනීමට අවශ්‍ය අරමුදල් වෙන්කිරීමට අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කලයුතු බව යෝජනා කල හැක.

(1) සෑම යුද හමුදා පොලිස් ඒකකයක් වෙත යතුරු පැදි 03 ක් ලබාදීම.

ආ. තවද ශ්‍රී ලංකා යුද හමුදා පොලිස් ඒකක වෙත අධිකරණ වෛද්‍ය රසායනාගාර පහසුකම් ලබාදීම තුළින් පරීක්ෂණ හැකියාව සහ නව තාක්ෂණික පහසුකම් වැඩිදියුණු කිරීම:

ඇ. පහත සඳහන් පහසුකම් ලබාදීම තුළින් ශ්‍රී ලංකා යුද හමුදා පොලිසියේ පරීක්ෂණ කටයුතුවල කඩිනම් බව සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම.

(1) වීඩියෝ කැමරා 08.
(2) ඩිජිටල් කැමරා 08.
(3) පරිගණක 07.
(4) වර්ණ මුද්‍රණ යන්ත්‍ර 08.

ඈ. තවද දත්ත ක්‍රියාකරවීම අපරාධ විමර්ශන කටයුතු සිදුකර ගෙන යාම, නිවාඩු නොමැතිව නොපැමිණි අයවළුන් අත්අඩංගුවට ගැනීම, විනයාරක්ෂක ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම හා සයිබර් අපරාධ වැළැක්වීම සඳහා තොරතුරු තාක්ෂණ නිලධාරියෙකු සහ පරිගණක ක්‍රියාකරුවෙකු ලබාදීම සුදුසු බව නිර්දේශ කරනු ලබයි.

**සුභ සාධක අධ්‍යක්ෂ මණ්ඩලය**

20. ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවය කරන නිලධාරීන් හා සෙසුනිලයින්ද ඔවුන්ගේ පවුලේ සාමාජික සාමාජිකාවන්ගේද ජීවන තත්ත්වය ඉහල නැංවීමේ අරමුණින් සුභසාධන පහසුකම් සැපයීම උදෙසා 1989 මැයි 23 දින ශ්‍රී ලංකා යුද හමුදා සුභ සාධන සංගමය ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා යුද හමුදාවේ ව්‍යාප්තියත් සමග 1994 අප්‍රේල් 30දින ශ්‍රී ලංකා යුද හමුදා සුභ සාධන සංගමය, සුභ සාධක අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් නාමය සංශෝධනය කරන ලදී.

21. **ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය.** 2016 වර්ෂයේදී සුභ සාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒ ඒ අංශ වෙතින් ක්‍රියාවට නංවන ලද සුභ සාධන ව්‍යාපෘති සහ එම ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

අ. **සේවයේ නියුතු නිලධාරි / සෙසුනිලයින් වෙනුවෙන් ණය පහසුකම් ලබාදීම.** 2016.01.01 - 2016.12.31 දින දක්වා නැවත ගෙවීමට ඇති මුදලින් 5% ක ප්‍රමාණයක් අඩුකර ගෙවීමේ පහසුකම ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවයේ නියුතු සාමාජිකයින් 1786 දෙනකු ලබාදෙන ලදී.

ආ. සහනදායී මිළ ගණන් යටතේ ඉඩම් ලබාදීම.

(1) යුද හමුදා සාමාජිකයින් සඳහා සහනදායී මිළ ගණන් යටතේ රජයේ ඉඩම් ලබාදීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සම්පූර්ණ කරන ලද අතර ඒ මගින් ගම්පහ දිස්ත්‍රික්කයෙන් ඉඩම් කැබලි 95 ක් සහ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ඉඩම් කැබලි 195 ක් සකස් කරන ලදී.

(2) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි තමාගේම ඉඩමකට හිමිකම් නොකියන සේවයේ නියුතු සාමාජිකයින්ගේ හා ක්‍රියාන්විතයේදී මියගිය හා ආතුරුදහන් වූ සාමාජිකයින්ගේ යැපෙන්නන්ගේ අයදුම්පත් 1096 ක් කළුතර, රත්නපුර, අනුරාධපුර, පුත්තලම හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක වලින් ඉඩම් ලබාගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

ඇ. **යුද හමුදා සාමාජිකයින්ගේ දරුවන් සඳහා රජයේ පාසල් සහ ආරක්ෂක සේවා විද්‍යාලයට ඇතුලුවීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් වෙනුවෙන් ක්‍රියාකිරීම.** 2017 වර්ෂය වෙනුවෙන් යුද හමුදා සාමාජිකයින්ගේ දරුවන් 5722 දෙදෙනකු රජයේ පාසල් සඳහා තෝරාගත් අතර කොළඹ සහ කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාල වෙත දරුවන් 152 ක් තෝරා ගන්නා ලදී.

ඈ. **සාමාජිකයින් සඳහා රක්ෂණ ප්‍රතිලාභ සහ විශේෂ රක්ෂණ ක්‍රම හඳුන්වාදීම.** සුභ සාධන අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එක්ව මෙම වර්ෂය තුලදී ගමනා ගමන රක්ෂණයක්, පුපුරනද්‍රව්‍ය භාවිතා කරන්නන් සඳහා රක්ෂණයක්, යතුරු පැදිකරුවන් සඳහා රක්ෂණයක්, යුද හමුදා වාහන සඳහා රක්ෂණයක් හා තවත් රක්ෂණ ක්‍රම කිහිපයක් ආරම්භ කරන ලදී. ඒ සඳහා මෙම වර්ෂයේදී වෙන්කරන ලද මුළු වටිනාකම රු: 18,900,000.00 කි. මෙම වර්ෂය තුළදී මේ තුළින් නිලධාරීන් 114 ක් සහ සෙසුනිලයින් 1963 ක් ප්‍රතිලාභ ලබාගන්නා ලදී.

ඉ. **සුවසහන අරමුදල.** 2016 වර්ෂයේදී සුවසහන අරමුදල මගින් යුද හමුදා සාමාජිකයින් 5231 ක් සඳහා රු: 229,183,891.42 ක මූල්‍යමය වශයෙන් ගෙවීම් සිදු කරන ලදී.

ඊ. **ශ්‍රී ලංකා යුද හමුදා නීති ආධාර අරමුදල.** 2016 වර්ෂයේදී සාමාජිකයින් 06 දෙනකු සඳහා නීති ආධාර ලෙස රු: 1,250,000.00 ක මුදලක් ලබාදෙන ලදී.

උ. **මරණාධාර ප්‍රතිපූර්ණය.** 2016 වර්ෂයේදී සාමාජිකයින් 223 ක් සඳහා මරණාධාර ප්‍රතිපූර්ණය යටතේ ගෙවන ලද මුදල රු.12,290,000.00 කි.

22. **අනාගත සැලසුම්.** සුභ සාධක අධ්‍යක්ෂ මණ්ඩලය සුභ සාධක ක්‍රියාකාරකම් වඩාත් ක්‍රමවත්ව ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇති අතර රජය මගින් යුද හමුදා සාමාජිකයින්ගේ සුභ සාධනය වෙනුවෙන් වෙන් කරන ලද මුදල් වඩා ඵලදායී සුභ සාධන ව්‍යාපෘති සඳහා යෙදවීම ද, යුද හමුදාධිපති තුමාගේ උපදෙස් පරිදි යුද හමුදා සාමාජිකයින්ට වඩා වැඩි ප්‍රතිලාභ ලබාගැනීමට හැකි වන අයුරින් නව සුභ සාධක ව්‍යාපෘති ආරම්භ කිරීමට ද තීරණය කොට ඇත.

**රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය**

23. 2012 පෙබරවාරි 16 වන දින අතිරේක සුභ සාධක අධ්‍යක්ෂ මණ්ඩලය රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස නැවත නම් කරන ලදී. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාන්විතයේදී මියගිය හා ආබාධිත වූ නිලධාරී / සෙසුනිලයින්ගේ යැපෙන්නන්ගේ ජීවත තත්ත්වය උසස් කිරීමේ අරමුණින් විවිධ ව්‍යාපෘති ආරම්භ කොට ඇත.

24. **ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය.** රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම වර්ෂය තුළ සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් හා එහි ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

අ. 2016.01.01 - 2016.12.31 දක්වා කාල පරිච්ඡේදය තුල ක්‍රියාන්විතයේදී මියගිය හා ආබාධිත වූ නිලධාරී / සෙසුනිලයින්ගේ යැපෙන්නන් වෙනුවෙන් සපයන ලද සුභ සාධන පහසුකම් පහත පරිදි වේ.

| අ.අ. | විස්තරය | ක්‍රියාන්විතයේදී ආබාධිත වූ | ක්‍රියාන්විතයේදී මියගිය | සේවයේ නියුතු |
|---|---|---|---|---|
| 1. | ශිෂ්‍යත්ව - ආරක්ෂක අමාත්‍යාංශය (1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා) | 10 | 5 | - |
| 2. | ශිෂ්‍යත්ව - රණසේඅම (1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා) | 21 | 19 | - |
| 3. | දුම්රිය අවසරපත් | 25 | | |
| 4. | බස් අවසරපත් | 122 | | |
| 5. | 'සත්විරු සංහිද' නිවාස (ආරක්ෂක අමාත්‍යාංශය විසින් පරිත්‍යාග කරන ලදී) | 18 | 12 | 95 |
| 6. | 'සත්විරු සංහිද' අර්ධ නිවාස ගොඩනැග මේ ව්‍යාපෘතිය VI වන අධියර (ආරක්ෂක අමාත්‍යාංශය විසින් රුඃ 750,000.00 ප්‍රධානය කරන ලදී) | - | - | 166 |
| 7. | 'විරුසර' හැඳුනුම්පත් නිකුත් කිරීම I වන අධියර | 8498 | 12177 | - |
| 8. | 'විරුසර' හැඳුනුම්පත් නිකුත් කිරීම II වන අධියර | - | - | 200 |

සංඛ්‍යා සටහන 11:5 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්පාදනය කරන ලද සුභසාධන පහසුකම්.

ආ. විශ්‍රාමගිය හමුදා සාමාජිකයින්ගේ කටයුතු සංවිධානය කිරීම.

(1) බෝලගල කටාන ප්‍රදේශයේ ත්‍රිවිධ හමුදා වැඩිහිටි නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුඃ 15,562,563.91 ක මුදලක් 7 වන ස්වේච්ඡා ඉංජිනේරු රෙජිමේන්තුව වෙත ලබාදෙන ලදී.

(2) යුද හමුදාධිපති අරමුදලින් සහ ඒ ඒ රෙජිමේන්තුවලට අයත් අරමුදල් වලින්.

25. **මූල්‍ය විස්තරය.** මෙම වර්ෂය තුළ මූල්‍ය විස්තරය පහත සඳහන් පරිදි වේ.

අ. **රණවිරු නිවාස අරමුදල.** රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය මගින් 2016 වර්ෂයේදී පාලනය කරන ලද රණවිරු නිවාස අරමුදලෙහි ඉතිරිය රුː 146,349,682.24 කි. එම මුදල ආයෝජනය කර එයින් ලැබෙන පොලිය 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා පහත සඳහන් ව්‍යාපෘතිවල යොදවන ලදි:

| අ/අ | ව්‍යාපෘති | මුදල රුː |
|---|---|---|
| 1. | යුද්ධ හමුදාධිපතිගේ සංකල්පය යටතේ විශේෂ ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කිරීම I වන අධියර, II වන අධියර | 99,283,744.68 |
| 2. | ක්‍රියාන්විතයේදී මියගිය හා ආබාධිතවූ රණවිරුවන් වෙනුවෙන් නිවාස ව්‍යාපෘති | 8,100,000.00 |
| 3. | සාලාව කොස්ගම හානි වූ නිවාස අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍යතා ලබාගැනීමට ආසේමු (වන්නි) වෙත ප්‍රතිපාදන වෙන්කිරීම | 6,980,810.19 |
| 4. | සාලාව කොස්ගම හානියට පත් වූ රණවිරු ගම්මාන ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම | 466,428.00 |
| 5. | යුද්ධ හමුදාධිපති තුමාගේ උපදෙස් පරිදි පැරා ඔලිම්පික් ලෝකඩ පදක්කම දිනූ සෙ/469822 කෝප්‍රල් හේරත් එච්එම්ඩීපී සඳහා මූල්‍ය ආධාර ලබාදීම | 1,500,000.00 |
| 6. | යුද්ධ හමුදාධිපති තුමාගේ උපදෙස් පරිදි ක්‍රියාන්විතයේදී මියගිය සෙ/369591 ලා/කෝප්‍රල් ලක්මාල් එච්පී සෙබලාගේ මව වෙනුවෙන් ඉඩමක් ලබාදීම සඳහා මූල්‍ය ආධාර ලබාදීම | 1,765,504.66 |
| 7. | යුද්ධ හමුදාධිපති තුමාගේ උපදෙස් පරිදි විශ්‍රාමික නි/60323 මේජර් පීජේපී ප්‍රනාන්දු ශ්‍රීලංසිරෙ හට ඉඩමක් ලබාදීම සඳහා මූල්‍ය ආධාර ලබාදීම | 794,700.00 |
| 8. | යුද්ධ හමුදාධිපති තුමාගේ උපදෙස් පරිදි ක්‍රියාන්විතයේදී මියගිය සෙ/238683 ලා/කෝප්‍රල් මානගේ පීඑම්ඩී ගේ යැපෙන්නන් හට නිවසක් ඉදිකිරීම සඳහා මූල්‍ය ආධාර ලබාදීම | 900,000.00 |
| 9. | යුද්ධ හමුදාධිපති තුමාගේ උපදෙස් පරිදි ක්‍රියාන්විතයේදී මියගිය නි/62672 මේජර් එච්එෆ් මාර්ෂුක් ශ්‍රීලංසිරෙ ගේ යැපෙන්නන් හට නිවසක් ඉදිකිරීම සඳහා මූල්‍ය ආධාර ලබාදීම | 4,234,641.00 |

සංඛ්‍යා සටහන 11.6: රණවිරු නිවාස අරමුදල

ආ. 'රණවිරු' නිවාස අරමුදල පිලිබඳ විස්තරය.

| අ/අ | විස්තරය | මුදල රුː | |
|---|---|---|---|
| 1. | ස්ථාවර තැන්පතු සඳහා පොලිය | 2,188,356.16 | 8,753,424.64 |
| 2. | රණවිරු නිවාස අරමුදල සඳහා වැහාලේඅම මාසික දායකත්වය රුː2,400,000.00 x 12 | 2,400,000.00 x 12 | 28,800,000.00 |
| 3. | අරමුදල සඳහා මුළු ආදායම | | 37,553,424.64 |
| 4. | මුළු ගෙවීම් ශේෂය | | 9,500,000.00 |
| | **ඉතිරි මුදල** | | **28,053,424.64** |

සංඛ්‍යා සටහන 11.7: 'රණවිරු' නිවාස අරමුදල පිලිබඳ විස්තරය.

**<u>පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

26. ආබාධිත රණවිරුවන් පුනරුත්ථාපනය කිරීමේ අරමුණින් හා ඔවුන්ගේ කායික / මානසික හා සාමාජයීය තත්ත්වය ඉහල නැංවීමේ අරමුණින් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපිත කරන ලදී. මෙම පුනරුත්ථාපන ක්‍රමය තුලින් ක්‍රියාන්විතයේදී ආබාධිත වු රණවිරුවන් සඳහා ඔවුනට අවශ්‍ය උපකරණ ලබාදීම මෙන්ම ස්වාධීන විමට හා ස්වයං අධිෂ්ඨානශීලි බව ඇතිවීමට අවශ්‍ය පහසුකම් සපයනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස පහත සඳහන් ආයතන ස්ථාපිත කරන ලදී.

අ. රණවිරු සෙවණ.
ආ. රණවිරු ඇපරල්.
ඇ. අභිමංසල රණවිරු නිකේතනය 1 (අනුරාධපුර).
ඈ. අභිමංසල රණවිරු නිකේතනය 2 (කඹුරුපිටිය).
ඉ. අභිමංසල රණවිරු නිකේතනය 3 (පාන්ගොල්ල).
ඊ. රණවිරු සම්පත් මධ්‍යස්ථානය.
උ. මිහිඳු සෙත් මැදුර.

27. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය</u>.** මෙම වර්ෂය තුළදි පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය පහත පරිදි වේ.

අ. **<u>වෘත්තීය පුහුණුව</u>.** පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආබාධිත වු එක් නිලධාරියෙකු හා සෙසුනිල 231 ක් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා ප්‍රදානය කරන ලදී. එම පාඨමාලා වෘත්තීය පුහුණු අධිකාරියෙහි හා ආධුනිකත්ව පුහුණු ආයතනයේ අධීක්ෂණය යටතේ මෙහෙයවන ලදී.

ආ. **<u>පුනරුත්ථාපන සුභසාධන වැය ශිර්ෂය</u>.** 2016 වර්ෂයේදි මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ පුනරාවර්තන වියදම් සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන පහත පරිදි වේ:

| | | | |
|---|---|---|---|
| (1) | වැය ශිර්ෂ අංකය | - | 222-01-2-1204 (VII) |
| (2) | වැය ශිර්ෂ නාමය | - | පුනරුත්ථාපන සුභසාධක වැය ශිර්ෂය |
| (3) | වාර්ෂික වෙන්කිරිම් (2016) | - | Rs. 170,000,000.00 |

ඇ. **<u>ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුනරුත්ථාපන අරමුදල</u>.** ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුනරුත්ථාපන අරමුදල විසින් 2016 දෙසැම්බර් 31 වන දිනට කළමණාකරණය කරන ලද මුළු වත්කම් වල වටිනාකම රු. 67,517,445.69 කි. එය විස්තරාත්මකව පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| (1) | වාර්ෂික වියදම | - රු. 5,238,472.40 |
| (2) | ස්ථාවර තැන්පතු | - රු. 60,440,984.81 |
| (3) | ජංගම ගිණුම | - රු. 1,141,688.48 |

ඈ. **<u>සමාජ මූලික පුනරුත්ථාපනය</u>**

(1) විශේෂ ආබාධ සහිත රණවිරුවන් සාමාන්‍ය සමාජයේ හැසිරීම් රටාවට අනුගත වන තුරු සමාජ මුලික පුනරුත්ථාපන ක්‍රියාවලිය සිදුකරනු ලබයි. මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනිමට පෙර සැලසුම් කරගත් අධීක්ෂණ පද්ධතියක් මගින් අධීක්ෂණය කරනු ලැබිමෙන් අනතුරුව අවශ්‍ය ප්‍රතිකර්ම කරනු ලබයි.

(2) මෙම ක්‍රමය සාර්ථක කර ගැනීම සඳහා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පෙර සැලසුම් කරගත් පරිදි සියලුම බළඇණි මුලස්ථාන, ආයතන මුලික පුනරුත්ථාපන මුලස්ථාන හා රණවිරු ගම්මාන වල සංචාරය කරනු ලබයි.

**<u>ආධුනිකයින් බඳවා ගැනීමේ අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

28. ආධුනිකයන් බඳවා ගැනීමේ කාර්යාලය යුද්ධ හමුදා චර්යා නියෝග 18/94 ට අනුව 1994 අප්‍රේල් මස ආරම්භ කරන ලද අතර 2012 ජනවාරි 01 දින සිට යුද්ධ හමුදා චර්යා නියෝග 06/2012 ට අනුව ආධුනිකයින් බඳවා ගැනිමේ අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස ප්‍රතිස්ථාපනය කරන ලදී. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විධායක ජෙනරාල් ශාඛාව යටතේ, පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය සමග සමීප සබඳතාවයකින් යුතුව ක්‍රියාත්මක වේ.

29. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය</u>.** මෙම වර්ෂය තුළ සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් හා එහි ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

අ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට දක්ෂතා ඇති තරුණයන්ගේ අවධානය ලබාගැනීමේ අරමුණින් යුද්ධ හමුදා ආධුනිකයන් බඳවා ගැනීමේ වැඩ සටහන් සඳහා පුළුල් ප්‍රචාරණයක් ලබාදීම සඳහා 2016 ජනවාරි 01 වනදා සිට 2016 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ ආධුනිකයන් බඳවා ගැනීමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ ප්‍රදර්ශණ සහ උත්සව සඳහා සහභාගී වන ලදී.

ආ. **<u>බඳවා ගැනිමේ විස්තර - නිලධාරී (නිත්‍ය බලසේනාව)</u>.** පහත සඳහන් කාණ්ඩ යටතේ ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් ඒ ඒ රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත බඳවා ගැනීමට සහ ඔවුන්ගේ මූලික පුහුණුව ලබාදීමට අවශ්‍ය මූලික පියවරයන් ගෙන ඇත. එහි විස්තර පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| (1) | තොරතුරු තාක්ෂණ නිලධාරීන් | - 10. |
| (2) | ඉංජිනේරු නිලධාරීන් | - 13 (විශ්ව විද්‍යාල සිසුන්). |
| (3) | වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරීන් | - 08 (විශ්ව විද්‍යාල සිසුන්). |
| (4) | විශේෂඥ වෛද්‍ය නිලධාරීන් | - 03. |
| (5) | සංඥා නිලධාරීන් | - 01. |
| (6) | කෘෂිකර්ම නිලධාරීන් | - 01. |
| (7) | සංගීත කණ්ඩායම් නිලධාරීන් | - 01. |
| (8) | ඉංජිනේරු නිලධාරීන් | - 02. |
| (9) | ගිණුම් නිලධාරීන් | - 15. |
| (10) | නීති නිලධාරීන් | - 03. |
| (11) | කෙඩෙට් නිලධාරීන් (පිරිමි) | - 47 (ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය). |
| (12) | කෙඩෙට් නිලධාරීන් (ගැහැණු) | - 22 (ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය). |
| (13) | කෙඩෙට් නිලධාරීන් (පිරිමි) | - 37 (කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය). |
| (14) | කෙඩෙට් නිලධාරීන් (ගැහැණු) | - 04 (කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය). |
| | **එකතුව** | **- 168.** |

ඇ. 2016 ජනවාරි 01 වනදා සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල නිත්‍ය බලසේනාව වෙත බඳවාගත් මුළු ආධුනිකයින් සංඛ්‍යාව 6317 කි. වර්තමානයේ ආධුනිකයින් බඳවා ගැනීමේ ක්‍රමය විමධ්‍යගත කරමින් රෙජිමේන්තු මුලස්ථාන වෙත ආධුනිකයින් බඳවා ගැනීමට අවස්ථාව ලබාදීම තුලින් අනාගත අභියෝග ජයගැනීමට මංපෙත් විවර කර ඇත.

ඈ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය රත්මලාන මූලික කඳවුරෙන් ඉවත්ව 2006. 07.07 දින කොහුවල ප්‍රදේශයේ නැවත ස්ථානගත කර ඇත. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කරන ලද වී අලෙවි මණ්ඩලයට අයත් ගබඩාවක් වන අතර එහි පහසුකම් වසරක් වැනි කෙටි කාලයක් තුල වර්ධනය කල අතර දැනට එය කාර්යාල සංකීර්ණයක්, ඇඟිලි සලකුණු ලබාගැනිම සඳහා ස්ථානයක්, නිලධාරී සහ කාන්තා සෙසුනිල නවාතැන් පහසුකම්, භෝජනාගාර පහසුකම්, ගබඩා පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් වලින් සමන්විත වේ. මේ වන විට ස්නානය කිරිම සඳහා ස්ථානයක් ඉදිකරමින් පවතින අතර එය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දරණ ලද වියදම රු.7,118,235.21 කි.

30. **මූල්‍ය විස්තරය.** දැන්වීම් සහ ප්‍රචාරණ කටයුතු සඳහා වෙන්කරන ලද මුළු මුදල රු. 2,969,689.00 කි.

31. **අනාගත සැලසුම්.** මෙම අධ්‍යක්ෂ මණ්ඩලය අනාගත දැන්වීම් සහ ප්‍රචාරණ කටයුතු වැඩිදියුණු කිරීම් තුළින් බඳවාගැනීමේ පටිපාටිය වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වේ. ඒ සඳහා විද්‍යුත් මාධ්‍ය වෙත වැඩි අවධානයක් යොමු කරමින් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්මාණය කරන ලද දැන්වීම් රූපවාහිණිය/ ස්වාධීන රූපවාහිණිය හා අනිකුත් වාණිජ නාලිකා තුළ විකාශය කිරීම තුළින් ශ්‍රී ලාංකීක තරුණ ප්‍රජාවගේ අවධානය ලබාගැනීම අපේක්ෂා කරයි. ඒ අනුව 2017 වර්ෂය හා ඉදිරි වර්ෂවල ප්‍රචාරණ කටයුතු සිදුකරගෙන යාමට බලාපොරොත්තු වේ.

**<u>මානව හිමිකම් සහ මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

32. මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය සන්නද්ධ මෙහෙයුම් කාලසීමාව තුළදී ජාත්‍යන්තර නීතියට අනුකූලව මානව හිමිකම් පිලිබඳව යුද්ධ හමුදා සාමාජිකයන් දැනුවත් කිරීමේ අරමුණින් 1997 ජනවාරි 06 වන දින ආරම්භ කරන ලදී. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය 2001 නොවැම්බර් 15 වන දින මානව හිමිකම් සහ මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස නාමය වෙනස් කරන ලදී. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ තේමා පාඨය වන්නේ "සියළුම මට්ටමේ පුද්ගලයන් තේරුම් ගැනීම / අගය කිරීම හා මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුවාදී නීති කඩවීම වළක්වාලීම " යි.

33. මානව හිමිකම් සහ මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය ජාත්‍යන්තර මානුෂවාදී නීතිය හා බැඳුණු සම්මතයන්, ප්‍රතිපත්ති සහ සම්මුතිය සම්පාදනය පිලිබඳ වගකිව යුතු අතර ඒ හා අදාල පුහුණු කටයුතු අධීක්ෂණය කිරීම, ලේඛණ ගත කිරීම හා වාර්තාගත කිරීම සිදුකරනු ලබයි.

34. **ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය.** මෙම වර්ෂය තුළදී මානව හිමිකම් සහ මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය පහත පරිදි වේ.

අ. යුද්ධ හමුදා චර්යා නියෝගයන්ට අනුව මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ මාර්ගෝපදේශයට අනුකූලව ආරක්ෂක සේනා මුලස්ථාන, සේනාංක මුලස්ථාන, බලසේනා මුලස්ථාන හා බලඇණි වලට අයත් වගකීම් ප්‍රදේශ ආවරණය වන පරිදි මානව හිමිකම් අංශ ස්ථාපනය කරන ලදී. එය සංඛ්‍යාත්මකව පහත සංඛ්‍යා සටහනින් නිරූපණය වේ;

| ආසේමු | සේමු | බසේමු | රෙම | ඒකක (නිත්‍ය) | ඒකක (ස්වේච්ඡා) | වෙනත් මුලස්ථාන | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 07 | 22 | 69 | 23 | 174 | 99 | 08 | 402 |

ආ. **දෙසති වාර්තා.** දෙසතියකට වරක් රැස්වී විෂය කරුණු පිලිබඳව සාකච්ඡා කර සකසන ලද වාර්තාව ඉදිරිපත් කිරීමට සියලුම මානව හිමිකම් අංශ වෙත උපදෙස් ලබාදී ඇත. ඒ අනුව ඒකක තුල ස්ථාපනය කර ඇති මානව හිමිකම් අංශ ඒ ඒ සේනාංක මට්ටමින් බළසේනා මුලස්ථාන මට්ටමින් මානව හිමිකම් උල්ලංඝණයවීම් හා සම්බන්ධ සිද්ධීන් පිලිබඳ වාර්තා කර දෙසතියකට වරක් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි. එසේ ඉදිරිපත් කරනු ලබන දෙසති වාර්තා සමාලෝචනය කිරීමෙන් අනතුරුව ඒ ඒ ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි.

35. **පුහුණු වැඩසටහන්.** මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයවන ලද පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

අ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ මූලික පාඨමාලා 02 ක් හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ උසස් පාඨමාලා 02 ක් කුකුලේ ගඟ පිහිටි ශ්‍රී ලංකා සාමසාධක මෙහෙයුම් පුහුණු ආයතනයේදී මෙහෙයවන ලදී. එම පාඨමාලාවන්හි ඉලක්කගත කණ්ඩායම් වූයේ ත්‍රිවිධ හමුදා නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් සහ කොමිෂන් නොලත් නිලධාරීන් මෙන්ම විශේෂ කාර්ය බලකාය සහ පොලිස් නිලධාරීන්ය.

ආ. ආරක්ෂක සේනා මූලස්ථාන පුහුණු ආයතන රෙජිමේන්තු මධ්‍යස්ථාන හා ඒකකවල සේවයේ නියුතු නිලධාරී සහ සෙසු නිලයන් වෙනුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා එක්ව මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මානව හිමිකම් ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 05 ක් සංවිධානය කරන ලදී.

ඇ. තවද මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා පිටත්ව යාමට නියමිත භටපිරිස් වෙනුවෙන් කුකුලේ ගඟ ශ්‍රී ලංකා සාමසාධක මෙහෙයුම් පුහුණු ආයතනයේදී ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේද සහය ඇතිව ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ පුහුණු වැඩසටහන් 08 ක් සංවිධානය කරන ලදී.

ඈ. නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් සඳහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශිත මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ වැඩසටහන් මෙහෙයවීම උදෙසා ආරක්ෂක සේනා මූලස්ථාන, සේනාංක මූලස්ථාන, බලසේනා මූලස්ථාන, පුහුණු ආයතන, රෙජිමේන්තු මධ්‍යස්ථාන හා ඒකක වෙත ස්ථිර මානව හිමිකම් හා ජාත්‍යන්තර නීති උපදේශකවරුන් (නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන්) පත්කරන ලද අතර ඔවුන් විසින් වර්ෂය තුළදී මෙහෙයවන ලද පුහුණු පාඨමාලා ගණන 273 කි.

ඉ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රෙජිමේන්තු මට්ටමින් දින 63 හි සහතිකපත්‍ර වැඩමුළු සංවිධානය කර මෙහෙයවන ලදී.

ඊ. සුදුසුකම්ලත් නිලධාරීන් විසින් වෙනත් පුහුණු සැසි 232 ක් සඳහා මූලික කටයුතු සූදානම් කර ඇති අතර සියලුම සේනාංක මට්ටමින් ඒ සඳහා අවශ්‍ය ප්‍රචාරණය ලබාදී ඇත.

උ. 2016.12.31 දින දක්වා මෙම අධ්‍යක්ෂ මණ්ඩලව විසින් මෙහෙයවන ලද පුහුණු පාඨමාලා වලට අනුකූලව මානව හිමිකම් හා මානුෂවාදී නීති මූලධර්ම නිලධාරී සහ සෙසුනිල 52739 ක් අතර බෙදාහරින ලදි.

36. **නිර්දේශ.** නිලධාරීන් සහ සෙසුනිලයන්ගේ මානව හිමිකම් හා මානුෂවාදී නීති පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී:

අ. මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂවාදී නීති ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව යෙදි සිටින නිලධාරීන් සඳහා ඉතාලියෙහි සැන් රෙමෝ ප්‍රදේශයේ පිහිටි ජාත්‍යන්තර ආයතනයෙහි පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථාව ලබාදිය යුතුය.

ආ. මෙම ක්ෂේත්‍රයේ යෙදී සිටින නිලධාරීන් සඳහා ඉන්දියාවේ බැංගලෝර්හි පිහිටි ජාතික නීති පාසල වැනි ආයතන තුලින් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය හා සරණාගත නීතිය පිළිබඳ ඉගෙනීම සඳහා අවස්ථාව ලබාදීය යුතුය.

<u>**සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය**</u>

37. සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකලොස් දහසකට අධික සිවිල් සේවකයන්ගේ පරිපාලන කටයුතු මෙහෙයවනු ලබයි. සිවිල් පරිපාලන අධ්‍යක්ෂගේ බලතල අනුරාධපුරය, මින්නේරිය, යාපනය, කිළිනොච්චි, මුලතිව්, දියතලාව සහ කොළඹ යන ප්‍රාදේශීය කාර්යාල වෙත පවරා ඇත. යුද්ධ හමුදාවේ පවතින ඇබෑර්තු සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගැනීම, තනතුරු ස්ථිර කිරීම, මාරුකිරීම, පුහුණුව හා සංවර්ධනය, නිල උසස් කිරීම්, පෞද්ගලික ලිපිගොණු නඩත්තු කිරීම, ණය පහසුකම් ලබාදීම, දීමනා සඳහා අනුමැතිය ලබාදීම, දැනුවත් කිරීමේ වැඩ සටහන් දියත් කිරීම, විශ්‍රාම ගැන්වීම හා සුභසාධන කටයුතු මෙහෙයවීම ආදී පරිපාලන කටයුතු මෙම අධ්‍යක්ෂ විසින් මෙහෙයවනු ලබයි.

38. <u>**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය.**</u> මෙම වර්ෂය තුළදී සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය පහත පරිදි වේ.

අ. <u>**බඳවාගැනීම් (අභ්‍යන්තර/බාහිර)**</u>

(1) උද්‍යාන අලංකාරකරුවන් 10 දෙනෙකු සඳහා තිබූ ඇබෑර්තු අභ්‍යන්තර වශයෙන් 2016 නොවැම්බර් 01 වනදා සිට ක්‍රියාත්මක වන පරිදි පුරවන ලද අතර එම තෝරාගත් පුද්ගලයන් ජාතික වෘත්තිය පුහුණු ආයතනයේ සුදුසුකම්ලත් අයවළුන් වේ.

(2) ප්‍රාථමික ශ්‍රේණි සඳහා සිවිල් සේවකයන් 368 ක් බඳවා ගන්නා ලදී (සූපවේදී, භෝජනාගාර සේවක, කම්කරු, සනීපාරක්ෂක කම්කරු).

ආ. <u>**කඩඉම් විභාග සහ කාර්යක්ෂමතා විභාග.**</u> නව ආධුණිකයන් බඳවා ගැනීමේ ක්‍රමවේදයට අනුව සිවිල් සේවකයින් 538 ක් විසින් 2016 වර්ෂයට අදාල මෙම විභාගය සම්පූර්ණ කර ඇති අතර ඔවුන් සඳහා නිල උසස් කිරීම් ලබාදී ඇත.

ඇ. <u>**දැනුවත් කිරීමේ වැඩ සටහන් හා උපදේශනය**</u>

(1) උපකරණ පාලකවරුන්, විෂයභාර ලිපිකරුවන් හා සිවිල් සේවකයන් සඳහා ඔවුන්ගේ ඉල්ලීම මත සිවිල් පරිපාලන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවනු ලැබුහ. මෙම වැඩසටහන් සිවිල් පරිපාලන කටයුතු පිළිබඳ නව උපදේශ ඇතුලත් පොතක් නිකුත් කිරීමෙන් අනතුරුව සිදුකරන ලදී.

(2) සිවිල් පරිපාලන ක්‍රියාකාරකම් පිළිබඳ උපදේශණය, උපකරණ පාලක පාඨමාලා හදාරන ගබඩාපාලක පාඨමාලා හදාරන හා ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරී වැනි යුද්ධ හමුදා නිල සාමාජිකයන් 678 දෙනෙකු වෙනුවෙන් දොඹගොඩ යුද්ධ හමුදා යුධෝපකරණ පුහුණු පාසල , ස්වේච්ඡා බළකා පුහුණු පාසල - දියතලාව හා හඨකාර්ය සම්පාදන පුහුණු පාසල - ත්‍රිකුණාමලය යන ස්ථානයන්හිදී ලබා දෙන ලදී.

ඈ. <u>**පුහුණු හා සංවර්ධනය.**</u> ප්‍රාථමික, ද්විතීක හා ත්‍රිවිතික සිවිල් සේවකයන් සඳහා මානව සම්පත් කළමනාකරණ, පරිගණක, ප්‍රසම්පාදන හා නිල භාෂා පිළිබඳ පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථාව ලබාදෙන ලදී.

## <u>උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව</u>

1. උපකරණ මාස්ටර් ජෙනරාල් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සිටින ප්‍රධාන මාණ්ඩලික නිලධාරීයෙකු වන අතර උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව විසින් දුම්රිය, මාහාමාර්ග, ගුවන් හා මුහුදු මාර්ග ඔස්සේ සිදුවන පුද්ගල හා ද්‍රව්‍ය ප්‍රවාහනය පාලනය කරනු ලබයි. තවද මෙම ශාඛාව යුද්ධ හමුදා කඳවුරු හා භඨනිවාස පරිපාලන කටයුතු නවාතැන් පහසුකම් වෙන්කිරීම, සලාක සැපයීම, ප්‍රවාහන කටයුතු හා වාහන වල තත්ව පරීක්ෂා කිරීම යුද්ධ හමුදාවේ සියලුම සිවිල් ඉංජිනේරු කටයුතු හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ වගකිව යුතු වේ.




රූප සටහන 12.1: උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ ඇති සංස්ථා.

2. **<u>මූල්‍ය විස්තරය</u>**. උපකරණ මාස්ටර් ජෙනරාල් ඒ යටතේ පවතින අධ්‍යක්ෂ මණ්ඩල හතර සඳහා වෙන්කර ඇති අරමුදල් වල ක්‍රියාපටිපාටි පාලක වශයෙන් 2016.01.01 සිට 2016.12.31 දක්වා කාලය තුළ කුඩා ප්‍රසම්පාදන කමිටු මෙහෙයවන ලදී. එම කමිටු වලට අනුව ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල වල මූල්‍ය විස්තරය පහත පරිදි වේ.

| අ/අ | අධ්‍යක්ෂ මණ්ඩලය | අයදුම්පත් සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|---|
| 1. | භඨ නිවාස සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලය | 41 | 240,902,847.80 |
| 2. | ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය | 20 | 7,573,372.14 |
| 3. | සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය | 69 | 10,810,415.53 |
| 4. | ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 522 | 191,651,984.36 |
| | **එකතුව** | **652** | **450,938,619.83** |

සංඛ්‍යා සටහන 12.1: මූල්‍ය තොරතුරු

### <u>භඨ නිවාස සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලය</u>

3. භඨනිවාස සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා ඉඩම් හා ගොඩනැගිලි සැළසුම් කිරීම, මිළදී ගැනීම, කුලී පදනම මත පවරාගැනීම හා නවාතැන් පහසුකම් වෙන්කිරීම සඳහා වගකියනු ලැබේ.

4. **<u>වාර්ෂික කාර්ය සාධනය</u>.** භඨනිවාස සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වාර්ෂික කාර්ය සාධනය පහත පරිදි වේ.

අ. වාර්ෂිකව ඉඩම් සහ ගොඩනැගිලි මිලදි ගැනිම, කුලී පදනම මත ලබාගැනීම සහ නිදහස් කිරීම.

ආ. වාර්ෂික වැය ශීර්ෂ භාවිතය.

| අ/අ | වැය ශීර්ෂ විස්තරය | ප්‍රතිපාදන | අතිරේක ප්‍රතිපාදන | මුළු ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| 1. | කුලියට | 424,500,000.00 | 27,400,000.00 | 451,900,000.00 |
| 2. | ආරක්ෂක සමුළුව | 18,800,000.00 | 2,800,000.00 | 21,600,000.00 |
| 3. | නවාතැන් පහසකම් සහ වෙනත් | 800,000.00 | 13,290,298.00 | 13,290,298.00 |
| 4. | බදු | 16,000,000.00 | - | 16,000,000.00 |

සංඛ්‍යා සටහන 12.2: මෙම වර්ෂය තුළදී වැය ශීර්ෂ භාවිතය.

5. **වර්ෂය තුළ සපුරාගත් ඉලක්කයන්.** මෙම වර්ෂය තුළදී සපුරාගත් ඉලක්කයන් පහත පරිදි වේ.

අ. **ඉඩම් අත්පත් කරගැනීම.** ඉඩම් අත්පත් කරගැනීම සහ නිදහස් කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වර්ෂය තුළදී අක්කර 428.4 ක භූමි ප්‍රමාණයක් අත්පත් කර ගත් අතර රජයට අයත් ඉඩම් අක්කර 4924.88 ක් හා පෞද්ගලික අංශයට අයත් ඉඩම් අක්කර 1714.88 ප්‍රමාණයක් නිදහස් කරන ලදි.

6. **අනාගත සැලසුම්.** මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අනාගත සැලසුම් පහත පරිදි වේ.

අ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංස්ථා ව්‍යුහය වර්තමානයේදී වඩා පුළුල් වෙමින් පවතින අතර එම ව්‍යාප්තියත් සමඟ යුද්ධ හමුදාව සඳහා අවශ්‍ය භූමි ප්‍රමාණයෙහි අවශ්‍යතාවයද වැඩි වේ එම නිසා ආරක්ෂක අමාත්‍යාංශය ඉඩම් කටයුතු අමාත්‍යාංශය හා එක්ව ඉඩම් මිලදී ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාවට නැංවිය යුතු බව නිර්දේශ කල හැක.

ආ. යුද්ධ හමුදා සාමාජිකයන්ගේ නිවාඩු බංගලා සඳහා ඇති ඉල්ලුම වැඩි බැවින් නව නිවාඩු බංගලා ඉදිකිරීම සුදුසු බව නිර්දේශ කල හැක.

ඇ. නාරාහේන්පිට මැනිංටවුන් විවාහක නිල නිවාස ප්‍රමාණය සීමිත වුවද ඒ සඳහා වාර්ෂිකව ඉල්ලුම් කරන ලද ප්‍රමාණය සෑම විටම තිබෙන විවාහක නිල නිවාස ප්‍රමාණයට වඩා වැඩිය. එම හේතුවෙන් අයදුම්කරුවන් හට විවාහක නිල නිවාසයක් ලබාගැනිමට අවුරුදු 02 ක් 03 ක් බලාසිටිමට සිදු වේ එම නිසා හැකි ඉක්මනින් විවාහක නිල නිවාස සංකීර්ණයක් ඉදිකල යුතු බව නිර්දේශ කල හැක.

**<u>සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

7. සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය සාමකාලයේදී හා යුධ සමයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සැපයුම් හා ප්‍රවාහන කටයුතු පිළිබඳ වගකිව යුතු අතර ආවේක්ෂණ සේවා සැපයීමටද මෙහි වගකීමක් වේ. එම වගකීම් විස්තරාත්මකව පහත පරිදි වේ.

අ. **සැපයීම්.** ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා සලාක ඉන්ධන තෙල් හා ලිහිසි තෙල් ලබාගැනීම නිකුත් කිරීම, ගබඩාකර තබාගැනීම හා ගණන් තබාගැනීම පිළිබඳ වගකිව යුතු අතර යුද්ධ හමුදා මුලස්ථානය, ආරක්ෂක අමාත්‍යාංශය උපදෙස් අනුව නාවික හා ගුවන් හමුදා ව්‍යාපෘති අනිකුත් ආයතන සඳහා සලාක, ඉන්ධන, තෙල් හා ලිහිසි තෙල් ගෙවීමේ පදනම මත නිකුත් කිරීම.

ආ. **ප්‍රවාහන.** ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට නාවික හා ගුවන් හමුදාවට ජාතික ගොඩනැගීමේ ව්‍යාපෘති හා අනිකුත් ආයතන සඳහා යුද්ධ හමුදා මුලස්ථානය ආරක්ෂක අමාත්‍යාංශය උපදෙස් අනුව පළමු පෙළ හා දෙවන පෙළ ප්‍රවාහන පහසුකම් සැපයීම, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ බී වාහන සංචිතය නඩත්තු කිරීම.

ඇ. **<u>ආවේක්ෂණ සේවා</u>**: ආවේක්ෂණ සේවා වලට අයත් විෂයන් පහත පරිදි වේ:

(1) අවමංගල්‍ය සේවා සැපයීම
(2) ගෑස්, දර, භූමිතෙල් සැපයීම
(3) රජක කොන්ත්‍රාත් මෙහෙයවීම
(4) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ බී වාහන රියදුරන් පුහුණුව කිරීම
(5) බී වාහන රියදුරන් සඳහා රියදුරු බලපත්‍ර නිකුත් කිරීම
(6) ශ්‍රී ලංකා යුද්ධ හමුදා ලිපිකරුවන් පුහුණු කිරීම
(7) ශ්‍රී ලංකා යුද්ධ හමුදා සූප සහයකවරුන් පුහුණු කීරීම
(8) ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඒකක සඳහා සූපවේදි උපදෙස් ලබාදීම
(9) බේකරි සේවා

8. **<u>සපුරාගත් ඉලක්කයන්</u>.** මෙම වර්ෂයේදී සපුරාගත් ඉලක්කයන් පහත පරිදි වේ.

අ. **<u>සැපයීම (අදාල ආවේක්ෂණ සේවාද ඇතුළුව)</u>.** මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ සමීප අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ ශ්‍රී ලංකා යුද්ධ සේවා බළකා ඒකක 08 ක් (නිත්‍ය ඒකක - 07 සහ ස්වේච්ඡා - 01) එයට ආවේණික වූ රාජකාර් ඉටු කරමින් දළ වශයෙන් 50000 පිරිසක් සඳහා ආහාර අවශ්‍යතා අඛණ්ඩව සපයනු ලබයි (ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තුලවාසී සංයුතිය පමණක් ගණනය කිරීමට ලක් කර ඇත).

ආ. **<u>ප්‍රවාහනය</u>.** දෛනික පරිපාලන රාජකාරි සඳහා වෙන්කර ඇති පලමු පෙල වාහන වලට අමතරව මෙහෙයුම් රාජකාරි සහ පරිපාලන රාජකාරි සඳහා මෙම කාලසීමාව තුලදි අවශ්‍ය වූ අතිරේක වාහන සැපයීමට මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සමත් විය. මෙම අවශ්‍යතාවය සපුරාලනු ලද්දේ දෙවන පෙල වාහන සංචිතයේ ඇති වාහන උපයෝගි කරමින් හා සිවිල් සැපයුම් කරුවන්ගෙන් කුලී ගෙවීමේ පදනම මත ලබාගත් වාහන වලින්ය.

ඇ. **<u>ආවේක්ෂණ සේවා</u>.** යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සංකල්පයක් අනුව සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සූපවේදි බලඇණිය ස්ථාපිත කිරීම හා යුද්ධ හමුදා සේවා බළකා පාසලෙන් හා යුද්ධ හමුදා සේවා බළකා ඒකක විසින් මෙහෙයවනු ලබන ආධුනික පුහුණු පාඨමාලා හා වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා පහසුකම් සැපයීමටත් මෙම අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ලැබුණි.

9. **<u>අනාගත සැළසුම්</u>.** මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අනාගත සැළසුම් පහත පරිදි වේ.

අ. **<u>සැපයීම්</u>**

(1) හදුනාගත් විශේෂ අංශයන්හි අවශ්‍ය මූලික පහසුකම් සහිතව ගබඩා පහසුකම් වැඩිකිරීම.

(2) යුද්ධ හමුදා සේවා බලකා ඒකක තුල ඇසුරුම් කල ආහාර ද්‍රව්‍ය හා දියවීමේ අවධානමක් ඇති ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා සුදුසු ගබඩා ස්ථාපිත කිරීම.

(3) සෑම ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා ඒකකයක් තුල හා භෞමික වශයෙන් වැදගත් ස්ථානවල ඉන්ධන පොම්ප ස්ථාපිත කිරීම.

ආ. **<u>ප්‍රවාහනය</u>**

(1) යුද්ධ හමුදාවේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා ඇති වාහන ප්‍රමාණය සීමිත වීම හේතුවෙන් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කල හැක.

(අ) දීර්ඝ කාලයක් පුරාවට භාවිතා කිරීමට නොහැකිව පවතින වාහන අළුත්වැඩියා කර නැවත සේවයේ යෙදවීම

(ආ) පාවිච්චියට නුසුදුසු යැයි වර්ග කර ඇති වාහන වෙනුවට නව වාහන මිලදී ගැනීම හා කුලී ගෙවීමේ පදනම මත වාහන ලබාගැනීම.

(2) වාහන ආදේශ කිරීමේදි වෑන්, ජීප්, ට්‍රැක්ටර්, ට්‍රේලර්, යතුරුපැදි හා ජල බව්සර් සඳහා මූලිකත්වය දිය යුතුය.

(3) විශේෂ ප්‍රභූ රාජකාරි වෙනුවෙන් යෙදවීම සඳහා සුඛෝපභෝගී කාර්, වෑන්, බස් රථ හා නියාමක ජීප් රථවලින් යුත් වාහන සංචිතයක් පවත්වා ගෙන යා යුතු බව නිර්දේශ කල හැක. මන්දයත් ඒ සඳහා විශේෂ ප්‍රභූ රාජකාරි කුලී ගෙවීමේ පදනම මත ලබාගන්නා වාහන සඳහා යන වියදම අවම කර ගැනීමට හැකි බැවිනි.

(4) අනවශ්‍ය ප්‍රමාදයෙන් තොරව ඉක්මනින් සහ ඵලදායී ලෙස වාහන අළුත්වැඩියාව සහ නඩත්තු කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සංවිධානය කිරීම සුදුසු වේ.

(5) අවුරුදු 15 කට වඩා වැඩි වාහන නිරන්තරයෙන් අළුත්වැඩියා කටයුතු සිදු කල යුතු අතර ඒ සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වන බව ප්‍රත්‍යක්ෂ කරුණකි. එම නිසා එවැනි වාහන භාවිතයට නුසුදුසු බවට වර්ග කොට ඒ වෙනුවට නව වාහන ලබාගැනීම සුදුසු වේ.

ඇ. <u>**මූල්‍ය විස්තරය**</u>

(1) වාර්ෂික ඇස්තමේන්තු ගත අවශ්‍යතාවයන්ට අනුව ප්‍රමාණවත් පරිදි අරමුදල් සම්පාදනය.

(2) සැපයම්කරුවන්ගේ අඛණ්ඩ සේවයක් ලබාගැනීමේ අරමුණින් ඔවුන්ගේ බිල්පත් නිසි වෙලාවට ගෙවීම සඳහා ප්‍රධාන ගිණුම් නිලධාරියා වෙත ද්‍රවශීලී මුදල් ලබාදී තිබීම.

| අ/අ | වැය ශීර්ෂ විස්තරය | | 2016.11.30 දිනට මූල්‍ය වෙන්කිරීම් | 2016.11.30 දිනට වියදම |
|---|---|---|---|---|
| 1. | 222-01-2-1202 (i) | ඉන්ධන | 2,530.00 | 2,482.56 |
| 2. | 222-01-2-1202 (ii) | ලිහිසි තෙල් | 93.00 | 103.56 |
| 3. | 222-01-2-1203 (ii) | සලාක (නිත්‍ය) | 9,597.00 | 8,956.70 |
| 4. | 222-01-4-1203 (ii) | සලාක (ස්වේච්ඡා) | 2,290.00 | 1,416.96 |
| 5. | 222-01-2-1203 (iii) | රෝහල් සලාක | 100.00 | 88.12 |
| 6. | 222-01-2-1401 (vi) | කුලී පදනම මත ලබාගත් සිවිල් වාහන වෙනුවෙන් කරන ලද ගෙවීම් | 1,831.64 | 2,052.39 |
| 7. | 222-01-1-1401 (vii) | ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ රියදුරන් වෙනුවෙන් කරන ලද ගෙවීම් | 2.63 | 1.85 |
| 8. | 222-01-2-1403 (ii) | දැව | 54.00 | 44.01 |
| 9. | 222-01-2-1403 (iii) | ගෑස් | 713.00 | 330.90 |
| 10. | 222-01-2-1405 (iv) | රජක වියදම් | 36.60 | 37.78 |
| 11. | 222-01-1-1405 (ix) | අවමංගල්‍ය කටයුතු | 8.49 | 7.26 |
| 12. | 222-01-1-1401 (viii) | දුම් පරීක්ෂණ | 3.23 | 0.96 |

සංඛ්‍යා සටහන 12.3: මූල්‍ය විස්තරය.

<u>**ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය**</u>

10. ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය සියලුම ප්‍රවාහන අවශ්‍යතා සැළසුම් කර ප්‍රවාහනය කිරීම සහ ඒවා ප්‍රවාහනයේදී ප්‍රතිපත්තීන් අනුව ක්‍රියාත්මක වනවාදැයි සොයාබැලීම මෙන්ම පිළිවෙලින් රත්මලාන, අනුරාධපුරය සහ කන්කසන්තුරේ පිහිටි අතරමැදි කඳවුරුවල ක්‍රියාකාරීත්වය සහ එහි කාර්මික පාලනය සම්බන්ධයෙන් වගකියනු ලබයි.

11. **වර්ෂය තුළ සපුරාගත් ඉලක්කයන්.** මෙම වර්ෂය තුළ සපුරාගත් ඉලක්කයන් පහත පරිදි වේ.

අ. **දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය.** මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, ආරක්ෂක සේනා මුලස්ථාන, සේනාංක මුලස්ථාන හා රෙජිමේන්තු මුලස්ථාන සඳහා වැයශිර්ෂ වෙන්කරන ලදි එසේ වෙන්කරන ලද වැයශිර්ෂ වටිනාකම රුː 17,000,000.00 වන අතර දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය සඳහා දරන ලද මුළු වියදම රුː 13,019,337.21 කි.

ආ. නිල අවශ්‍යතා සඳහා අධිවේගී මාර්ගය භාවිතා කිරීම.

(1) වැයශිර්ෂ අංකය - 222-01-1-1101 (v)
(2) 2016 වර්ෂය සඳහා වැයශිර්ෂ වෙන්කිරීම - රු. 2,000,000.00
(3) 2016 දෙසැම්බර් 31 වන දිනට මුළු වියදම - රු. 1,690,000.00
(4) 2016 දෙසැම්බර් 31 වන දිනට වැයශිර්ෂ ඉතිරිය - රු. 310,000.00

ඇ. **නෞකා මගින් භාණ්ඩ ප්‍රවාහන අංශය.** 2016 වර්ෂයේදී විදේශ පාඨමාලා සහ සංචාර සඳහා සහභාගී වන නිලධාරී සහ සෙසුනිලයන්ගේ භාණ්ඩ නෞකා මගින් ප්‍රවාහනය කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.

ඈ. **විදේශ සංචාර අංශය.** 2008 අප්‍රේල් 28 වන දින දරන මූල්‍ය සැලසුම් අමාත්‍යාංශ චක්‍රලේක පිඉ/එෆ්එස්/01/එක්ස්එක්ස්එසක්වි අනුව විදේශ පාඨමාලා/සම්මන්ත්‍රණ/සංචාර සඳහා සහභාගී වන නිලධාරී හා සෙසු නිලයන් ගුවන් ටිකට් හා අතිරේක ගමන් මලු සඳහා ටිකට් පත් ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදී.

| විස්තරය | සහභාගී වු සංඛ්‍යාව | වියදම (රුපියල්) |
|---|---|---|
| පාඨමාලා | 1200 | 85,332,738.80 |
| සංචාර | 650 | 44,260,172.93 |

ඉ. **නිදහස් බස්/දුම්රිය ගමන් බලපත්‍ර අංශය.**

(1) **නිදහස් බස් ගමන් බලපත්‍ර.** දෛනිකව දළ වශයෙන් කිːමිː 32 ක දුර ප්‍රමාණයක් තම නිවසේ සිට සේවා ස්ථානය වෙත ගමන් කරන යුද්ධ හමුදා පිටතවාසී සාමාජිකයින් සඳහා රු. 58,616,699.40 ක වටිනාකමකින් යුත් නිදහස් බස් රථ ගමන් බලපත්‍ර නිකුත් කරන ලදී.

(2) **රාජකාරී බස්රථ ගමන් බලපත්‍ර.** පරිපාලන රාජකාරි සඳහා යුද්ධ හමුදා සාමාජිකයන්හට කිසිදු ප්‍රවාහන පහසුකමක් නොමැති අවස්ථාවන්හීදීද දිවයිනේ විවිධ ප්‍රදේශයන්ට ගමන් කිරීමට සිදුවේ. එවැනි අවස්ථාවන් වල ඔවුන් සඳහා රුː 13,095,571.00 ක වටිනාකමකින් යුත් රාජකාරී බස්රථ නිදහස් ගමන් බලපත්‍ර නිකුත් කරන ලදී.

(3) **දුම්රිය නිදහස් ගමන් බලපත්‍ර.** රාජකාරි කටයුතු සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශ වලට යාමට සිදුවන යුධ හමුදා සාමාජිකයන් සඳහා රු. 21,134,933.281වටිනාකමකින් යුත් නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කරන ලදී.

(4) **නිවාඩු දුම්රිය නිදහස් ගමන් බලපත්‍ර.** යුධ හමුදා සාමාජිකයන් හා යුද්ධ හමුදාවට යා කරන සිවිල් සේවකයන් සඳහා රු. 54,097,503.29 ක වටිනාකමකින් යුත් නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කරන ලදී.

**ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය**

12. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සියලුම ඉංජිනේරු කටයුතු හා සබැඳි තාක්ෂණික කරුණු පිලිබඳව යුද්ධ හමුදාධිපතිගේ උපදේශකයකු ලෙස ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ කටයුතු කරනු ලබයි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ඉංජිනේරු සේවා ඒකක විසින් නඩත්තු කරනු ලබන ඉංජිනේරු උපකරණ හා ගබඩාවල අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබන අතරම ඉංජිනේරු සේවා ඒකක වල රාජකාරි කටයුතු සඳහා ඇති අනාගත ඉල්ලුම පිලිබඳව අවධානය යොමු කිරීම හා මූලික ගිණුම් කටයුතු අධීක්ෂණය සිදුකරනු ලබයි. සියලුම ඉංජිනේරු කටයුතු වලට අදාල ප්‍රතිපත්ති නගාසිටුවීම, මිලදීගැනීම, නඩත්තුව, ගබඩාකිරීම, නිකුත්කිරීම හා ගබඩා ද්‍රව්‍ය ඉවත්කිරීම සම්බන්ධ ක්‍රමවේද සැකසීම, යටිතල පහසුකම් හා සබැඳි ඉදිකිරීම් කටයුතුවලදී ප්‍රමාණ සමීක්ෂණ ඇස්තමේන්තු පිලියෙළ කිරීම හා රාජකාරි ගොඩනැගිලි විශේෂිකරණය ආදී කටයුතු වලදී ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදාධිපතිගේ උපදේශකයකු වශයෙන් කටයුතු කරනු ලබයි.

13. **<u>සපුරාගත් ඉලක්කයන්.</u>** 2016 වර්ෂය තුළදී අගමැති නිල නිවස සහ කොළඹ ජාතික කෞතුකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම වැනි මහජන ව්‍යාපෘති රාශියක් සිදුකරන ලදී. ඊට අමතරව පොළොන්නරුව උද්‍යානය යටතේ පොළොන්නරුව ප්‍රදේශයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරණායක නාය යෑමෙන් අවතැන් වූවන් සඳහා නිවාස ඉදිකිරීම ආදී ව්‍යාපෘති මෙම කාලසීමාව තුළදී සිදුකරන ලදී.



පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම - කදුරුවෙල මහා විද්‍යාලය



පාසල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම -කදුරුවෙල නගර මහා විද්‍යාලය



පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම - නගර මහා විද්‍යාලය



ධර්මශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම - උණගලා වෙහෙර රජමහා විහාරය

14. **<u>වාර්ෂික කාර්‍ය්‍ය සාධනය.</u>** ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික කාර්‍ය්‍ය සාධනය පහත පරිදි වේ:

අ. **<u>සිවිල් දෙපාර්තමේන්තු සඳහා සහය දැක්වීම.</u>** ආරක්ෂක අමාත්‍යාංශය යටතේ සිදුකරන ලද කොළඹ සංවර්ධන සැලසුම, දියඇලි මෙහෙයුම් හා පිරිසිදු කිරීමේ මෙහෙයුම් වලට සහය දක්වන ලදී.

ආ. රු. මිලියන 515.5 ක වටිනාකමකට ඇස්තමේන්තු කරන ලද ජාතික සංවර්ධන ව්‍යාපෘති හා අනෙකුත් ව්‍යාපෘතීන් මෙම අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය යටතේ සිදු කරන ලද අතර රු. මිලියන 6504.56 ක් ඇස්තමේන්තු වටිනාකමක් ඇති ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතුද සිදුකරන ලදී.

15. **මූල්‍ය විස්තරය**. 2016 වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද මූල්‍ය වෙන් කිරීම් හා වියදම් පහත පරිදි වේ.

අ. 2016.10.28 වන දිනට මූලධන වෙන් කිරීම් හා වියදම් 28.10.2016.

| අ/අ | වැයශීර්ෂ විස්තරය | වෙන්කිරීම් (රුපියල් ශත) | අනුමත ටෙන්ඩර් (රුපියල් ශත) |
|---|---|---|---|
| | **පුනරුත්තාපනය කිරිමේ හා වැඩි දියුණු කිරීමේ ප්‍රාග්ධන වත්කම්** | | |
| 1. | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 109,700,000.00 | 104,101,517.96 |
| 2. | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 100,000,000.00 | 98,154,988.10 |
| 3. | බලාගාර, යන්ත්‍රෝපකරණ හා උපාංග | 3,500,000.00 | 2,267,507.74 |
| | **ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම** | | |
| 4. | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 843,000,000.00 | 783,479,994.62 |
| 5. | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 375,000,000.00 | 424,028,374.97 |
| | **එකතුව** | **1,431,200,000.00** | **1,412,032,384.39** |

සංඛ්‍යා සටහන 12.4: මූලධන වෙන්කිරීම් සහ වියදම්.

ආ. 2016.10.28 දිනට පුනරාවර්තන වෙන්කිරීම් සහ වියදම්

| අ/අ | වැයශීර්ෂ විස්තරය | ප්‍රතිපාදන රුපියල් (රුපියල් ශත) | අනුමත ටෙන්ඩර් (රුපියල් ශත) |
|---|---|---|---|
| 1. | වතුර මෝටර් අමතර කොටස් | 42,000,000.00 | 43,681,771.53 |
| 2. | ගොඩනැගිලි ඉදිකිරීම් උපකරණ | 536,138,242.00 | 413,874,326.82 |
| 3. | වතුර මෝටර් සහ ජෙනරේටර් | 23,000,000.00 | 22,003,249.84 |
| 4. | ගොඩනැගිලි නඩත්තු | 11,250,000.00 | 1,923,036.84 |
| 5. | භූමි නඩත්තු | 13,750,000.00 | 8,756,638.92 |
| 6. | විදුලිය | 1,794,500,000.00 | |
| 7. | වතුර | 700,000,000.00 | 2,198,461.34 |
| 8. | ආවේක්ෂණ සේවා | 5,100,000.00 | 1,747,656.40 |
| 9. | ඉදිකිරීම් නොවන වැඩ | 230,000,000.00 | 4,153,274.52 |
| | **එකතුව** | **3,355,738,242.00** | **498,338,416.21** |

සංඛ්‍යා සටහන 12.5: පුනරාවර්තන වෙන්කිරීම් සහ වියදම්.

16. **නිර්දේශ.** අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායිතාව හා කාර්‍යක්ෂමතාවය වැඩිකිරීම සඳහා පහත නිර්දේශයන් ඉදිරිපත් කල හැක.

අ. ප්‍රධාන මූල්‍ය වැඩකටයුතු සැලසුම් කිරීමට හා මෙහෙයවීම සඳහා මධ්‍ය සැලසුම් උපදේශක අංශයක් ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ස්ථාපිත කල යුතුය.

ආ. නව ජාල පද්ධතියක් නිර්මාණය කිරීම තුලින් ඉංජිනේරු සේවා ඒකක තුල ඇති තොග ප්‍රමාණය හා ඒවායේ රාජකාරී කටයුතු අධීක්ෂණය හා සියලුම මූලද්‍රව්‍ය ඵලදායි ලෙස පරිහරණය කිරීමට හැකිවීම.

ඇ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ උන්නතිය උදෙසා ඉංජිනේරු ව්‍යාපෘති සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම.

ඈ. වෘතිකයන් සඳහා උපරිම ආරක්ෂාව හා රැකවරණය ලබාදීම උදෙසා ඉදිකිරීම් භූමි වලට නව ආරක්ෂක පද්ධතියක් හඳුන්වා දීම.

## යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය තොග හා උපකරණ නියමිත ප්‍රමාණයෙන් නියමිත තත්ත්වයෙන් නියමිත වේලාවට නියමිත තැනට සැපයීම සඳහා යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව වගකිව යුතුය. එම වගකීම ඉටුකරනු වස් යුධෝපකරණ සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලය හා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවට සහාය දෙනු ලබයි. තවද මෙම ශාඛාව ඒ යටතේ පවතින අධ්‍යක්‍ෂ මණ්ඩලවලට අයත් පර්යේෂණ හා සංවර්ධන කටයුතු හා සබැඳි මාණ්ඩලික සම්බන්ධිකරණ ආයතනයක් වශයෙන් කටයුතු කරන අතර මෙම අධ්‍යක්‍ෂ මණ්ඩලය හා ප්‍රධාන මාණ්ඩලික ශාඛාව හා සමීප සම්බන්ධතාවයෙන් යුතුව කටයුතු කරනු ලබයි.




රූප සටහන 13:1 යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ ඇති සංස්ථා.

2. **සපුරාගත් ඉලක්කයන්.** මෙම වර්ෂය තුළ සපුරාගත් ඉලක්කයන් පහත පරිදි වේ:

අ. **යුද්ධ හමුදා කර්මාන්ත ශාලා ව්‍යාපෘති.** දොඹගොඩ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකා කර්මාන්ත ශාලාවට හා කොස්ගම ශ්‍රී ලංකා විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරු කර්මාන්ත ශාලා සංස්ථාවට අදාල සියලුම කටයුතු සම්බන්ධීකරණය කරන ලද්දේ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව විසිනි.

ආ. **ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘති.** සතිපොල ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීම ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලද්දේ විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්‍ෂ මණ්ඩලය විසිනි.

ඇ. **සාම සාධක රාජකාරී සඳහා අවශ්‍ය උපකරණ සැපයීම.** යුධෝපකරණ අධ්‍යක්‍ෂ මාණ්ඩලය හා සම්බන්ධිකරණය ඔස්සේ අනෙකුත් අමාත්‍යාංශ උපදෙස් අනුව සාමසාධක රාජකාරී සඳහා අනුයුක්ත කිරීමට, නියමිත හට පිරිස් වල ප්‍රවාහන අවශ්‍යතා සැපයීම සඳහා වාහන මිලදී ගැනීම හා අවශ්‍ය අනෙකුත් උපකරණ ලබා ගැනීම සබැඳි කටයුතු සිදුකරන ලදී.

3. **සාමාන්‍ය කාර්ය සාධනය**

අ. 2016.01.01 සිට 2016.12.31 කාලය දක්වා යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව විසින් පහත සඳහන් පැවරුම් මෙහෙය වනු ලැබිය.

(1) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු - 24.
(2) කුඩා ප්‍රසම්පාදන කමිටු - 47.

ආ. 2016 වර්ෂය වෙනුවෙන් යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශඛාව සඳහා වෙන්කරන ලද අරමුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කල ප්‍රමාණයට වඩා අඩු වේ. එම නිසා විවිධ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ඒ කෙසේ වුවද යුද්ධ හමුදා ආයතන වල අත්‍යවශ්‍ය ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා සැපයීමට මෙම ශාඛාව සමත් විය.

ඇ. යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව හා ඒ යටතේ ක්‍රියාත්මක අධ්‍යක්‍ෂ මණ්ඩල විසින් ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාවට නැංවීම තුලින් ප්‍රතිපාදන නැවත බැර වීම වළක්වාලීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබිය.

4. **මුල්‍ය විස්තරය**. මුල්‍ය විස්තරය පහත සඳහන් පරිදි වේ:

| අ/අ | වැයශිර්ෂ | වැය ශිර්ෂ විස්තරය | මුළු වාර්ෂික ප්‍රතිපාදන (රුපියල් මිලියන) | මුළු වියදම (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| 1. | 222-01-2-1302 (iii) | බැරැක්ක නඩත්තු | 14.450 | 16.94 |
| 2. | 222-01-2-1205(xxiv)<br>222-01-4-1205(xxiv) | සනීපාරක්ෂක සහ පිරිසිදු කිරීමේ උපකරණ 11.69 + 2.53 = 14.22 | 15.00 | 14.22 |
| 3. | 222-01-2-1405(xx) | තක්සේරු මණ්ඩල ගාස්තු සහ පහසුකම් සඳහා වටිනාකම | 6.00 | 3.62 |
| 4. | 222-01-3-2103(i)a | බලාගාර සහ යන්ත්‍රෝපකරණ | 472.95 | 540.34 |
| 5. | 222-01-3-2103(vii) | භටපිරිස් වෙනුවෙන් පහසුකම් | 16.72 | 17.46 |

සංඛ්‍යා සටහන 13.1: මුල්‍ය විස්තරය.

**යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය**

5. යුද්ධ හමුදා මුලස්ථානය තුළ 1980 වර්ෂයේදි යුධෝකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපිත කරන ලද අතර එය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ සියලුම යුධෝපකරණ වල කාර්මික ක්‍රියාකාරීත්වය පිළිබඳ වගකිව යුතු වේ. මූලික වශයෙන් එය යුද්ධ හමුදා මුලස්ථානයේ භටකාර්ය සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන අතර එය විදේශීය හා දේශීය හා වරාය යුධෝපකරණ හා මුල්‍ය අංශයකින් සමන්විත වේ.

6. යුද්ධ හමුදා මුලස්ථානයේ නැවත සංවිධානය ගත වීම හා ප්‍රධාන මාණ්ඩලික ශාඛා ස්ථාපිත කිරීමත් සමඟ යුධෝකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ ස්ථාපිත කරන ලදි. ඒ අනුව යුධෝකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ සංස්ථාවද නව්‍යකරණය කරන ලද අතර වර්තමානයේ එම අනුමත සංස්ථාවට නිලධාරීන් 17 ක් සහ සෙසුනිල 217 ක් අයත් වේ. එමෙන්ම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සැපයුම්, ප්‍රසම්පාදන, ප්‍රගති, විධායක, වරාය යුධෝපකරණ මුල්‍ය හා තොරතුරු තාක්ෂණ යන අංශ වලින් සමන්විත වේ.

7. **වාර්ෂික කාර්ය සාධනය**. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වාර්ෂික කාර්ය සාධනය පහත පරිදි වේ.

අ. දොඹගොඩ යුධෝපකරණ කර්මාන්ත ශාලාවේ වැඩි දියුණු කිරීම් කටයුතු වලින් අනතුරුව 2014 සැප්තැම්බර් 01 වනදා යුද්ධ හමුදාධිපති විසින් විවෘත කරන ලදී. 2016 වර්ෂය තුළ නිෂ්පාදනය කරන ලද ද්‍රව්‍ය පහත සඳහන් වේ. රුඃ 242,125,316.00 ක වෙළඳපොල වටිනාකමකින් යුතු භාණ්ඩ මෙම යුධෝපකරණ කර්මාන්ත ශාලාව විසින් නිපදවන ලද අතර ඒ සඳහා දරන ලද නිෂ්පාදන වියදම රුඃ 114,278,024.41 කි. ඒ අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදවට රුඃ 127,914,611.59 ක මුදලක් ඉතිරි කර ගැනීමට හැකියාව ලැබිණි.







ආ. **භය නිවාස උපකරණ මිනුම් ක්‍රමයක් හඳුන්වා දීම.** යෝජිත නව භය නිවාස උපකරණ මිනුම් ක්‍රමයක් ක්‍රියාවට නංවන ලද අතර මෙම මිනුම් ක්‍රමය මගින් සියළුම යුද්ධ හමුදා ආයතන සඳහා අවශ්‍ය භය නිවාස උපකරණ අවශ්‍ය ප්‍රමාණයෙන් රඳවා ගැනීමට හා වාර්ෂික යුද්ධ හමුදා අවශ්‍යතා පිලිබඳ පූර්ව නිගමනයකට එළඹීමෙන්ම ස්ථාවර ලෙස වාර්ෂික ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරගෙන යාමට හැකියාව ලැබේ.

ඇ. **පතරොම් නැවත පිරවීම.** ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පුහුණු කටයුතු හා ආචාර වෙඩිමුර සඳහා භාවිතා කරන ලද තෝරාගත් සුළු අවි පතරොම් පිරවීමේ ව්‍යාපෘතිය, පතරොම් මිලදී ගැනිම සඳහා වෙන්කරන ලද මහජන මුදල් ඉතිරි කරදීමට ඉවහල් වේ.

ඈ. **රෙදිපිලි සැපයීම.**

(1) 2016 වර්ෂයේ භයපිරිස් වෙනුවෙන් අවුරුද්දක කාලයක් සඳහා හදිසි අවස්ථාවකදී ප්‍රයෝජනයට ගැනීම උදෙසා අතිරේක රෙදිපිලි තොගයක් තබා ගැනීම සඳහා යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදී. මෙම වර්ෂයේ නිල ඇඳුම් හා රෙදිපිලි සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලසුමෙන් 90% ක ප්‍රමාණයක් සම්පූර්ණ කරන ලදී. එමෙන්ම යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් පරිදි නිලධාරී හා සෙසු නිල වාර්ෂික නිකුතුව 2016 පෙබරවාරි 28 ට ප්‍රථම නිකුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

(2) නිලධාරී හා සෙසුනිලයන් වෙනුවෙන් ශාරීරික පුහුණු අවස්ථාවේදි භාවිතා කිරීම සඳහා නව කොට කලිසමක් නිර්මාණය කිරිමට අවශ්‍ය මූලික කටයුතු සිදුකරන ලදී.

(3) 2016 වර්ෂයේදි වාර්ෂික නිකුතුව සමඟ නිලධාරීන් සඳහා උසස් වර්ගයේ ශාරීරික පුහුණු සඳහා භාවිතා කරන සපත්තු නිකුත් කරන ලද අතර නිලධාරීන් සඳහා නිකුත් කිරීමට නියමිත ටී - ෂර්ට් වල ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කර 2017 වාර්ෂික නිකුතුවෙන් ඔවුන්ට ලබාදීම.

ඉ. ඉහත දැක්වූ කරුණු වලට අමතරව යුධෝපකරණ සැපයුම් ක්‍රමයේ හා යුද්ධ හමුදාවේ අනෙකුත් කාර්මික ක්‍රියාකාරකම්වල ඵලදායිතාව කාර්යක්ෂමතාව ඉහල නැංවීම සඳහා 2016 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවන ලදී.

8. **යුධෝපකරණ පරීක්ෂණ හා තොග ගණන් කිරීමේ ක්‍රියාවලිය**

අ. සියලුම ආරක්ෂක සේනා මූලස්ථාන, බලසේනා මූලස්ථාන, බලඇණි, යුධෝපකරණ ඒකක හා සියලුම යුද්ධ හමුදා ආයතන තුල යුධෝපකරණ පර්යේෂණ හා තොග ගණන් කිරීමේ කටයුතු සිදුකරන ලද අතර එමගින් වගකිව යුතු පාර්ශවයන් හා තොග භාරකරුවන් විසින් පවත්වාගෙන යනු ලබන ලෙජර්, ගිණුම් තැබීමේ පොත් ආදිය නියමිත තත්ත්වයෙන් පවත්වාගෙන යන්නේද පිලිබඳ පරීක්ෂාවට බඳුන් කරන ලදී. මෙම තොග ගණන් කිරීමේ හා පරීක්ෂා කිරීමේ දි යම් යම් අඩුපාඩු නිරීක්ෂණය කල අතර ඒ සඳහා වගකිව යුතු ස්ථාන දැනුවත් කර එම අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. මාණ්ඩලික ප්‍රධානීගේ පරීක්ෂණයට පෙරාතුව සියලුම රෙජිමේන්තු මට්ටමින් ප්‍රාථමික පරීක්ෂණ කටයුතු සිදුකල අතර සියලුම වගකිව යුතු පුද්ගලයන් යුද්ධ හමුදා නියෝග 9/50 හා අනෙකුත් අදාල යුද්ධ හමුදා නියෝග හා උපදෙස් ප්‍රකාරව නිවැරදිව තොග තබාගැනීම හා ගිණුම් කටයුතු පවත්වාගෙන යාම පිලිබඳ උපදෙස් ලබාදෙන ලදී.

ආ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ තොග ගණන් කිරීමේ කණ්ඩායම සියලුම යුධෝපකරණ ස්ථාන වල තොග ගණන් කිරීමට සමත් විය. ගිණුම් කටයුතු බොහෝමයක් තොග ගණන් කිරීම් කටයුතු ආධාර කර ගනිමින් යාවත්කාලීන කරන ලදී. තවද වත්කම් කලමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහය ඇතිව මූල්‍ය රෙගුලාසිවලට අනුව වාහන අමතර කොටස් හා අතරමග සාමාන්‍ය ගබඩා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ඈ. ඒ ඒ රෙජිමේන්තුවල කාර්මික ක්‍රියාකාරීත්වය, ඵලදායිතාව හා කාර්යක්ෂමතාව වැඩිකිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

(1) යුධෝපකරණ රෙජිමේන්තු විසින් ආරක්ෂක සේනා මූලස්ථාන මට්ටමින් යුද්ධ හමුදා නියෝග 9/50 හා මූල්‍ය රෙගුලාසිවලට අනුව පුහුණු වැඩසටහන් මෙහෙයවීම තුළින් තොග ගබඩා සමඟ කටයුතු කරන සියලුම රෙජිමේන්තු වලට අයත් පුද්ගලයින්ගේ දැනුම වර්ධනය කිරීමට පියවර ගන්නා ලදී.

(2) පතරොම් ආරක්ෂා කිරීම හා කල්තබාගැනීම් හා සියලුම ආරක්ෂක සේනා මට්ටමින් අනුගමනය කලයුතු අවි/ පතරොම් භාරදීම් භාරගැනීම් ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මධ්‍යම අවි ගබඩාව විසින් මෙහෙයවන ලදී.

(3) මධ්‍යම අවි ගබඩාව විසින් පතරොම් ආරක්ෂාකර ගැනීම හා කල්තබා ගැනීම පිළිබඳ වැඩසටහන් අඛණ්ඩව සිදුකරන ලදී.

ඇ. <u>**පතරොම් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය.**</u> සියලුම ආරක්ෂක සේනා මූලස්ථාන වගකීම් ප්‍රදේශය ආවරණය වන පරිදි 2016 වර්ෂය තුළදී පතරොම් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් සිදුකරන ලද අතර පතරොම් කාර්මික නිලධාරීන් විසින් නැවත පිරවිය නොහැකි පතරොම් හා පුපුරණ ද්‍රව්‍ය සැලකිය යුතු ප්‍රමාණයක් විනාශ කරන ලදී.

ඉ. <u>**යුධෝපකරණ විශේෂීකරණය.**</u> යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවේ අනුමැතිය සහිතව කණ්ඩායම් අතර පසුගිය වසරේ බෙදාදෙන ලද විශේෂීකරණ පොත යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. තවද ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ගුණාත්මක භාණ්ඩ මිලදීගැනීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් ප්‍රමාදය අවමකොට ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා එම විශේෂීකරණ පොත අනිකුත් යුධෝපකරණ රෙජිමේන්තු වෙත බෙදාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ඊ. <u>**අවි තොග ලැයිස්තු කළමණාකරණය පරිගණක ගතකිරීම.**</u> පසුගිය වසරේ මධ්‍යම අවි ගබඩාව විසින් අවි තොග ලැයිස්තු ගතකිරීම පිළිබඳ නව පරිගණක ගත වැඩසටහන් හඳුන්වාදුන් අතර සුළු අවි පිළිබඳ දත්ත පරිගණක ගතකිරීම සම්පූර්ණ කරන ලදී. අනාගතයේදී තිබෙන සියලුම අවි පිළිබඳ දත්තයන් පරිගණක ගතකිරීමට මධ්‍යම අවි ගබඩාවට හැකියාව ලැබෙනු ඇති අතර මෙම පද්ධතිය මගින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තිබෙන අවි තොග ප්‍රමාණයන් ගණන් කිරීමට හා ඒවායේ ඇති ගුණාත්මකභාවය පිළිබඳ පහසුවෙන් අධීක්ෂණය කිරීමේ අවකාශ ලැබෙනු ඇත.

උ. <u>**ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී පාරිභෝගික බලය භාවිතා කිරීම**</u> මාර්ගෝපදේශනයේ මාර්ගෝපදේශ 8:11 උපා/ස අනුව කාර්යසාධක වග කරුවන් වශයෙන් රුඃ 47,771,162.70 අය කරගැනිමටත් රුඃ 18,677,098.61 මුදලක් ප්‍රමාදවීමේ ගාස්තු ලෙස රාජ්‍ය අයවැයට බැර කිරීමත් සිදුවිය. මෙම නිවාරක ක්‍රියාකාරකම් හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව වඩා යථාර්තවාදි හා ප්‍රායෝගික කැපීපෙනෙන වර්ධනයක් දැකගත හැක.

| අ/අ | කණ්ඩායම් | බැඳීම් ප්‍රකාශ (රු) | ප්‍රමාද ගාස්තු (රු) |
|---|---|---|---|
| 1. | කණ්ඩායම 1 | 880,941.00 | 5,504,283.31 |
| 2. | කණ්ඩායම II | 211,782.00 | 3,033,457.47 |
| 3. | කණ්ඩායම III | 446,000.00 | 339,800.00 |
| 4. | කණ්ඩායම IV | 1,225,750.70 | 4,735,544.37 |
| 5. | කණ්ඩායම V | 57,200.00 | 2,688,704.50 |
| 6. | කණ්ඩායම VI | 1,946,489.00 | 2,375,308.96 |
| | **එකතුව** | **4,771,162.70** | **18,677,098.61** |
| | **මුළු එකතුව** | | **23,448,261.31** |

සංඛ්‍යා සටහන 13.2: ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී පාරිභෝගික බලය ක්‍රියාවට නැංවීම.

9. **මූල්‍ය විස්තරය.** වැය ශිර්ෂ අරමුදල් සඳහා මෙහෙයුම් පාලන කළමණාකරණය:

අ. යුධෝපකරණ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ මෙහෙයුම් පරිපාලන / ප්‍රසම්පාදන වගකීම් යටතේ ප්‍රතිපාදන වෙන්කිරීම් හා වියදම් සාරාංශය පහත පරිදි වේ.

| | වාර්ෂික ප්‍රතිපාදන | මුළු වියදම | බැදීම් මුදල | බැදීම් මුදල සමග මුළු වියදම | % |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන | 6,421,253,191.66 | 5,707,297,838.91 | 2,122,215,076.06 | 7,829,512,914.97 | 225.85 |
| මූලධන | 5,098,177,520.89 | 1,517,469,826.21 | 1,646,627,992.06 | 3,164,097,818.27 | 62.06 |
| මුළු එකතුව | **11,519,430,712.55** | **7,224,767,665.12** | **3,768,843,068.12** | **10,993,610,733.24** | **95.44** |

සංඛ්‍යා සටහන 13.3: වැය ශිර්ෂ අරමුදල් සාරාංශය.

ආ. වැය ශිර්ෂ අරමුදල ආර්ථික වශයෙන් වඩා ඵලදායී ලෙස භාවිතා කරන ලද අතර ඊට අදාල වවුචර් පත් ඉදිරි කටයුතු සඳහා මුදල් අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

10. **තොග භාණ්ඩ නිදහස් කරගැනීම.** මෙය යුධෝපකරණ අධ්‍යක්‍ෂ මණ්ඩලයෙන් පවරාගත් තවත් එක් ප්‍රධාන වගකීමක් වේ. ගුවනින් හා නැව් වලින් ලද සියළුම භාණ්ඩ හා තොග ප්‍රමාදයකින් තොරව නිදහස් කර ගන්නා ලදී. නැව් භාණ්ඩ 408,156.60 Kg හා ගුවන් භාණ්ඩ 5201 Kg ක් ආදාළ ගුවන් තොටුපලවල් හා වරායන් මගින් නිදහස් කරගන්නා ලදී.

11. **අනාගත සැලසුම්.** මෙම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනාගත සැලසුම් පහත පරිදි වේ:

අ. 2017 වර්ෂයේදි ආරම්භ කිරීමට නියමිත ව්‍යාපෘති.

(1) මේස් නිෂ්පාදන අංශය.
(2) ටයර් පිලියම් කිරීමේ අංශය.
(3) LED විදුලි බුබුළු නිෂ්පාදන අංශය.
(4) පතරොම් පෙට්ටි නිෂ්පාදන අංශය.

ආ. **බාධක**

(1) **කාලය පිළිබඳ ගැටලු**. කාලය පිළිබඳ මෙන්ම විදුලිබල සැපයුම සබැඳි නිෂ්පාදන කටයුතු අඩපණ වීම සඳහා බලපෑ අතර විදුලි ජනක යන්ත්‍රවල අවශ්‍යතාවය පිළිබඳ යුද්ධ හමුදා මුලස්ථානය දැනුවත් කර ඇත.

(2) මෙහෙයුම් කාලසීමාවන්, නිෂ්පාදන අංශයන් නිපදවෙන දූෂිත වායුව නිසාවෙන් ඇතිවිය හැකි සෞඛ්‍ය ගැටළු වළක්වාලීම සඳහා වායුව පිටකරන විදුලි පංකා 16 ක් සවිකිරීම අත්‍යාවශ්‍ය කරුණකි. දැනට එවැනි විදුලි පංකා 08 ක් ලැබී ඇති අතර ඉතිරිය ලබාගැනීම සඳහා අරමුදල් අවශ්‍ය වේ.

(3) පුහුණු වෘත්තිකයන්ගේ හිඟකම.

12. **නිර්දේශ.** අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ඵලදායිතාව හා කාර්‍යක්‍ෂමතාව වර්ධනය කිරීම සඳහා පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කල හැක.

අ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකා රෙජිමේන්තුවල කාර්මික ක්‍රියාවලීන් වඩා කාර්‍යක්‍ෂමව ඉටුකරගැනීම සඳහා නිලධාරී සහ සෙසුනිල ඇබෑර්තු පිරවීම.

ආ. රාගම මූලික යුධෝපකරණ ගබඩාව ඉදිකිරීම හා අනෙකුත් පහසුකම් ස්ථාපනය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ඉක්මනින් ලබාදීම.

ඇ. මූලික යුධෝපකරණ ගබඩාව සඳහා කන්ටේනර් 02 (40') ක්ද වේයන්ගොඩ රෙදිපිළි ගබඩාව සඳහා කන්ටේනර් 01 (40') ක්ද ලබාදීම තුළින් භාණ්ඩ තොග සියලුම යුධෝපකරණ රෙජිමේන්තු වෙත නිසි වේලාවට ලබාදීම හා දීපව්‍යාප්ත යුධෝපකරණ සැපයුම ක්‍රමවත් කිරීම.

ඈ. රාගම මූලික යුධෝපකරණ ගබඩාවේ හා වේයන්ගොඩ රෙදිපිළි ගබඩාව තුල තත්ව පරීක්‍ෂණ අංශයක් ස්ථාපිත කිරීම.

ඉ. ආරක්‍ෂක සේනා මූලස්ථාන මට්ටමේ සුදුසු ස්ථානවල පතරොම් ගබඩා ඉදිකිරීම මඟින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සතුව දැනට විශාල ප්‍රමාණයේ පවතින මිලියන ගණන් වටිනා පතරොම් ගබඩා කිරීම.

<u>**විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්‍ෂ මණ්ඩලය**</u>

13. ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරුවන් සන්නද්ධ වාහන, විද්‍යුත් හා විදුලි උපකරණ, සාමාන්‍ය භාවිතය සඳහා ඇති වාහන, අවි, සුළු අවි, වායුසමීකරණ උපකරණ, අවශ්‍ය උපකරණ, ජීව විද්‍යාත්මක උපකරණ ආදිය අළුත්වැඩියාව හා නඩත්තු කිරීම මගින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට වඩා කාර්යක්‍ෂම ඉංජිනේරු සේවා සහයක් ලබාදෙනු ලබයි. මීට අමතරව ශ්‍රී ලංකා විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරුවන්, යකඩ ඇඳන්, කම්බි, පුටු ආදිය වානේ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබන අතර සති පොළවල් ඉදිකිරීම, බස් නැවතුම් පොළවල් ඉදිකිරීම වැනි ජාතික ගොඩනැංවීමේ ව්‍යාපෘති සඳහා සක්‍රිය දායකත්වය ලබාදෙනු ලබයි.

14. **සපුරාගත් ඉලක්කයන්.** 2016 වර්ෂයේ විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරුවන් සපුරාගත් ඉලක්ක පහත පරිදි වේ:

අ. නියමිත මට්ටමෙන් අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදුකිරීම.

ආ. අළුත්වැඩියා, නඩත්තු හා සේවා කටයුතු සඳහා නව ප්‍රතිපත්ති හඳුන්වා දීම.

ඇ. විශේෂිකරණය යාවත්කාලීන කිරීම.

ඈ. දින 30 ක කාලය තුල බිල්පත් භාරදීම 80% ක් දක්වා වැඩි කරමින් හා වෙන්කරන ලද අරමුදල් 90% ක් දක්වා බිල්පත් නිරවුල් කිරීම තුළින් පූර්ණ උපයෝජණයට ලක් කොට නියමිත මූල්‍ය කළමණාකරණය කිරීම.

ඉ. මෙම වසර තුළදී විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරු බළකායට නව කොමිෂන් ලත් නිලධාරි 15 ක් හා සෙසුනිල 119 දෙනෙකු බඳවා ගැනීම.

ඊ. දේශීය හා විදේශීය වශයෙන් නිලධාරී සහ සෙසුනිල විශාල පිරිසක් හට කාර්මික පුහුණුව ලබාදීම.

උ. ජාතික ගොඩනැංවීමේ ව්‍යාපාති සඳහා සැළකිය යුතු මට්ටමේ දායකත්වය.

උෟ. කැළණිය ස්වාධීන ප්‍රවාහන බළසෙණය සඳහා නව ස්වාධීන ක්ෂේත්‍ර වැඩපළක් ස්ථාපිත කිරීම.

එ. එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා වාහන / උපකරණ නිර්මාණය හා නව්‍යකරණය කිරීම.

15. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය</u>**. මෙම වසර තුළ විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ:

අ. **<u>මධ්‍යම වාහන අළුත්වැඩියා කටයුතු ප්‍රගතිය</u>**. සියලුම විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩපලවල් මඟින් දිවයින පුරා සිදුකරන මධ්‍යම ප්‍රමාණයේ වාහන අළුත්වැඩියා ප්‍රමාණය 11287 කි.

ආ. **<u>සම්පූර්ණ අළුත්වැඩියාව.</u>** ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපලේදී සිදුකරන ලද සම්පූර්ණ අළුත්වැඩියා කටයුතු ප්‍රමාණය 162 කි.

ඇ. **<u>මූල්‍ය ප්‍රගතිය.</u>** 2016 වර්ෂයේදී විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලැබුණු මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 1059.93 කි. වර්ෂය තුළ මුළු වියදම රුපියල් මිලියන 1049.19 කි.

| අ/අ | වැයශීර්ෂ | වෙන්කරන ලද මුළු මුදල (රුපියල් මිලියන) | බැඳීම් තහවුරු මුදල (රුපියල් මිලියන) | වියදම 2016 (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| 1. | පුනරාවර්තන වියදම් | 748.96 | 118.27 | 782.12 |
| 2. | ප්‍රාග්ධන වියදම් | 310.97 | 15.48 | 267.07 |
| | **මුළු වියදම** | **1059.93** | **133.75** | **1049.19** |

සංඛ්‍යා සටහන 13.4: මූල්‍ය ප්‍රගතිය.

ඈ. **<u>වර්ෂය තුළදී මෙහෙයවන ලද ව්‍යාපෘති</u>**.

(1) උඩවලව - විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපළ විසින් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති.

(අ) ජංගම වෙනස්කල හැකි රූප පද්ධතියක් සහිත වැඩි දියුණු කරන ලද යුනිකොන් වාහන නිෂ්පාදනය.

(ආ) යතුරුපැදි ප්‍රවාහනය කළ හැකි වාහන නිෂ්පාදනය.

(2) කටුබැද්ද - විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපළ විසින් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති.

(අ) මාලි දේශයේ එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා යුනිකොන් ගිලන්රථ නව්‍යකරණය කිරීම.

(ආ) මාලි එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා ජංගම මුළුතැන් ගෙවල් නිර්මාණය කිරීම.

ඉ. **<u>ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘති.</u>** ආරක්ෂක අමාත්‍යාංශය, නගර සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන සංස්ථාව හා කොළඹ නගර සභාවේ ඉල්ලීම පරිදි සිදුකරන ලද ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘති පහත පරිදි වේ.

(1) සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති.

(අ) කොළඹ නගරය තුල බස් නැවතුම්පොළවල් 34 ක් ඉදිකිරීම හා ස්ථාපිත කිරීම.

(ආ) මල්වත්ත පාරේ වෙළඳුන් වෙනුවෙන් වෙළඳාම් කිරීම සඳහා කුඩා වෙළඳ කුටි සාදා දීම.

(ඇ) රත්නාලංකා පුද්ගලික සමාගම සඳහා ද්විත්ව ඇඳන් 50 ක් නිෂ්පාදනය කිරීම.

(ඈ) දියත උයන ළමා උද්‍යානයේ වහලය ඉදිකිරීම.

(ඉ) දියත උයනෙහි මල්කුටි ඉදිකිරීම.

(ඊ) කඩවත ළමා උද්‍යානයේ වහලය ඉදිකිරීම.

(2) ක්‍රියාත්මක ව්‍යාපෘති.

(අ) වලස්මුල්ල සතිපොළ ඉදිකිරීම.

16. **<u>ක්‍රියාකාරකම් විශ්ලේෂණය හා ඇගයීම.</u>** ශ්‍රී ලංකා විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරුවන් විසින් සිදුකරන ලද ප්‍රධාන ක්‍රියකාරකම් විශ්ලේෂණය හා ඇගයීම පහත පරිදි වේ.

අ. ශ්‍රී ලංකා විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරුවන් විසින් ඒකක මට්ටමින් ක්ෂේත්‍ර අළුත්වැඩියා කටයුතු හා මධ්‍යම ප්‍රමාණයේ අළුත්වැඩියා කටයුතු රාශියක් සිදුකරන ලදී. එමෙන්ම මූලික වැඩපළවල් මඟින් සම්පූර්ණ අළුත්වැඩියා කිරීමේ කටයුතු සැළකිය යුතු ප්‍රමාණයක් සිදුකරන ලදී. ශ්‍රී ලංකා විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරුවන් විසින් යුද්ධ හමුදා වාහන රාශියක අළුත්වැඩියා කටයුතු හා නඩත්තු කටයුතු සාර්ථකව සිදුකරන ලදී.

ආ. ශ්‍රී ලංකා විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරුවන් විසින් වාහන සේවාවාර ප්‍රමිතියකින් යුතුව සිදුකිරීම තුළින් ඒවා අළුත්වැඩියා කළ යුතු වාර ගණන අවම කිරීමට සමත් විය. මෙය වාහනයේ ජීවකාලය වැඩි කිරීමට ඉවහල් වන අතර විශාල අළුත්වැඩියා කටයුතු සඳහා දැරීමට සිදුවන පිරිවැය අවම වේ.

ඇ. මූල්‍ය කළමණාකරණය ඉතා හොඳ මට්ටමෙන් පවත්වාගෙන යන අතර කාලසටහනකට අනුව වඩා කාර්යක්ෂම ලෙස පරිහරණය කරන ලදී. සෑම මට්ටමකදීම මූල්‍ය කළමනාකරණ කටයුතු අධීක්ෂණය දැඩි අවධානයෙන් යුතුව සිදුකරන ලදී. කෙසේ වුවද මෙම අධ්‍යක්ෂ මණ්ඩලය 2016 වර්ෂය අවසානය වන විට බිල්පත් 90% ක ප්‍රමාණයක් නිරවුල් කිරීම තුළින් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට සමත් විය.

ඈ. පුළුල් අධීක්ෂණ පද්ධතියක් ආරෝපණය කරගනිමින් සම්පත් යටිතල පහසුකම් හා පුහුණුව වඩා ඵලදායී ලෙස සැපයීම තුළින් ශාක්‍යතා සංවර්ධනය කරන ලදී.

ඉ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හදිසි අවශ්‍යතා පියවීම උදෙසා විදුලි හා යාන්ත්‍රික.

ඊ. විශාල මුදල් සම්භාරයක් ඉතිරි කරමින් යුද්ධ හමුදා අවශ්‍යතා සැපයීම සඳහා විශාල ප්‍රමාණයේ වානේ ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය කරන ලදී.

උ. බළකායේ අනාගත අවශ්‍යතා සපුරාලීම සඳහා නිලධාරි හා කාර්මිකයින් සැළකිය යුතු ප්‍රමාණයන්ගේ හැකියා, දැනුම හා ආකල්ප වර්ධනය කරමින් පුහුණුව ලබා දෙන ලදී.

ඌ. කාර්මිකයින්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් සුභසාධන කටයුතු කිහිපයක් ක්‍රියාත්මක කරන ලද අතර එහිදී ආබාධිත සොල්දාදුවන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙන ලදී.

## අධ්‍යක්ෂ ජෙනරාල් පාබල කාර්යාලය

1. අධ්‍යක්ෂ ජෙනරාල් පාබල කාර්යාලය සියලුම පාබල රෙජිමේන්තු නියෝජනය කරනු ලබයි. මෙම ශාඛාව ප්‍රතිපත්ති සම්බන්ධ ගැටළු, බළඇණි පුහුණුව, අධීක්ෂණ කටයුතු සඳහා විශේෂ පාබල මෙහෙයුම් පුහුණු කටයුතු හා පුහුණු අවශ්‍යතා පිලිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම ආදී කටයුතු සම්බන්ධව පාබල රෙජිමේන්තු හා සමීප සම්බන්ධතාවයෙන් යුතුව කටයුතු කරයි. තවද මෙම ශාඛාව සියලුම පාබල බළඇණි වල සංයුති සංඛ්‍යා ලේඛණ, අවි උපකරණ කට්ටල අධීක්ෂණය කර මූලික අවශ්‍යතා වැඩි දියුණු කිරීම සඳහා යුද්ධ හමුදා මුලස්ථානයට උපදෙස් දෙනු ලබයි. පාබල ඒකකයන් පොදු තීන්දු තීරණ ගැනීම සඳහා මධ්‍යස්ථාන අණදෙන නිලධාරීන් සඳහා කාලානුරූපීව රැස්වීම් පවත්වනු ලබයි. මෙම ශාඛාවට අයත් අනෙකුත් රාජකාරීන් වනුයේ බලඇණි පුහුණු පාසල් තුල හා අනෙකුත් යුද්ධ හමුදා පුහුණුව ආයතන විසින් මෙහෙයවනු ලබන සියලුම පාබල පුහුණු කටයුතු අධීක්‍ෂණය කිරීම හා ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාස වලදී මූලික සම්බන්ධීකාරවරයා ලෙස කටයුතු කිරීමයි.

2. **<u>සපුරාගත් ඉලක්කයන්</u>.** මෙම කාලසීමාව තුලදී සපුරාගත් ඉලක්කයන් පහත පරිදි වේ.

අ. **<u>පුහුණුව</u>.** 2016 බළඇණි පුහුණු කාලසටහන අනුව පහත සඳහන් පාබල බලඇණි පුහුණු කටයුතු අදාල බළඇණි පුහුණු පාසල් තුළදී සම්පූර්ණ කරන ලදී. බළඇණි පුහුණුව තුල පාබල සොල්දාදුවෙකුගේ සන්නද්ධ හැකියාව, චිත්ත ධෛර්‍යය, සහයෝගිතාව හා විනය වඩා උසස් තත්වයට පමුණුවන බවට නිරීක්‍ෂණය වී ඇත. ඒ හා සමානව විශේෂ පාබල මෙහෙයුම් පුහුණු පාබල ක්‍රියාකාරකම් වර්ධනය වේ.

ආ. **<u>බළඇණි පුහුණුව</u>.** මෙම වර්ෂය තුළ සිදුකරන ලද මුළු බළඇණි පුහුණු සංඛ්‍යාව 63ක් වන අතර එමඟින් නිලධාරීන් 751 ක් හා සෙසුනිල 19315 ක් පුහුණු කරන ලදී.





ඇ. **<u>විශේෂ පාබල මෙහෙයුම් පුහුණු කණ්ඩායම</u>.** මෙම වර්ෂයේ විශේෂ පාබල මෙහෙයුම් පුහුණු කණ්ඩායම් පාඨමාලා 02 ක් සම්පූර්ණ කරන ලද අතර එමඟින් නිලධාරීන් 51 ක් හා සෙසුනිල 852 ක් සුදුසකම් ලබාගන්නා ලදී.



3. **<u>අනෙකුත් විස්තර.</u>** බළඇණි පුහුණු හා විශේෂ පාබල මෙහෙයුම් පුහුණු කටයුතු වලට අමතරව අධ්‍යක්ෂ ජෙනරාල් පාබල කාර්යාලය අධ්‍යාපන ප්‍රදර්ශන වලදී අවි ආයුධ ප්‍රදර්ශණ කිහිපයක් යුද්ධ හමුදාධිපතිගේ අනුමැතිය සහිතව සම්බන්ධීකරණය කරන ලදී. එමෙන්ම මෙම කාර්යාලය විසින් මිත්‍ර ශක්ති ශ්‍රී ලංකා ඉන්දියා ඒකාබද්ධ පුහුණු අභ්‍යාසය සාර්ථකව සම්බන්ධීකරණය කරන ලදී. මෙම වසරේ එම පුහුණු අභ්‍යාසය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මූලස්ථානයේදී පවත්වන ලද අතර 2016 මිත්‍ර ශක්ති අභ්‍යාසය සඳහා වෙන්කරන ලද මුළු මුදල රු. 11,880,729.00 කි.





4. **<u>නිර්දේශ.</u>** අධ්‍යක්ෂ ජෙනරාල් පාබල හමුදා කාර්යාලයේ නිර්දේශයන් පහත පරිදි වේ:

අ. සියලුම පාබල ඒකක වසර 03 කට වරක් ඔවුන්ගේ ආවේනික රාජකාරීවලින් නිදහස් කල යුතුය.

ආ. සියලුම බළඇණි පුහුණු පාසල් යුද්ධ හමුදා පුහුණු පාසල් බවට පත්කිරීම තුලින් ඒවාට තනිව නැගීසිටිමට හැකි ආයතන බවට පත් කිරීම.

ඇ. බළඇණි පුහුණු පාසල් සඳහා සංස්ථාවක් හා උපකාරවන මිනුම් ක්‍රමයක් ප්‍රකාශයට පත් කිරීම

ඈ. සියලුම බළඇණි පාසල් තුල යටිතල පහසුකම් හිඟයක් පවතින බැවින් මූලික කටයුතු යටතේ ඒවා සැපයීම සඳහා මූලිකත්වය ලබා දීම.

ඉ. පාබල නිලධාරී හට ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා හැදෑරීම සඳහා වැඩි අවස්ථාවක් ලබා දීම.

ඊ. එක්සත් ජාතීන්ගේ මාණ්ඩලික නිලධාරීන් සඳහා නිලධාරීන් තෝරාගැනීමේදී පාබල ඒකක වලට අයත් නිලධාරීන් සඳහා වැඩි අවස්ථාවක් ලබා දීම.

## මුලස්ථානය හය්කාර්ය සම්පාදන අණසක

1. මුලස්ථානය හය්කාර්ය සම්පාදන අණසක යුද්ධ හමුදා මුලස්ථානය යටතේ ක්‍රියාත්මක වන අතර එහි වගකීම හා රාජකාරි සම්බන්ධව යුද්ධ හමුදාධිපතිට වගකිව යුතු වේ. මුලස්ථාන හය්කාර්ය සම්පාදන අණසක කොස්ගම සාලාව ප්‍රදේශයේ ස්ථානගත කොට ඇත. ඒ ඒ රෙජිමේන්තු මධ්‍යස්ථාන හරහා යුද්ධ හමුදාවේ ස්වේච්ඡා ඒකක වල පරිපාලන කටයුතු පාලනය කරනු ලබයි.

2. **සපුරාගත් ඉලක්කයන්.** මුලස්ථානය හය්කාර්ය සම්පාදන අණසක සපුරාගත් ඉලක්කයන් පහත පරිදි වේ:

අ. **පරිපාලන.** වර්ෂයේ මුල්භාගය හා අගභාගයට අදාල වෘත්තිය පරීක්ෂණ අදාල නියමිත කාලය තුළ සම්පූර්ණ කිරීම හා මාණ්ඩලික ප්‍රධාන පාලන පරීක්ෂණයේදී රෙජිමේන්තු පරීක්ෂණ සාර්ථකව සිදුකිරීම.

ආ. **සුභසාධන.** කොස්ගම "රණවිරු ගම" පූර්ව ළමා විය සංවර්ධන පාසල මෙම මුලස්ථානය යටතේ සහනදායී මිලයන්ට අනුව ක්‍රියාත්මක වේ. එම ගම් වැසියන්ගේ බහුතරයක් විවිධ ආබාධ සහිත යුද්ධ හමුදා සාමාජිකයින් වන බැවින් (සේවයේ නියුතු/විශ්‍රාමික) ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීමට හා දරුවන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් ඉවහල් වනු ඇත.

ඇ. **දැනුවත් කිරීමේ වැඩ සටහන්.** වෘත්තිකයන් සඳහා ඔවුන්ට අදාල වෘත්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා නිලධාරීන් හා සෙසු නිලයන් වෙනුවෙන් යුද්ධ හමුදා ක්‍රමවේදයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ආරක්ෂක සේනා මුලස්ථාන හා ඉදිරිපෙළ නඩත්තු ප්‍රදේශ මට්ටමින් සිදුකරන ලදී.

3. **ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය.** මුලස්ථානය හය්කාර්ය සම්පාදන අණසක ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය පහත පරිදි වේ.

අ. මෙම මුලස්ථානයේ මාර්ගෝපදේශණයට අනුකුලව සියලුම වෘත්තිය පරීක්ෂණ පවත්වන ලදී. සියලුම රෙජිමේන්තුවල ලිපිකරුවන් (සාමාන්‍ය රාජකාරී), සූපවේදී, රියදුරු, වඩුකාර්මික පින්තාරු හා ගබඩා පාලකවරුන් පරීක්ෂාවට ලක්කරන ලදී. ඒ ඒ රෙජිමේන්තු වලට අයත් නිලධාරි මඩුල්ලක් විසින් මෙම විභාග මෙහෙයවන ලදී.






ආ. **<u>වෘත්තිය පරීක්ෂණ සාරාංශය.</u>** 2016 වර්ෂයේදි වෘත්තිය පුහුණු පරීක්ෂණ 74 ක් රෙපීමේන්තු වෘත්තිය පුහුණු පරීක්ෂණ 07 ක් ද ඇතුළුව අර්ධ වාර්ෂිකව සිදුකරන ලදී. සහභාගී වු වෘත්තිකයන් ප්‍රමාණය හා පරීක්ෂණය සම්පුර්ණ කරන ලද වෘත්තිකයන් ප්‍රමාණය පහත පරිදි වේ.

| අ/අ | වෘත්තිය | සමත් | අසමත් |
|---|---|---|---|
| 1. | ලිපිකරු (සාමාන්‍ය රාජකාරි) | 1,872 | 4,342 |
| 2. | භෝජනාගාර | 237 | 898 |
| 3. | රියදුරු (මෝටර් ප්‍රවාහන) | 555 | 1,453 |
| 4. | වඩු කාර්මික | 320 | 505 |
| 5. | චිත්‍ර ශිල්පී (ගොඩනැගිලි) | 66 | 28 |
| 6. | චිත්‍ර ශිල්පී (වාහන) | 38 | 25 |
| 7. | ගබඩාකරු (තාක්ෂණ) | 233 | 1,194 |
| **එකතුව** | | **3,321** | **8,445** |

සංඛ්‍යා සටහන 15.1: වෘත්තිය පරීක්ෂණ සාරාංශය.




ප්‍රස්තාරය 15.1: වෘත්තිය පරීක්ෂණ සාරාංශය.

## <u>ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය</u>

1. ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලයේ වගකීම වනුයේ සියලුම ක්ෂේත්‍ර ඉංජිනේරු හා යාන්ත්‍රික ඉංජිනේරු කටයුතු සම්බන්ධව තීරණ ගැනීමේදී යුද්ධ හමුදාධිපතිට උපදෙස් ලබාදීමයි. තවද ඉංජිනේරු බළකායන් වෙත පැවරුණ සියලුම ඉංජිනේරු කටයුතු වල ක්‍රියාකාරීත්වය පිළිබඳ යුද්ධ හමුදාධිපතිට වගකිව යුතු අතර යුද්ධ හමුදා මුලස්ථානය හා අදාල සංස්ථා සමග සමීප සබඳතාවයෙන් යුතුව කටයුතු කළ යුතු වේ. රටෙහි සංවර්ධන සැළසුම සමඟ ඉංජිනේරු බළකා ජාතික ඉදිකිරීමේ ව්‍යාපෘති මෙන්ම බිම් බෝම්බ ඉවත් කිරීමේ ව්‍යාපෘති වලට සිය දායකත්වය ලබා දෙනු ලැබේ.

2. **<u>සපුරාගත් ඉලක්කයන්</u>**. මෙම වර්ෂය තුළදී සපුරාගත් ඉලක්කයන් පහත පරිදි වේ:

අ. මෙම වර්ෂය තුලදී ඉංජිනේරු බලකාය යුද හමුදා හා සංවර්ධන ව්‍යාපෘති රාශියක් සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දෙන ලදී. යුද හමුදා ඉංජිනේරුවන් වාරි මාර්ග පිලියෙළ කිරීම, මහා මාර්ග ඉදිකිරීම, ගොවීන් සඳහා කාබනික පොහොර නිෂ්පාදනය ආදි රාජ්‍ය සංවර්ධන හා පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි සහය ලබා දී ඇත. තවද කොස්ගම කඳවුරේ මධ්‍යම අවි ගබඩාවේ පුපුරණ ද්‍රව්‍ය හා යුධෝපකරණ බැහැර කිරීමේ කටයුතුද සිදුකරන ලදී. ශ්‍රී ලංකා යුද හමුදා මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරීමේ ඒකක බිම් බෝම්බ හඳුනාගැනීමේ සුනඛ කණ්ඩායම් 2016 සම්මානය දිනා ගනිමින් නොමැකෙන නාමයක් සනිටුහන් කල අතර එහි වෘත්තීය නිපුණත්වය මැනවින් පෙන්වන ලදී. එම සම්මානය උළෙල මාර්ෂල් ලිගසි ආයතන විසින් මෙහෙයවන ලද අතර 2016 ඔක්තෝම්බර් 26 වන දින වොෂින්ටන් නගරයේ ඉංජිනේරු බළසේනාධිපති හා බිම් බෝම්බ හඳුනා ගැනීමේ සුනඛයින් පුහුණුකරුවන් විසින් එම සම්මානය ලබා ගන්නා ලදී.





බිම් බෝම්බ හඳුනාගැනීමේ සුනඛ කණ්ඩායම් සාමාජිකයින්

ආ. දීපව්‍යාප්ත ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘති සඳහා ඉංජිනේරු බළකායේ සහය දක්වන ලදී. වාරිමාර්ග ප්‍රතිසංස්කරණය, මාර්ග පද්ධති ඉදිකිරීම, වගා කටයුතු හා නැවත පදිංචි කිරීම උදෙසා කැළෑබඳ ප්‍රදේශ එළි පෙහෙළි කිරීම යනාදී යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සිදුකරන ලදී.

ඇ. මීට අමතරව මෙම වර්ෂය තුලදී ක්ෂේත්‍ර ඉංජිනේරු සෙනින් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘති. ගොවීන් සඳහා කාබනික පොහොර නිෂ්පාදනය යන ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා දායකත්වය ලබා දුන් අතර 2016 වර්ෂයේ ක්ෂේත්‍ර ඉංජිනේරුවන්ගේ ප්‍රධාන දායකත්වය වන්නේ 2016 වර්ෂයේ කොස්ගම මධ්‍යම අවි ගබඩාවේ සිදු වු පිපිරීමෙන් පසු එම පුපුරණ ලද යුධෝපකරණ ද්‍රව්‍ය බැහැර කිරීමට දැක්වු දායකත්වයයි.




කොස්ගමදි විනාශ වූ කොටස් එකතු කිරීම

ඇ. **මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරීම.** ශ්‍රී ලංකා යුද්ධ හමුදා බිම් බෝම්බ ඉවත් කිරීමේ ඒකකය, ශ්‍රී ලංකාව තුළ බිම් බෝම්බ ඉවත් කිරීම සඳහා ඇති ප්‍රධානම ඒකකයයි. එහි දායකත්වය අනිකුත් සියලුම ආයතනවල දායකත්වය අභිබවා යයි. යුද්ධ හමුදා උතුරු නැගෙනහිර ප්‍රදේශවල මෙම මෙහෙයුම තවදුරටත් ක්‍රියාත්මක කිරීම තුළින් එම ප්‍රදේශවල ජන ජීවිතය යථා තත්ත්වයට ගෙන ඒමට දායකත්වය ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘති සඳහා මෙම ඒකකයට නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයෙන් සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් ලද මුදල රු. මිලියන 10.8 කි.

3 **ශාක්‍යතා සංවර්ධන ක්‍රියාකාරකම්.** සාම්ප්‍රදායික ක්‍රමයට පටහැනිව යටත් ආයතනය සකස් කොට වැඩි දියුණු කරමින් කාර්යක්ෂම හා නිරවද්‍ය සේවාවක් සැපයීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදි.

අ. ඉංජිනේරු බලකායට අළුතින් එක්වූ අංශය වන්නේ පුපුරණ ද්‍රව්‍ය හා මත්ද්‍රව්‍ය හඳුනා ගැනිමේ පුහුණු මුගටි අංශයයි. මේ තුළින් ක්ෂේත්‍ර පීරා සෙවීමේ මෙහෙයුම් වලදි ඉව මඟින් පුපුරණ ද්‍රව්‍ය හා මත්ද්‍රව්‍ය සොයාගැනීමට ඇති හැකියාව වර්ධනය කිරීම අරමුණයි.

ආ. රසායන, ජෛව විද්‍යාත්මක, විකිරණ, න්‍යෂ්ඨික පුපුරණ ද්‍රව්‍ය, බිම්බෝම්බ හඳුනාගැනීමේ සුනඛයන් හා පුපුරණ ද්‍රව්‍ය නිෂ්ක්‍රීය කිරීමේ උපකරණ පිලිබඳ දැනුම වර්ධනය කරගැනීම සඳහා එක්සත් රාජධානි තානාපති කාර්යාල සහය ඇතිව පාඨමාලා මෙහෙයවන ලද අතර එම පාඨමාලා මූලික බිම්බෝම්බ ඉවත්කිරීම, පුපුරණ ද්‍රව්‍ය නිෂ්ක්‍රීය කිරීමේ උපකරණ හා බිම්බෝම්බ නිෂ්ක්‍රීය කිරීම කළමණාකරණය යන අංශ යටතේ මෙහෙයවන ලදී.

| අ/අ | පාඨමාලාව | සිසුන් සංඛ්‍යාව | කාලසීමාව |
|---|---|---|---|
| 1. | පුපුරණ සුලු යුධෝපකරණ ද්‍රව්‍ය උපාංග පාඨමාලාව III වන මට්ටම | නිලධාරී 02 සහ සෙසුනිල 49 | 17/10/2016 - 27/10/2016 |
| 2. | ප්‍රති විරුද්ධ පුපුරණ සුලු යුධෝපකරණ ද්‍රව්‍ය පුහුණු පාඨමාලාව | නිලධාරී 04 සහ සෙසුනිල 63 | 14/11/2016 - 22/11/2016 |
| 3. | පුපුරණ සුලු යුධෝපකරණ ද්‍රව්‍ය පාඨමාලාව | සෙසුනිල 10 | 06/07/2016 - 22/07/0216 |
| 4. | රසායනික ජීව විද්‍යාත්මක හා විකිරණ න්‍යෂ්ඨික පාඨමාලාව | නිලධාරී 01 සහ සෙසුනිල 27 | 03/05/2016 - 19/05/2016 |
| 5. | රසායනික ජීව විද්‍යාත්මක හා විකිරණ න්‍යෂ්ඨික මූලික පාඨමාලාව | නිලධාරී 18 සහ සෙසුනිල 76 | 16/08/2016 - 01/09/2016 |

සංඛ්‍යා සටහන 16.1: මානුෂවාදී බිම් බෝම්බ ඉවත්කිරීමේ කලමනාකරණ පාඨමාලා.

ඇ. ඉංජිනේරු බලකාය යටතේ ගෝලීය තොරතුරු පද්ධති අංශයක් හා ක්ෂේත්‍ර මිනින්දෝරු කාර්යාලයක් ස්ථාපිත කිරීම මගින් භූමි විශ්ලේෂණ පද්ධතියේ නව පැතිකඩක් හඳුන්වා දීම. මෙමගින් විවිධ සංනිවේදන හරහා ලබාගත් දැනුම පිලිබඳ තත් භූගෝලීය දත්ත වලට ඇති වටිනාකම හා නිරවද්‍යතාව වැඩි කර ඇත.

4. **2016 වර්ෂයේ ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය යටතේ සිදුකරන ලද ව්‍යාපෘති.** ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දීපව්‍යාප්ත ඉදිකිරීම් ප්‍රතිසංස්කරණය කිරීම් හා බිම් සැකසීම් ව්‍යාපෘති වැනි ජාතික ගොඩනැංවීමේ ව්‍යාපෘති සඳහා විශාල දායකත්වයක් ලබා ගන්නා ලදී. මෙම ව්‍යාපෘති සඳහා දායක වෙමින් යුද හමුදා ක්ෂේත්‍ර ඉංජිනේරුවන් මාර්ග ප්‍රතිසංස්කරණය, සංනිවේදන ජාල ස්ථාපිත කිරීම, නැවත පදිංචි කරවීම සඳහා කැලෑ ප්‍රදේශ එළි කිරීම, ආදි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූලිකව අවධානය යොමුකරන ලදී. මීට අමතරව මාර්ග ඉදිකිරීම්, ක්‍රීඩාංගන ඉදිකිරීම් හා වාරිමාර්ග ප්‍රතිසංස්කරණය ආදි කටයුතු සඳහාද සහය ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ගත මුදල රුඃ මිඃ 475,742 ක් වන අතර එම ව්‍යාපෘති වල වගකීම ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනෙරු කාර්යාලය භාර ගන්නා ලදී.



කැළණිය නාගනන්ද විහාරස්ථානය සංවර්ධනය



පොළොන්නරුව රාජකීය විද්‍යාලය සංවර්ධනය



"වසවිස නැති රටක්" කාබනික පොහොර ව්‍යාපෘතිය



මුතියන්කඩ්ඩු වැවේහි වාන් දොරටු සවිකිරීම



මහවැව ප්‍රතිසංස්කරණය කිරීම -
ත්‍රිකුණාමලය ගෝමරංකඩවල

5. **<u>ගැටලු සහ අභියෝග</u>**. වර්තමානයේ මුහුණ දෙන ප්‍රධාන ගැටලු සහ අභියෝග පහත පරිදි වේ:

අ. අඛණ්ඩව රාජකාරියේ නියුක්ත කිරීම හා විවිධ වර්ග සමග මිශ්‍ර කිරීමට සිදුවීමෙන් ඇති වන කැඩීම් බිඳීම් හේතුවෙන් උපකරණ අළුත්වැඩියා කිරීමට සිදුවීම.

ආ. එක්සත් ජාතීන් විසින් ඉල්ලුම් කර ඇති උපකරණ වල ඇති හිඟකම හේතුවෙන් පුපුරණ ද්‍රව්‍ය ඉවත්කිරීමේ හටපිරිස් සූදානම් කිරීම විශාල අභියෝගයක්ව ඇත එම නිසා පුපුරණ ද්‍රව්‍ය බළසෑණය, විශේෂ පුපුරණ ද්‍රව්‍ය ඉවත් කිරීමේ උපකරණ වලින් සන්නද්ධ කල යුතුය.

ඇ. විවිධ අභියෝගයන්ට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් උපකරණ නොමැති වීම නිසා රසායන, ජෛව විද්‍යාත්මක, විකාශණ හා න්‍යෂ්ඨික බලය රාජකාරි සම්බන්ධ කටයුතු සඳහා භාවිතා කිරීමේදී දුෂ්කරතා පැන නගී.

ඈ. නැවත පදිංචි කිරීමේ හා හින්දු කටයුතු අමාත්‍යංශය වෙතින් ලැබෙන මූල්‍ය සහය ප්‍රමාණවත් නොවීම.

6. **<u>අනාගත සැලසුම්</u>.** ප්‍රධාන කේෂ්ත්‍ර ඉංජිනේරු කාර්යාලයේ අනාගත සැලසුම් පහත පරිදි වේ:

අ. ක්ෂේත්‍ර රාජකාරි වල නියුතුවන එනම් අඛණ්ඩව සාර්ථකව මුහුණ දිමට හැකියාව ඇති පරිදි සූදානම් කිරීම, පුපුරණ ද්‍රව්‍ය ඉවත් කිරීමේ අංශය, මානුෂීය බිම් බෝම්බ ඉවත් කිරීම, රසායන ජීව විද්‍යාත්මක, විකිරණ හා න්‍යෂ්ඨික අංශවල හටපිරිස් මනාව පුහුණු කිරීම හා අවශ්‍ය උපකරණ වලින් සන්නද්ධ කර පුපුරන ද්‍රව්‍ය හඳුනාගැනීමේ අංශය හා එකාබද්ධ කරමින් ඕනෑම අවස්ථාවකට මුහුණදීමට හැකි වන පරිදි සූදානම් කිරීම.

ආ. වර්තමානයේදි මුළු රටම ආවරණය වන පරිදි ඉංජිනේරු රෙජිමේන්තු 13 ක්‍රියාත්මක වන අතර එක් ඉංජිනේරු බලසේනාවක් විශාල මෙහෙයුම් සහ පරිපාලන කටයුතු සිදුකරනු ලබයි. එම නිසා අනාගත ඵලදායිතාව වැඩිකර විවිධ දුෂ්කරතා මගහරවාලීම සඳහා තවත් එක් ඉංජිනේරු බලසේනාවක් ස්ථාපිත කිරීම.

7. **ක්‍රියාකාරකම් විශ්ලේෂණය හා ඇගයීම**

අ. හටපිරිස්වල හා විශේෂ ඉංජිනේරු සම්පත්වල හිඟකම හමුවේ කාර්යක්‍ෂමතාව පවත්වාගෙන යාම ප්‍රධාන අභියෝගයක් වී ඇත. එම නිසා ඉංජිනේරු රාජකාරිවල සැලකියයුතු මට්ටමේ අඩුවීමක් නිරීක්‍ෂණය වී ඇත.

ආ. රාජ්‍ය හා පෞද්ගලික අංශය ක්ෂේත්‍ර ඉංජිනේරු රාජකාරී පිළිබඳ විශාල පැහැදීමකින් සිටින අතර මෙය අනාගතයේදි ව්‍යාපෘති කොන්ත්‍රාත් ලැබීම වැඩිවීමට ඉවහල් වන නමුත් වෘත්තීකයන්ගේ හිඟකම නිසා ඇතිවන හිඟකම පියවීම සඳහා පුහුණු වෘත්තිකයන් නොමැති වීමෙන් එම ව්‍යාපෘති ස්වාධීනව භාර ගැනීමේදී ගැටලු මතුවේ.

ඇ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා බිම් බෝම්බ ඉවත්කිරීමේ ඒකකය ජාතික බිම් බෝම්බ ඉවත්කිරීමේ ප්‍රධාන ආයතනය වශයෙන් දැකිය හැකි වුවද පුහුණුව වෘත්තිකයන් විශ්‍රාම ගැනීම නිසා ඇතිවන හිඟකම පියවීම සඳහා පුහුණු වෘත්තීකයන් නොමැති වීමෙන් එම කටයුතුවල සමස්ථ කාර්යක්‍ෂමතාව කෙරෙහි අහිතකර ලෙස බලපායි.

ඈ. අත්‍යාවශ්‍ය පුපුරණ ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ඇති උපකරණ වල හිඟකම හේතුවෙන් එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා එවන භට පිරිස් පුහුණු කිරීම සඳහා ප්‍රමාණවත් නොවීම හා දැනට පවතින උපකරණ යල්පැනගිය ඒවා වීම.

ඉ. විශාල ප්‍රමාණයක් විශ්‍රාම යාම හා ඊට සාපේක්‍ෂව බඳවාගන්නා ප්‍රමාණය අඩුවීම හේතුවෙන් ඒකක සංයුතිය අඩුවීම හා එය සමස්ථ කාර්යක්‍ෂමතාව හීනවීම කෙරෙහි බලපායි.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය

1. ප්‍රධාන සංඥා නිලධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝග, පාලන, සන්නිවේදන, පරිගණක බුද්ධි හා පරිපාලන කටයුතු හා තාක්ෂණ ඉලෙක්ට්‍රොනික සයිබර් කටයුතු සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම සඳහා ඉදුරාම වගකිව යුතු අතර එහි සංස්ථා ව්‍යුහය පහත පරිදි වේ:




රූප සටහන 17.1: ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය යටතේ ඇති සංස්ථා.

2. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය</u>.** ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය පහත පරිදි වේ:

අ. **<u>රේඩියෝ සන්නිවේදනය</u>.** ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ මඟපෙන්වීම යටතේ යුද්ධ හමුදා අභ්‍යාස/ උත්සව හා විශේෂ අවස්ථාවන් 44 ක් සඳහා රේඩියෝ සන්නිවේදන පහසුකම් සපයන ලදී.

ආ. **<u>රැහැන් සන්නිවේදනය</u>.** නවතමයෙන් ස්ථාපිත කරන ලද මුලස්ථාන, ආයතන හා පුහුණු ආයතන සඳහා නව හුවමාරු මධ්‍යස්ථාන ඉදිකරමින් සන්නිවේදන පහසුකම් සපයන ලදී. එමෙන්ම දැනට පවතින සම්පත් උපයෝගී කරගනිමින් සන්නිවේදන ජාලය පුළුල් කරන ලදි.

ඇ. **<u>ජංගම සන්නිවේදන ජාලය</u>.** ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ඩයලොග්, මොබිටෙල් එයාටෙල් හා එටිසලාට් සමාගම් සමග සම්බන්ධිකරණයෙන් යුතුව ජංගම සන්නිවේදන ජාලය වැඩි දියුණු කිරීම සඳහා සහය ලබා දෙන ලදී. උතුරු නැගෙනහිර සහ වෙනත් දුෂ්කර පළාත් දක්වා ජංගම සන්නිවේදන ජාලය පුළුල් කරන ලදී.

ඈ. **<u>රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය</u>.** තොරතුරු තාක්ෂණ දැනුමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් 2016 වර්ෂයේදී මෙම සංකල්පය ඉදිරියට ගෙන එන ලදී. මෙම ව්‍යාපෘතිය, ක්‍රියාන්විතයේදී මියගිය නිලධාරීන් සහ සෙසු නිලයන් සහ දැනට සේවයේ නියුතු හා විශ්‍රාම ගිය නිලධාරීන් සහ සෙසු නිලයන්ගේ නෑදෑයින්ගේ තොරතුරු තාක්ෂණ දැනුම ඉහල නැංවීමේ අරමුණින් ස්ථාපිත කරන ලදී. තව දුරටත් මෙම ආයතනයේ ව්‍යාප්තිය පුළුල් කරමින් මේ තුළින් සිවිල් වැසියන්ට තම තොරතුරු තාක්ෂණ දැනුම වැඩිකරගැනීම සඳහා පහසුකම් සපයන ලදී.

ඉ. **<u>ආලෝක වාහන ඩයෝඩ තිර සේවා</u>.** ජංගම තිර 2 ක් හා ස්ථාවර තිර 2 ක් ද එක් ගෘහස්ථ තිරයක් විඩියෝ මික්සර් යන්ත්‍ර 2 ක් භාවිතා කරමින් ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය විසින් උත්සව අවස්ථා 269 ක් සඳහා 2015.08.15 සිට 2016.09.15 යන කාලය දක්වා සේවා සපයන ලදී. මෙම සේවාව මඟින් සිවිල් රාජ්‍ය ආයතන හා ජාතික වැඩසටහන් සඳහා මෙන්ම ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ජාතික මත්ද්‍රව්‍ය හා නිවාරණ ඒකකය විසින් ස්ථාපනය කරන ලද මතින් තොර රටක් වැනි වැඩසටහන් සඳහාද දායකත්වය ලබාදෙන ලදී.

ඊ. **<u>පරිගණක ක්‍රියාකරුවන් සැපයීම</u>**. 2015.08.15 සිට 2016.09.15 දක්වා කාලසීමාව තුල මෙම මූලස්ථානය මගින් පරිගණක ක්‍රියාකරුවන් 100 ක් බඳවාගෙන යුද්ධ හමුදා සංස්ථා 64 ක ඇබෑර්තු පුරවන ලදී.

උ. **<u>මහජන ඇමතුම් පද්ධතිය ස්ථාපිත කිරීම හා සැපයීම</u>**. ශ්‍රී ලංකා යුද්ධ හමුදා 10 වන සංඥා බලකාය විසින් මෙය ක්‍රියාත්මක කරන අතර ප්‍රධාන ජාතික උත්සව හා යුද්ධ හමුදා උත්සව සඳහා මෙම සේවාව සපයන ලදී. අනෙකුත් යුද්ධ හමදා උත්සව සඳහා ආවේණික සංඥා බලකායත් මධ්‍යම වැඩපල හා අදාල අනෙකුත් සංඥා වැඩපලවල් මගින් මෙම සේවාව සපයන ලදී. 2016 වසරේ සේවා සපයන ලද උත්සව පහත පරිදි වේ:

(1) ජාතික හා යුද්ධ හමුදා උත්සව - 65
(2) සේනාංක/ බලසේනා/ රෙජිමේන්තු හා ඒකක උත්සව - 291
(3) නවතම පිරිස් පරිපාලන පද්ධතියක් ස්ථාපිත කිරීම

ඌ. **<u>තැපැල් සේවා වැය ශීර්ෂය</u>**. ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලය සමග මෙහෙයුම් පාලන තැපැල් වැය ශිර්ෂය පාලනය තුලින් ඒ ඒ ක්ෂේත්‍ර මූලස්ථාන වෙත වෙන් කරන ලද අරමුදල් ප්‍රධාන සංඥා නිලධාරි කාර්යාලය විසින් පාලනය කරන ලදී. 2016 වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුː 2, 200,000.00 කි. එමෙන්ම ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුː 2,200,000.00 මුදලක් අතිරේක ප්‍රතිපාදන ලෙස වෙන් කරන ලද අතර මෙම අරමුදල් අවශ්‍යතා පිරිමැසීම සඳහා ප්‍රමාණවත් නොවේ.

එ. **<u>වෙනත් විස්තර</u>**. ප්‍රධාන සංඥා කාර්යාලය යටතේ තිබෙන ආයතන වැඩිදියුණු කිරීමට හා යුද්ධ හමුදා කටයුතු වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කල හැක:

(1) වර්තමාන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා බළකායන් ප්‍රතිසංශෝධනය කිරීම හා බලගැන්වීම මෙන්ම සංස්ථාව සඳහා නව තනතුරු ඇති කිරීම.

(2) වර්තමාන තොරතුරු තාක්ෂණ ආරක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා නව සයිබර් ආරක්ෂක ඒකකයක් ස්ථාපිත කිරීම.

(3) ආරක්ෂක සේනා මූලස්ථානය යාපනය, වන්නි, කිලිනොච්චි හා මුලතිව් යන ආරක්ෂක සේනා මූලස්ථාන යටතේ ක්‍රියාත්මක වන සියලුම යුද්ධ හමුදා සංස්ථාවල තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා 6 වන ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය ස්ථාපිත කිරීම.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

3. **<u>නිර්දේශ හා අනාගත සැලසුම්</u>**. නිර්දේශ සහ අනාගත සැලසුම් පහත පරිදි වේ:

අ. යුද්ධ හමුදා මූලස්ථානය හා සියලුම උසස් හමුදා මුලස්ථාන ඒකාබද්ධ කරමින් හඩ / දත්ත ජාල ව්‍යාප්ති ව්‍යාපෘතිය ලෙස යුද්ධ හමුදාව තුල තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මූලික සන්නිවේදන පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කිරීම.

ආ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පිරිස් බලය, සම්පත් හා උසස් තාක්‍ෂණ ඉල්ලුම සැපයීම සඳහා සංඥා බළකා සම්බන්ධ අවස්ථා පුලුල් කරමින් ප්‍රතිස්ථාපනය කිරීම.

ඇ. රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක වෙමින් අනිකුත් ආරක්‍ෂක සේවා සඳහා මහජන හා පෞද්ගලික ආයතන සඳහා සනනිවේදන සහය ලබාදීම.

ඈ. සංඥා බළකා සාමාජිකයන්ට හා යුද්ධ හමුදා සාමාජිකයන්ට නවීන සන්නිවේදන හා තොරතුරු තාක්‍ෂණ පද්ධතිය පිළිබඳ වෘත්තීය පුහුණුව ලබා දීම.

ඉ. ආයතන සතුව ඇති සම්පත් නව්‍යකරණය කිරීමට හා සන්නිවේදන අවශ්‍යතා සැපයීම සඳහා පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති වැඩිදියුණු කිරීම.

ඊ. රණවිරු තොරතුරු තාක්‍ෂණ ආයතනය පුළුල් කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය

1. ජාතික මට්මමේ, කළාප මට්මමේ සහ ඔලිම්පික් මට්ටමේ ජයග්‍රහණ ලබාගනු වස් ජාතික ජයග්‍රහණ ලබාගැනීමට සමත් වූ ක්‍රීඩික ක්‍රිඩිකාවන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩා සංචිතයට බඳවා ගැනීම, ඒ සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම මෙන්ම ඔවුන්ගේ විනය පවත්වාගෙන යාම මෙම කාර්යාලයේ කාර්ය භාර්යයන් වේ. මීට අමතරව ක්‍රීඩා අධ්‍යක්‍ෂ යටතේ සිදු කරන උත්සව සංවිධානය, යුද්ධ හමුදා ක්‍රීඩා තරගාවලි සහ ක්‍රීඩා කණ්ඩායම් සඳහා අවශ්‍ය තරගකරුවන් තෝරා ගැනීම, යුද්ධ හමුදා ක්‍රීඩා සංචිතයේ සියලුම අධීක්‍ෂණ සහ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම, යුද්ධ හමුදා ක්‍රීඩා කණ්ඩායම් සඳහා සුදුසු පුහුණුකරුවන් තෝරාගැනීම හා එම කණ්ඩායම්වල සාමාජිකයන් හා සැබැදි ක්‍රීඩකයන්ගේ සම්බන්ධීකරණය, කළමණාකරණය සහ පරිපාලනමය කටයුතු සඳහා වගකිව යුතු වේ.



ආසෙ සේනානායක - දකුණු ආසියානු ක්‍රීඩා උළෙල (රන් පදක්කම)




සෙ/554317 සැරයන් ජයලත් - ආසියානු පැරා ක්‍රීඩා උළෙල - 100මී (1 වන ස්ථානය)

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

2. **වර්ෂය තුළ ලබා ගත් ජයග්‍රහණ**. 2016 වර්ෂය තුළ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විවිධ ක්‍රීඩා වලින් ලබාගත් ජයග්‍රහණයන් පහත පරිදි වේ.

| අ/අ | තරඟ ඉසව්ව | රට | පදක්කම | | |
|---|---|---|---|---|---|
| | | | රන් | රිදී | ලෝකඩ |
| 1. | ලෝක තයිකුන්ඩු (හම්මිදාන්) | කොරියාව | | | 1 |
| 2. | 12 වන දකුණු ආසියානු මල්ලව පොර තරගාවලිය | ඉන්දියාව | | 2 | |
| 3. | මලල ක්‍රීඩා තරගාවලිය | කසකස්ථානය | 1 | 1 | |
| 4. | ජාත්‍යන්තර මොක්පො විසිකිරීමේ තරගාවලිය | කොරියාව | | 1 | |
| 5. | 12 වන ආසියානු රටවල් හරහා දිවීම | බහරේන් | 1 | | |
| 6. | නිදහස් මලල ක්‍රීඩා තරගාවලිය | ඉන්දියාව | | 1 | 1 |
| 7. | 12 වන දකුණු ආසියානු ක්‍රීඩාවලිය | ඉන්දියාව | 13 | 15 | 10 |
| 8. | ප්‍රීමියර් ලීග් මැලේසියන් සංචාරය | මැලේසියාව | 1 | | |
| 9. | ආසියානු ජූඩෝ ශූරතාවලිය | පකිස්ථානය | | 1 | |
| 10. | තායිලන්ත ජාත්‍යන්තර ජූඩෝ තරගාවලිය | තායිලන්තය | | 2 | |
| 11. | බිග් බෙටර් තරගාවලිය | තායිලන්තය | | | 1 |
| 12. | බෙල්ජියම් ටෙනිස් තරගාවලිය | බෙල්ජියම් | 2 | 0 | |
| 13. | රෝද පුටු ටෙනිස් තරගාවලිය - මැලේසියාව | මැලේසියාව | 1 | 1 | |
| 14. | රෝද පුටු ටෙනිස් තරගාවලිය - තායිලන්තය | තායිලන්තය | 1 | | 3 |
| 15. | කොරියානු විවෘත ටෙනිස් තරගාවලිය | කොරියාව | | 1 | |
| 16. | 12 වන දකුණු ආසියානු ක්‍රීඩාවලිය - වෙඩිතැබීම | ඉන්දියාව | 13 | 7 | 16 |
| 17. | දකුණු ආසියානු ක්‍රීඩාවලිය - පිහිණීම | ඉන්දියාව | 1 | 1 | |
| 18. | ආසියානු වෝටර් පොලෝ තරගාවලිය | හොංකොංග් | | 1 | |
| 19. | ආසියානු සාගර තරගාවලිය | ඩුබායි | | | 1 |
| 20. | විවෘත රෝද පුටු ටෙනිස් තරගාවලිය 2016 | මැලේසියාව | | 1 | |
| 21. | විවෘත පැරා තරගාවලිය | ජර්මනිය | | | 1 |
| 22. | විවෘත පැරා තරගාවලිය | ජර්මනිය | | | 1 |
| 23. | රියෝ පැරා ඔලිම්පික් තරගාවලිය | බ්‍රසීලය | | | 1 |
| 24. | ආසියානු කණිෂ්ඨ කබඩි ශූරතාවලිය | මැලේසියාව | | | 1 |
| 25. | ආසියානු බීච් තරගාවලිය | වියට්නාමය | | | 1 |
| 26. | සාක් ක්‍රීඩා | ඉන්දියාව | | | 2 |
| 27. | ලෝක වුෂු ශූරතාවලිය | චීනය | | | 1 |
| | **එකතුව** | | **34** | **35** | **41** |

සංඛ්‍යා සටහන 18.1: වර්ෂය තුළ ලබාගත් ක්‍රීඩා ජයග්‍රහණයන්.

## <u>සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය</u>

1. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය යටතේ පාලනය වන අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදා සෞඛ්‍ය සේවය සැබැඳිව ඉදුරාම ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපතිතුමන් හට වගකිව යුතුවේ. යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ අවශ්‍යතාවය අනුව පුරප්පාඩු සපුරා ගැනීමට වෛද්‍ය හා අතුරු වෛද්‍ය වෘත්තිකයින් බඳවා ගැනීමේ සියලු සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇතිවන ඉදිරි අභියෝග වලට මුහුණදීමට සුදුසු පරිදි සේවයේ නියුතු සියලු වෛද්‍ය වෘත්තික සාමාජිකයින්ගේ වෘත්තිය හැකියාවන් වර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම, සියලු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ මනා සෞඛ්‍ය යෙන් යුත් කාර්යක්ෂම පිරිසක් බවට පත්කිරීම සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල ක්‍රමෝපායන් සකස් කිරීම මෙම කාර්යාලය හා බැඳි පවතින වගකීම් වේ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලය පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලයන්හි ක්‍රියත්මක වීම් අණදීම් හා හැසිරවීම් සිදු කරනු ලබයි.




රූප සටහන 19.1: සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් යටතේ සංස්ථාවන්

2. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම්</u>**. මෙම වසර තුළදී පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදු කරන ලදී:

අ. ‘සෞඛ්‍ය සම්පන්න හමුදාවක් සෞඛ්‍යමත් දැයක්’ සෞඛ්‍ය පරීක්ෂණය හා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන, විශේෂයෙන්ම හමුදා හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් අතර බෝ නොවන රෝග වැළැක්වීම සඳහා 2014 වසරේදී ආරම්භ කර ඇති අතර පහත දැක්වෙන වැඩසටහන් එම කාලසීමාව තුළ සිදු කර ඇත:

(1) අණදෙන නිලධාරීන්, 2 වන අණ දෙන නිලධාරීන් 137 දෙනෙකුට පෝෂණය, ආහාර රටාව, හැසිරීම පිලිබඳව වැඩමුළුවක් පවත්වන ලදී.

(2) ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) හා ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) හි යුද්ධ හමුදා සාමාජිකයින් හට සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහනක් පවත්වන ලදී.

ආ. වෛද්‍ය පහසුකම් ඉතාම වැදගත් පුද්ගලයන් / ඉතා වැදගත් පුද්ගලයන් / රාජ්‍ය තාන්ත්‍රිකයන් / ක්‍රීඩා ඉසව් හා වෙනත් කටයුතු සඳහා අවශ්‍යතාවය පරිදි ලබා දෙන ලදී.

ඇ. පහත සඳහන් ස්වාභාවික විපත් සඳහා වෛද්‍ය පහසුකම් ලබාදෙන ලදී.

(1) අරණායක සාමසර කන්ද ප්‍රදේශය හා කඩුගන්නාව ප්‍රදේශය නාය යාම.
(2) බස්නාහිර පළාත තුල ගංවතුර.

ඈ. හදිසි විපත් නිසා ආසාදන වැළැක්වීම හා පාලනය, පුද්ගලික ආරක්ෂක උපකරණ භාවිතය (ආරක්ෂක උපකරණ) හා මළ සිරුරු සුරක්ෂිතව බැහැර කිරීම පිලිබඳව දින 02 ක වැඩසටහනක් යුධ හමුදා සාමාජිකයින් වෙත ආපදා පෙර සූදානම් වීමේ සහ සෞඛ්‍ය, පෝෂණය හා දේශීය වෛද්‍ය අමාත්‍යංශයේ ප්‍රතිචාර අංශයේ අධීක්ෂණය යටතේ පවත්වන ලදී.

ඉ. යුද්ධ හමුදා වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතු සම්බන්ධීකරණය කිරීම.

ඊ. හෙදියන් හා පැරා වෛද්‍ය පිරිස් සඳහා පශ්චාත් මූලික අධ්‍යාපන කටයුතු සම්බන්ධීකරණය කිරීම.

උ. මාලි රාජ්‍යයේ අධියර 'I' වර්ගයේ රෝහලක් ස්ථාපිත කිරීමට එක්සත් සාමසාධක මෙහෙයුම් සඳහා උදව් කිරීම.

**<u>යුද්ධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

3. යුද්ධ හමුදා වෛද්‍ය සේවය මෙරට දෙවැනි විශාලතම වෛද්‍ය සේවාව වේ. මෙම වකවානුව තුළදී අනෙකුත් සියලු සාමාන්‍ය සේවාවන් පවත්වාගෙන යමින් යුද්ධයේදී තුවාල ලැබූ රෝගීන් හට ප්‍රතිකාරමය වශයෙන් කාර්යක්ෂම සේවාවක් ලබාදීමට යුද්ධ හමුදා වෛද්‍ය සේවාව සමත් වී ඇත. තවද පශ්චාත් යුධ සමය තුල සේවයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදා සේවයේ නියුතුවන්ගේ පවුල් වල සාමාජිකයින් හා අනෙකුත් සේවා මුක්ත භටයින් දක්වා වෛද්‍ය සේවාව පුළුල් කිරීම හා යුද්ධයේදී තුවාල ලැබුවන් මෙන්ම යුද්ධය නිසා මානසික පීඩාවට ලක්වූ පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම සහ රෝග නිවාරණ ක්ෂේත්‍රයට වැඩි අවධානයක් යොමුකිරීමට පසුගිය අවුරුදු 07 තුල කටයුතු කර තිබේ. වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ සෘජු අණදීම යටතේ සමස්ථ යුද්ධ හමුදා වෛද්‍ය සේවයේ සම්බන්ධීකරණ ව්‍යුහය ලෙස ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකා යුද හමුදා වෛද්‍ය සේවයට වෛද්‍ය බඳවා ගැනීම් හා අතුරු වෛද්‍ය බඳවාගැනීම් සිදුකරමින් අවශ්‍ය හා අනවශ්‍ය සේවයන් සමතුලිත කරයි. එමෙන්ම බඳවාගත් අයවළුන්ගේ හැකියාවන් වර්ධනය කරමින් විද්‍යාත්මක අභියෝගයන් සඳහා ඔවුන්ව සූදානම් කරන අතර ශ්‍රී ලංකා යුද හමුදා වෛද්‍ය සේවයෙහි නිරත වූවන්ගේද ශ්‍රී ලංකා යුද හමුදා වෛද්‍ය බලකායෙහිද අනාගත අභිවෘද්ධිය ස්ථාපනය කරනු ලබයි.

4. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් හා ඔවුන්ගේ ප්‍රගතිය</u>**. අනුරාධපුර මූලික රෝහලේ සේවයේ සිටින හා විශ්‍රාමික හමුදා සාමාජිකයන්ගේ පවුලේ අයවළුන් සඳහා ගෘහස්ත ප්‍රතිකාර සඳහා වෙන් කල වාට්ටු ස්ථාපනය කරන ලදී.

5. **<u>2016 වර්ෂය තුළදී සිදු කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්</u>**: පහත සඳහන් උපදේශක වෛද්‍යවරු යුධ හමුදා වෛද්‍ය සේවාව සඳහා අනුයුක්ත කරන ලදී:

| | | | | |
|---|---|---|---|---|
| අ. | ළමාරෝග විශේෂඥ | - | 01. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා රෝහල (කොළඹ) හි සේවයේ යොදවා සිටී |
| ආ. | ක්ෂුද්‍රජීව විද්‍යා වෛද්‍ය විශේෂඥ | - | 01. | |
| ඇ. | ශල්‍ය විශේෂඥ | - | 01. | |

6. **<u>ගැටළු සහ අභියෝග</u>**. යුද්ධ හමුදා වෛද්‍ය සේවා ගිලන් රථ සේවාවට අවශ්‍යතාවය ගිලන් රථ 172 කි. මේ වන විට දැනට සේවය සඳහා යොදවා ඇති ගිලන් රථ 130 පමණ වේ. ඒවා අතුරින් ගිලන් රථ 38 අළුත්වැඩියා කිරීමෙන් පසුව වුවද භාවිතයට නුසුදුසු තත්වයක පවතී. එනිසා යුද්ධ හමුදා වෛද්‍ය සේවා ගිලන් රථ සේවාවට අවශ්‍ය හිඟ ගිලන් රථ ප්‍රමාණය 80 කි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය වෛද්‍ය ආධාර සැපයීමේදී ගැටළුකාරී තත්වයන් උද්ගත වී ඇත. මීට අමතරව අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් නොමැතිකම හේතුවෙන් හෙද හා පරිපූරක පාඨමාලා හැදෑරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පිරිස් බඳවා ගැනීමෙහිලා ගැටළු පවති.

7. **<u>අනාගත සැලසුම්</u>**. යුද්ධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යාක්ෂ මණ්ඩලයේ අනාගත සැලසුම් අපේක්ෂිතයන් පහත පරිදි වේ:

අ. සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය මගින් පහත සඳහන් උපදේශකයින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය සේවා බලකාය සඳහා අනුයුක්ත කරගැනීමට අවසර ලබා ගැනීමට කටයුතු යොදා තිබේ.

(1) මනෝ විශේෂඥ වෛද්‍ය - 01.
(2) ශල්‍ය විශේෂඥ වෛද්‍ය - 01.
(3) නිර්වින්දන විශේෂඥ වෛද්‍ය - 01.

ආ. 2017 වර්ෂය තුල ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය හා ස්වේච්ඡා බලසේනාව වෙත විශේෂඥ වෛද්‍යවරුන් බඳවා ගැනීමට සැලැසුම් කර ඇත.

ඇ. කාලෝචිත අවශ්‍යතාවයන් මත 2017 වර්ෂය තුළදී අවම වශයෙන් ගිලන් රථ 25 ක ප්‍රමාණයක් මිලදී ගත යුතුය.

**<u>රෝග නිවාරණ හා මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

8. රෝග නිවාරණ හා මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්‍යභාරය වන්නේ ප්‍රශස්ත රෝග වැලැක්වීම, රෝග පාලනය හා මානසික සෞඛ්‍ය සේවාවන් යුද හමුදාවේ සේවයේ සිටි හා ඔවුන්ගේ පවුල්වල මෙන්ම සිවිල් සේවක කාර්‍ය මණ්ඩලයේ මානසික හා ශාරීරික සෞඛ්‍ය මට්ටම ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමත් අවශ්‍ය විටක අනෙකුත් සන්නද්ධ හමුදා හා සිවිල් ජනතාව වෙත එය විහිදීමත්ය.

9. **<u>ප්‍රධාන ක්‍රියාකාරකම් හා ඒවායේ ප්‍රගතිය</u>**. රෝග නිවාරණය හා මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය පහත කාලවකවානුව තුල කල සේවය පහත පරිදි වේ:

අ. රෝග නිවාරණය හා මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාණ්ඩලික ප්‍රධානිගේ පාලන පරීක්ෂවට සමගාමීව විශේෂ ක්ෂේත්‍ර සනීපාරක්ෂාව පිලිබඳව සංචාරයක් සංවිධානය කරන ලදී.

ආ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින් හට අධ්‍යාත්මික හා මානසික සෞඛ්‍ය පිලිබඳ චර්යා වැඩසටහන් පෙලක් වෛද්‍ය ලලිත් රණතුංග මහතාගේ සහාය ඇතිව පවත්වන ලදී.

ඇ. රාජ්‍ය තොරතුරු දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලැබූ ජාතික මදුරු මර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට දායක විය.

10. **<u>අනාගත සැලසුම්</u>**. රෝග නිවාරණය හා මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනාගත අපේක්ෂාවන් පහත පරිදි වේ.

අ. සෞඛ්‍ය අමාත්‍යංශය එක්ව හමුදා කඳවුරු සඳහා ජල පිරිපහදු කිරීමේ ස්ථාන (Reverse Osmosis Plant) පිහිටුවීම.

ආ. බෝ නොවන රෝග වැලැක්වීම (අධිරුධිර පීඩනය, හයිපර්කොලොස්ටොරෝමියාව, දියවැඩියාව) නිරෝගිමත් හමුදාවක් නිරෝගිමත් දැයක් ව්‍යාපෘතිය හා පිළිකා නිවාරණය.

11. **<u>ගැටළු හා අභියෝග</u>**. රෝග නිවාරණය හා මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයේ වෘත්තීය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු.

**<u>යුද්ධ හමුදා දන්ත වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

12. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් යටතේ සෘජුවම ක්‍රියාත්මක වන අතර මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ අරමුණ වන්නේ යුද්ධ හමුදා නිලධාරීන්ගේ / සෙසු නිලයින්ගේ හා ඔවුන්ගේ පවුල් වල දන්ත සෞඛ්‍ය මට්ටම යහපත්ව පවත්වාගෙන යාම සඳහා දන්ත ශෛල්‍ය ප්‍රතිකාර පහසුකම් ලබාදීමත් යුද්ධ හමුදා සේවයේ නියතු අයගේ කාර්ය සාධන මට්ටමට දන්ත රෝග නිසා ඇති විය හැකි අවධානම අවම කිරීමත්ය.

13. **<u>ප්‍රධාන කාර්යයන් හා එහි ප්‍රගතිය</u>**. යුද්ධ හමුදා දන්ත සේවා අධ්‍යක්ෂ මණ්ඩලය පහත කාලවකවානුව තුළ කල සේවය පහත පරිදි වේ:

අ. දන්ත විශේෂඥ වෛද්‍යවරුන්ගේ හා (MDI-AH(කොළඹ)) පනාගොඩ දන්ත මධ්‍යස්ථානය එකතුවී සම්බන්ධ වූ සෞඛ්‍ය අමාත්‍යංශය මගින් සංවිධානය කරන ලද වැඩසටහන් ජාත්‍යන්තර මුඛ හා හනුක ශල්‍ය වෛද්‍ය දිනයේදී පැවැත්විය.

ආ. දන්ත ශල්‍ය වෛද්‍ය හා ශල්‍ය කාර්ය මණ්ඩලය විසින් තායිලන්තයේ දන්ත වෛද්‍ය විශේෂඥ කණ්ඩායමක් හා එක්ව 2016 ජූලි මස 24 වන දින සිට 2016 අගෝස්තු මස 03 වන දක්වා ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ප්‍රදේශයෙහි බෝගස්වැව කොකෙලිය හා වෙහෙර ජීවත්වන ජනතාවගේ මුඛ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කලේය.

ඇ. 2016 වර්ෂයට සමගාමීව ඇති පුරප්පාඩු සඳහා බඳවාගත් විකලාංග දන්ත විශේෂඥ වෛද්‍ය වරුන්

14. **<u>සංවර්ධන කටයුතු</u>**. සලකා බලන ලද කාලසීමාව තුළ සිදුකරන ලද සංවර්ධන කටයුතු පහත පරිදි වේ.

අ. ජංගම දන්ත වෛද්‍ය සේවයක්, ආරක්ෂක සේනා මූල්ස්ථානය (මුලතිව්) ප්‍රදේශයට හා ආරක්ෂක සේනා මූල්සථානය (යාපනය) සඳහා ලබාදෙන ලදි.

ආ. යුද්ධ හමුදා මූලික රෝහල (පලාලි) හි අළුතින් ඉදිකරන ලද නව දන්ත වෛද්‍ය ශල්‍ය කර්ම මධ්‍යස්ථාන 02 ක් විවෘත කරන ලදී.

15. **<u>අනාගත සැලසුම්</u>**. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අනාගත සැලසුම් දෘෂ්ටිකෝණය පහත පරිදි වේ:

අ. අනුරාධපුර දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයේ උපදේශන සේවා (පළමු පෙළ) ඇරඹීම.

ආ. පුහුණු ලේඛණයට අනුව පුරප්පාඩු 17 දන්ත වෛද්‍ය සහායක පුහුණු පාසල සඳහා වෙන්කර ඇති අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයට එම පුරප්පාඩු 17 ට අවශ්‍ය මුදල් පුහුණු අම විසින් වෙන් කරනු ලබයි.

**<u>වෛද්‍ය සේවා උපර්ජන අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

16. එක්සත් ජාතීන්ගේ සාමසාධක කටයුතු සඳහා ශ්‍රී ලංකා යුධ හමුදා භට පිරිස් අනුයුක්ත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා යුධ හමුදාවේ වෛද්‍ය බලකායටද සුඩානය, ලෙබනනය හා මාලි රාජ්‍යය සඳහා තම සේවය ලබාදීමට හැකියාව ලැබී ඇත. එම නිසා මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇති ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය වේගවත් වී ඇත.

17. ප්‍රධාන කටයුතු හා ඒවායේ ප්‍රගතිය (මූල්‍ය කළමණාකරණය).

| වැය ශීර්ෂය | මූලික වෙන්කිරීම් | FR 94(2) APPL වැය ශීර්ෂය ඉක්මවීම | මුළු ප්‍රතිපාදන | කැපවීම සහ වියදම 2016.01.01 සිට 2016.12.31 |
|---|---|---|---|---|
| 222-01-2-1204 | 1,185,500 000.00 | 223,000,0000.00 | 1,408,500,000.00 | 1,364,006,098.91 |
| 222-01-2-1405 | 5,000,000.00 | - | 5,000,000.00 | 4,810,513.50 |
| 1222-01-1-3-2502 | 60,000,000.00 | - | 60,000,000.00 | 41,142,218.90 |
| | 16,355,007.54 | - | 16,355,007.54 | 7,537,674.57 |
| 222-01-1-3-2502 | 44,916,071.85 | - | 44,916 071.85 | |
| සුව සහන අරමුදල | 60,000,000.00 | - | 60,000,000.00 | 41,142,218.90 |

සංඛ්‍යා සටහන 19.1: ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය.

18. **සංවර්ධන කටයුතු**. පහත දැක්වෙන සංවර්ධන කටයුතු පහත කාලවකවානුව තුල සිදු කරන ලදී.

අ. එක්සත් ජාතීන්ගේ සාම සාධක කටයුතු වලදී මාලි රාජ්‍යය සඳහා පළමු පෙළ රෝහලක් ස්ථාපනය කිරීම හා පවත්වාගෙන යාමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සාර්ථක ලෙස සිදු කර ඇත.

ආ. ශ්‍රී ලංකා යුද හමුදාව විසින් පසුගිය දා ඇති වු ගංවතුර හා නායයෑම් වැනි හදිසි ආපදා තත්වයන්හිදි අනතුරට පත් සිවිල් වැසියන්ට මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් විවිධ ක්‍රම භාවිතා කරමින් ඖෂධ හා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම හා එම කටයුතු සම්බන්ධිකරණය සාර්ථකව සිදුකරන ලදී.

**යුද්ධ හමුදා රෝහල් කළමණාකරණය කිරීම හා නඩත්තු කිරීම පිලිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය**

19. වෛද්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා රෝහල් වෙත පැමිණෙන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවයේ නියතු සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ටද ශ්‍රී ලංකා යුද හමුදා සේවයේ නිරත වී සිටින සාමාජිකයින් හටද අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබාදීම, කළමණාකරණය කිරීම, නඩත්තු කිරීම ඒවායේ පරිපාලනය හා සංවිධානය සඳහා සහාය ලබාදෙමින් ගුණාත්මක සේවාවක් සැපයීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## <u>විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලය</u>

1. යුක්ති මූලධර්මයන්ට හා යුද්ධ හමුදා පනතෙහි ප්‍රකාරව යුද්ධාධිකරණයන් මෙහෙයවීම විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලයේ කාර්යභාරය වේ. විනිසුරු අධිනීතිඥ ජෙනරාල්වරයා විසින් යුද්ධාධිකරණයන්හි මූලසුන දරමින් එකී නඩු කෘත්‍යයන්හිදී උද්ගත වන ඕනෑම නීතිමය කරුණක් හෝ ක්‍රියා මාර්ගයක් සම්බන්ධයෙන් නීතිමය උපදෙස් ලබාදෙනු ලබයි. එසේම යුද්ධාධිකරණයන්හිදී මෙහෙයවනු ලබන සාක්ෂි වාර්තාකරණය විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලයේ ප්‍රධානතම කාර්යයක් වන අතර එකී සාක්ෂි සටහන්හි නිරවද්‍යතාවය හා සුරක්ෂිත භාවය විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලය වගකීමට යටත් වේ.

2. යුද්ධ හමුදා ප්‍රධාන නීති උපදේශක හා විනිසුරු අධිනීතිඥ ජෙනරාල්වරයා ලෙස යුද්ධ හමුදාධිපති තුමා වෙත නීතිමය උපදෙස් ලබාදීම විනිසුරු අධිනීතිඥ ජෙනරාල්වරයා විසින් සිදු කරනු ලබන තවත් එක් වැදගත් කාර්යයක් වේ.

3. **<u>විශ්ලේෂණය සහ ඇගයීම</u>**. ඕනෑම අධිකරණයන්හි සාර්ථකත්වය රදා පැවැත්මෙහිලා බලපාන ප්‍රධානතම කාරණාවන් දෙකකි. ඒවා නම් ලබාදෙනු ලබන නඩු තීන්දුවෙහි ගුණාත්මකභාවය සහ කිසිදු අතපහසුවීමක් නොමැති බැව් තහවුරු කරගැනීමයි. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදෙනු ලබන නව නඩු තීන්දු හා අනෙකුත් ප්‍රජාතන්ත්‍රවාදී රටවල්හි ශ්‍රේෂ්ඨාධිකරණ ලබා දෙන නඩු තීන්දු අධ්‍යයනය කිරීම මගින් විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලය විසින් නිරතුරුවම තම නීතිමය දැනුම යාවත්කාලීන කරගැනීමෙහිලා කටයුතු කරනු ලබයි. 2015 වර්ෂයේ විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලයෙහි පැවති යුද්ධාධිකරණ නඩු විභාග 07 අතුරින් 2016 වර්ෂය සඳහා ඉදිරියට පැවැත්වීමට ශේෂව ඇත්තේ එක් නඩු විභාගයක් පමණි.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

## <u>යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථානය</u>

1. යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථානය 2016 ජනවාරි 29 වන දින දියතලාවේදී ආරම්භ කරන ලදි.මෙම ආඥා මූලස්ථානයේ මූලසුන හොබවන ලබන්නේ මේජර් ජෙනරාල් නිලය හොබවන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විසිනි. යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථානයෙහි වගකීම් වනුයේ යුද්ධ හමුදා සිද්ධාන්ත සංවර්ධනය කිරීම, පුහුණු කිරීම හා පර්යේෂණ කිරීම් සම්බන්ධ යුධ උපාය මාර්ග නිර්මාණය කිරීම සහ යාවත්කාලීන කිරීම, අවශ්‍යතා අනුව යුද්ධ හමුදා පුහුණුවීම් වලට අදාල නිර්දේශ සැකසීම වේ. යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථානය පහත දක්වා ඇති සියලුම යුද්ධ හමුදා පුහුණු මූලස්ථාන පාසල් සඳහා මාර්ග උපදේශනය, සංකල්ප හා ප්‍රතිපත්තීන් ලබා දෙයි:




රූප සටහන 22.1: යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථානය යටතේ ඇති සංස්ථා.

2. **<u>වාර්ෂික සමාලෝචනය.</u>** ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුහුණු කටයුතු පිළිබඳ අධීක්ෂණය කිරීම හා යුධෝපායමාර්ග වැඩිදියුණු කිරීම පිළිබඳ සමාලෝචනය සිදුකිරීම මූලික වශයෙන් අරමුණු කොටගෙන යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථානය ස්ථාපනය කරන ලදී. උක්ත අරමුණ පෙරදැරිව මෙම මූලස්ථානය විසින් ප්‍රතිවිප්ලවකාරී සටන්ක්‍රම පිළිබඳව ග්‍රන්ථයක් රචනා කරමින් පවතින අතර මෙයට අමතරව පසුගිය දශක 03 ක කාලය පුරාවට මුහුණදුන් යුධමය අත්දැකීම් අලලා "දශක 03 ක ශ්‍රී ලාංකික යුද අත්දැකීම්" යනුවෙන් ග්‍රන්ථයක් නිර්මාණය කිරීමට කටයුතු සම්පාදනය කර ඇති අතර මෙම මූලස්ථානය වෙතින් ඒ සඳහා වැඩමුළු කීපයක්ද පවත්වා ඇත. මේ වන විට එම ග්‍රන්ථයේ ප්‍රථම කෙටුම්පත සකස් කරමින් පවතී.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

3. **සපුරාගත් ඉලක්කයන්**. මෙම වර්ෂය තුල සපුරාගත් ඉලක්කයන් පහත පරිදි වේ:

අ. ශ්‍රී ලංකා යුද හමුදාවේ ප්‍රකාශන අවශ්‍යතාවයන් සපුරාලීම වස් පහත පරිදි ප්‍රධාන ස්ථාන 04 ක් යටතේ මූලධර්ම හා ඒ සබැදි ප්‍රකාශන සංවිධාන කටයුතු සකස් කරමින් පවතී.

(1) පළමු පෙළ - කැප්ස්ටෝන් ඩොක්ට්‍රින් (Capstone Doctrine).
(2) දෙවන පෙළ - ඩොක්ට්‍රිනල් පබ්ලිකේෂන් රිලවන්ට් ටු ඕල් (Doctrinal publications relevant to all arms.)
(3) තුන්වන පෙළ - ඩොක්ට්‍රිනල් පබ්ලිකේෂන් ස්පෙෂිෆිකේෂන් ටු ආර්මිස් (Doctrinal publications specific to arms).
(4) හතරවන පෙළ - පබ්ලිකේෂන්ස් බයි රෙස්පෙක්ටිව් ට්‍රේනිං එස්ටැබ්ලිෂ්මන්ට් (Publications by respective training establishments).

ආ. පළමු පෙල ප්‍රකාශනය යුද්ධ හමුදා කැප්ස්ටෝන් ඩොක්ට්‍රින් (Capstone Doctrine) සම්පූර්ණ කර තිබිම හා ප්‍රකාශනය සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත.

ඇ. **පුහුණු අංශය**. පහත සඳහන් අභිලාශයන් සඳහා ලගාවී ඇත.

(1) පුහුණු සම්බන්ධිකරණ සමුළුවේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති විසින් යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථාන අණ හට 2016 සැප්තැම්බර් 22 වන දින සිට සියලුම පුහුණු කටයුතු පිලිබඳ වගකීම භාරගන්නා ලෙස නියෝග කර සිටියේය. එම නිසා යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථානය හට පාඨමාලා පැවැත්වීම, හැසිරවීම හා කාලයන්, විෂයන් දිගු කිරීම සම්බන්ධයෙන් පූර්ණ බලතල ඇත.

(2) බොහෝ යුද්ධ හමුදා පුහුණු පාසල් සඳහා සජීවි වෙඩිතැබිම් උදෙසා වෙඩි පිටියක් එම පුහුණු පාසලට හෝ පුහුණු පාසල් ආසන්නයේ නොමැති වීම හේතු කොටගෙන ඉතා දුෂ්කර ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වී ඇත. එනිසා නව පුහුණු ක්‍රමයක් හඳුනාගැනීම හා හඳුන්වා දීම ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය හරහා සිදු වී ඇත. ආරක්ෂක අමාත්‍යංශය හා පර්යේෂණ හා සංවර්ධන අමාත්‍යංශය මගින් හඳුන්වා දුන් සිමියුලේටර් පද්ධතිය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා හඳුන්වාදීමට සැලැසුම් සකස් කර ඇත. මෙම මූලස්ථානය මගින් සිමියුලේටර් 04 ක් යුද්ධ හමුදා පුහුණු පාසල පාබල පුහුණු මධ්‍යස්ථානය සටන් පුහුණු පාසල ප්‍රගුණ හා සැගවුණු වෙඩික්කරු පුහුණු පාසල් සඳහා ස්ථාපනය කිරීම සඳහා සැලැසුම් කර ඇත.

4. **ප්‍රධාන කාර්යයන් හා ප්‍රගතිය**. යුද්ධ හමුදා පුහුණු අණහි ක්‍රියාකාරකම් හා ප්‍රගතිය පහත පරිදි වේ.

අ. **මූලධර්ම හා මූලධර්ම අංශය**.

(1) රෙජිමේන්තු අත්දැකීම් පොත සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම සඳහා මධ්‍යස්ථාන සේනාවිධායකයන් හට දින දෙකක වැඩමුළුවක් සංවිධානය කර පැවැත්වීම.

(2) හිටපු මිත්‍ර ශක්ති අභ්‍යාසය සඳහා සහභාගී වූ අභ්‍යාස මණ්ඩලයේ සාකච්ඡා සඳහා සහභාගී විය.

ආ. **පුහුණු අංශය**.

(1) ඒකාබද්ධ විශේෂ මෙහෙයුම් අභ්‍යාසය - දියකාවා මෙහෙයුම අභ්‍යාසය 07 යුද්ධ හමුදා අණ හා පුහුණු හි උපදෙස් හා අධීක්ෂණය යටතේ වෙනත් සේවාවන් හා සහයෝග යෙන් සිදුකරන ලදී.

(2) ලුතිතන් කර්නල් නිලයේ සිටින්නා වූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා වූ දින දෙකක සම්මන්ත්‍රණයක්ද මේජර් නිලය සඳහා වු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා දින තුනක සම්මන්ත්‍රණයක්ද යුද්ධ හමුදා පුහුණු මූලස්ථානය (ARTRC) හි මග පෙන්වීම යටතේ නිලධාරි වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානය (OCDC) බුත්තල හිදී පවත්වන ලදී.

(3) අණ හා පුහුණු යටතේ ඇති යුද්ධ හමුදා පුහුණු පාසල් සඳහා සිමියුලේටර් පද්ධතිය හඳුන්වාදීමේ පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.

5. <u>**ක්‍රියාකාරකම් පිළිබඳව විශ්ලේෂණය හා ඇගයීම**</u>

අ. <u>**යුද්ධ හමුදා මූලධර්ම ග්‍රන්ථය ලිවීම**</u>. යුද්ධ හමුදා මූලධර්ම ග්‍රන්ථය ලිවීම සඳහා පිටත නිලධාරීන්ගේ නාමයෝජනා සාර්ථක වූයේ නැත. එම නිසා යුද්ධ හමුදා මූලධර්ම ග්‍රන්ථය ලිවීම මූලධර්ම අංශයේ නිලධාරීන් විසින් කලයුතු අතර පසුව විශේෂඥ අදහස් ලබාගත යුතුය.

ආ. <u>**පුහුණු කිරීමට අදාල ගැටලු**</u>. පුහුණු කිරීමට අදාල ගැටලු සියලුම යුද්ධ හමුදා පුහුණු පාසල් / ආයතන සඳහා විශේෂයෙන් වෙන්කල පුහුණු ප්‍රදේශයන්හි පුහුණුවීම් කටයුතු සිදුකරලීම සඳහා අණ නිකුත් කර ඇත්තේ ආරක්ෂක සේනා මූලස්ථාන හා රෙජිමේන්තු මූලස්ථානයන් යටතේ ඇති යුද්ධ හමුදා පුහුණු පාසල් / වෙනත් පුහුණු පාසල් / ආයතන් හි පවත්වනු ලබන පාඨමාලාවන් නැවත නැවත නොපැවැත්වීමටයි. සියලුම යුද්ධ හමුදා පුහුණු හා අණ දී ඇති උපදෙස් අනුව පාඨමාලා පැවැත්විය යුතුය.

ඇ. <u>**උපකරණ පාලකයින් අධිකාරියට පත්කිරීමේ පුහුණු පාඨමාලාවෙහි විෂය නිර්දේශ සමාලෝචනය කිරීම**</u>. යුද්ධ හමුදා උපකරණ පාලකයින් ප්‍රයෝජනවත් ලෙස සේවයේ යෙදවීම සඳහා දැනට පවතින්නා වූ විෂය නිර්දේශය කාලෝචිත නොමැති වීම හේතුකොට ගෙන සමාලෝචනය කරන ලදි.

ඈ. <u>**ලිපිකරු පාඨමාලාවේ විෂය නිර්දේශය සමාලෝචනය කිරීම**</u>. යුද්ධ හමුදාවේ බොහෝමයක් ආයතන පරිගණක හා සම්බන්ධ ලිපි ලේඛණ සමග කටයුතු කරන අතර ලිපිකරුවන් පරිගණක ලිපිලේඛන සමග හුරුපුරුදු කරලීම සඳහා යුද්ධ හමුදා විෂය නිර්දේශයට පරිඝණක මොඩියුල ඇතුලත් කිරීමට කටයුතු සලකා බලන ලදී.

6. <u>**ගැටලු හා අභියෝග**</u>. ක්ෂේත්‍ර පුහුණු ප්‍රදේශයන්හි සීමිතභාවය නිසා පුහුණු පාසල් බොහෝමයකට තම පුහුණුවීම් පැවැත්වීමේදී විවිධාකාර වූ ප්‍රායෝගික ගැටලු ක්ෂේත්‍ර පුහුණු ප්‍රදේශයන් නොමැතිවීම නිසා මුහුණදීමට සිදු වී තිබේ. එම නිසා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ක්ෂේත්‍ර පුහුණු ප්‍රදේශ ගැසට් කර ඇති නමුදු එම ක්ෂේත්‍ර පුහුණු ප්‍රදේශයන්හි සමීපයෙහි සිවිල් වැසියන් සිටින නිසා භාවිතා කිරීමට නොහැකිය.

7. <u>**අනාගත කාර්යභාරයන්**</u>. යුද්ධ හමුදා පුහුණු ආඥා මූලස්ථානයෙහි අනාගත කාර්යභාරයන් පහත සඳහන් කර ඇතඃ

අ. 2017 වර්ෂය සඳහා පහත සඳහන් නැණ ගවේෂණයන් සිදුකල යුතු බව හඳුනාගෙන ඇත:

(1) දැනට පවතින මූලධර්ම විශේෂඥ දැනුම උපයෝගී කරගෙන පරීක්ෂා කලයුතුය.

(2) පළමුපෙළ ප්‍රකාශන දෙක විශේෂඥ සහය ඇතිව තවදුරටත් සිදුකල යුතුය.

(3) ජ්‍යෙෂ්ඨ අණදෙන නිලධාරී පාඨමාලාව සහ අණ හා ක්‍රම පිළිබඳ පාඨමාලාව නිලධාරී වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (OCDC) හි ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් වූ වහාම ආරම්භ කිරීමට නියමිතය.

(4) ආරක්ෂක අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ආරක්ෂක සේනා මූලස්ථානයන් පිහිටා ඇත. එක් ප්‍රදේශයකට එක් ක්ෂේත්‍ර වෙඩි තැබීම් පිටියක් ලෙස ක්ෂේත්‍ර වෙඩි තැබීම් පිටි සපයා ගත යුතුව ඇත.

(5) 2016 වර්ෂයේදී යුද්ධ හමුදා පුහුණු අණ විසින් ප්‍රකාශන අංශය සඳහා මිලියන 2.6 ක් වටිනා ප්‍රකාශන උපකරණ මිලදී ගන්නා ලදී. එමනිසා ප්‍රමාණවත් දක්ෂ ක්‍රියාකරුවන් පිරිසක් ප්‍රකාශනයන් අංශය සඳහා අවශ්‍ය වේ.

8 **<u>නිර්දේශයන්</u>**. අපේක්ෂිත නිර්දේශයන් පහත සඳහන් පරිදි වේ:

අ. යුද්ධ හමුදා පුහුණු අණ හි පහත සඳහන් ආයතයන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම නිර්දේශ කිරීම තුලින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය සේවා දායකත්වයන් හැකි උපරිමයෙන් ලබාදිය හැක:

(1) පුස්තකාලය.

(2) ප්‍රකාශනය.

ආ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල ඇති පුහුණු පාසල් මගින් පවත්වනු ලබන පුහුණුව, කාර්යභාරය හා කාර්යන් විධිමත්ව පවත්වාගෙන යයි. එහි ඇති ප්‍රයෝජනවත්භාවය හා පිලිගැනීම තවදුරටත් ඔප්නැංවීම සඳහා (කොතලාවල ආරක්ෂක විද්‍යාලය (KDU), ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA), විවෘත විශ්ව විද්‍යාලය හා ජර්මානු කාර්මික විද්‍යාලය හා අනෙකුත් ආයතන) විදේශ සිසුන් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා, ඩිප්ලෝමා සඳහා අවස්ථා හා පහසුකම් සැපයීමට යෝජනා කරයි.

නව පිටුවක් සඳහා තබන ලද හිස්තැනකි

**සමාලෝචනය**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 2016 වර්ෂය තුළ විශාල අභියෝගයන් හමුවේ තම වගකීම් නොපිරිහෙලා ඉටුකිරීමට සමත් විය. මෙම වර්ෂය තුළ පැවරුණු කාර්යභාරයන් හා ව්‍යාපෘතීන් යුද්ධ හමුදාවේ විශිෂ්ඨත්වය ඔප්නැංවෙන අයුරින් සම්පූර්ණ කිරීම තුළින් ජාතියේ මුරදේවතාවන් ලෙස යුද්ධ හමුදාවේ විශිෂ්ඨත්වය ඉහළ මට්ටමකට නඟ සිටුවීමට සමත්ව ඇත.

2. මහ ජනතාව තුළ, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කෙරෙහි ගෞරවනීය හා ඉහළ පිළිගැනීමක් ඇත. පාරිසරික අභියෝගයන් නොතකා, යුද්ධ හමුදා ශාක්‍යතාවන්, සන්නද්ධ හා හටකාර්ය සම්පාදන සහය, සයිබර් මෙහෙයුම්, ජාතික ගොඩනැංවීමේ ව්‍යාපෘති සඳහා දායකත්වය සැපයීම හා හදිසි ආපදා කළමනාකරන වැඩ සටහන් ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය කරුණකි. තවද එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි වල නියුතු භට පිරිස් ශ්‍රී ලංකාවට විශාල ආදායමක් උපයා දෙන අතරතුරම ඔවුන්ගේ දැඩි කැපවීම හා කාර්‍යශූරත්වය තුළින් රටට මෙන්ම යුද්ධ හමුදාවට විශාල ගෙරවයක් ලබා දෙනු ලබයි.

3. ආයතනයක් සතු ප්‍රධාන ගුණාංගය ලෙස එහි ඉලක්කයන් සපුරාගැනිම සඳහා ඇති සංයුජතාව දැක්විය හැක. එම නිසා, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පුහුණුව හා සංවර්ධනය තුළින් තෝරාගත් සුදුසු පුද්ගලයන් නායකයන් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය දැනුම ආකල්ප හා පුහුණුව ලබාදීමට අවශය කටයුතු යොදන ලදී.

4. මෙම වර්ෂය තුළ යුද්ධ හමුදාවේ ධනාත්මක දායකත්වය හා දැඩි කැපවීම වඩා කැපීපෙනෙන ලද කරුණක් වු අතර සිදුකරන ලද සමහර ක්‍රියාකාරකම් තුළින් ලද දැනුම හා පළපුරුද්ද අනාගත අභියෝග සඳහා වඩා කාර්යක්ෂමව හා ඵලදායීව මුහුණදීම සඳහා මග පෙන්වනු ඇත.

ඇමුණුම අ
වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2016

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරි තනතුරු නාම ලේඛණය - 2016

1. **ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති**
ලුතිතන් ජෙනරාල් ඒ ඩබ්ලිව් ජේ සි ද සිල්වා
ආර්ඩබ්ලිව්පි වීඑස්වී යුඑස්පී එන්ඩියු පීඑස්සී - 01.01.2016 - 31.12.2016

2. **මාණ්ඩලික ප්‍රධානි**
අ. මේජර් ජෙනරාල් එම් පී පීරිස් ආර්ඩබ්පි
විඑස්වි යුඑස්පි පීඑස්සී - 12.02.2016 -11.08.2016
ආ. මේජර් ජෙනරාල් යූ ඒ බි මැදවල ආර්එස්පි වීඑස්වී
යුඑස්පි එන්ඩියු පීඑස්සී - 01.11.2016 - 02.12.2016
ඇ. මේජර් ජෙනරාල් එච් සී පී ගුණතිලක ආර්එස්පි විඑස්වි
යුඑස්පි එන්ඩීසී පීඑස්සී - 14.12.2016 - 31.12.2016

3. **නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි**
අ. මේජර් ජෙනරාල් ඊ එම් එම් අඹන්පොල යුඑස්පි - 01.01.2016 -15.02.2016
ආ. මේජර් ජෙනරාල් ඒ කේ එස් පෙරේරා ඩබ්ලිව්ඩබ්ලිව්වි
ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යුඑස්පි එන්ඩියු -16.02.2016 - 30.09.2016
ඇ. මේජර් ජෙනරාල් එච් සී පී ගුණතිලක ආර්එස්පි
විඑස්වි යුඑස්පි එන් ඩි සී පීඑස්සී -01.11.2016 - 15.12.2016
ඈ. මේජර් ජෙනරාල් ආර් වි උඩවත්ත පීඑස්සී ඒට්ඕ -15.12.2016 - 31.12.2016

4. **යුධ සේවා ලේකම්**
අ. මේජර් ජෙනරාල් එන් යු එම් එම් ඩබ්ලිව් සේනානායක
ආර්ඩබ්ලිව්පි ආර්එස්පි පීඑස්සී - 01.01.2016 -14.01.2016
ආ. මේජර් ජෙනරාල් එන්ජේ වල්ගම ආර්එස්පි
විඑස්වි යුඑස්පි එන්ඩියු පීඑස්සී -14.01.2016 -21.12.2016
ඇ. මේජර් ජෙනරාල් පී ඩබ් බි ජයසුන්දර
යුඑස්පි එන්ඩීසී පිඑස්සි අයිජී - 21.12.2016 -31.12.2016

5. **අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික**
අ. මේජර් ජෙනරාල් බි ඒ පෙරේරා ආර්එස්පි යුඑස්පි එන්ඩියු පීඑස්සී- 01.01.2016 -05.09.2016
ආ. මේජර් ජෙනරාල් ඒ පී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්පී
එන්ඩියු පිඑස්සී - 05.09.2016 -31.12.2016

6. **අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කලමනාකරණ**
අ. මේජර් ජෙනරාල් ආර් වි උඩවත්ත පිඑස්සි ඒට්ඕ - 01.01.2016 -14.12.2016
ආ. මේජර් ජෙනරාල් එම් එච් පී මිහිදුකුලසූරිය යූඑස්පී
පීඑස්සී එල්එස්සී - 15.12.2016 -31.12.2016

7. **විධායක ජෙනරාල්**
අ. මේජර් ජෙනරාල් එම් හතුරුසිංහ ආර්එස්පි එන්ඩිසි අයිපි - 01.01.2016 -03.01.2016
ආ. මේජර් ජෙනරාල් එන් උඩවත්ත ඩබ්ඩබ්වී ආර්ඩබ්පී
ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩිසී පීඑස්සී - 18.01.2016 -04.11.2016
ඇ. මේජර් ජෙනරාල් ඒ එස් ද ඉසෙඩ් වික්‍රමරත්න
යූඑස්පී එන්ඩිසී පීඑස්සී අයිජී - 05.11.2016 -31.12.2016

8. **<u>උපකරණ මාස්ටර් ජෙනරාල්</u>**

මේජර් ජෙනරාල් ආර් රත්නසිංහම් - 01.01.2016 -31.12.2016

9. **<u>යුධෝපකරණ මාස්ටර් ජෙනරාල්</u>**

අ. මේජර් ජෙනරාල් පී ඩී එච් කේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී
ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යුඑස්පි එන්ඩීසි පීඑස්සී -01.01.2016 -05.09.2016

ආ. මේජර් ජෙනරාල් පී ඩබ් බී ජයසුන්දර
යුඑස්පි එන්ඩීසී පිඑස්සි අයිජී -05.09.2016 -21.12.2016

ඇ. මේජර් ජෙනරාල් එස් ඩී ටි ලියනගේ ඩබ්ලිව්ඩබ්ලිව්වි
ආර්ඩබ්පි ආර්එස්පී විඑස්වි යුඑස්පි එන්ඩීසි පීඑස්සී - 21.12.2016 -31.12.2016

10. **<u>අධ්‍යක්ෂ ජෙනරාල් පාබල</u>**

අ. මේජර් ජෙනරාල් එස් ඩබ්ලිව් එල් දවුලගල ආර්එස්පි
විඑස්වි යුඑස්පි එන්ඩියු -01.01.2016 -22.01.2016

ආ. මේජර් ජෙනරාල් ඒ පී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්පී
එන්ඩියු පීඑස්සී -22.01.2016 -14.02.2016

ඇ. මේජර් ජෙනරාල් සී පී ගාල්ලගේ ඩබ්ලිව්ඩබ්ලිව්වි
ආර්ඩබ්පි ආර්එස්පී යුඑස්පි යූඑස්ඒඩබ්සී - 14.02.2016 -31.12.2016

11. **<u>යුද්ධ හමුදා පුහුණු අණසක</u>**

අ. මේජර් ජෙනරාල් ඒඑම් පෙරේරා පීඑස්සී - 01.01.2016 -01.02.2016

ආ. මේජර් ජෙනරාල් කේජේ අල්විස් ආර්ඩබ්පී
ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියු පීඑස්සී

ඇ. මේජර් ජෙනරාල් පී ආර් එච් ඩයස් යූඑස්පි එන්ඩීසී පීඑස්සී - 01.02.2016 -04.11.2016

12. **<u>හකාස අණසක</u>**

අ. මේජර් ජෙනරාල් කේ ඩබ් එඩිමා යූඑස්පී - 01.01.2016 -29’07.2016

ආ. මේජර් ජෙනරාල් එම් එච් පී මිහිඳු කුලසූරිය යූඑස්පී
පීඑස්සී එල්එස්සී -29.07.2016 -14.12.2016

ඇ. මේජර් ජෙනරාල් ඩී සි එස් වන්නිආරච්චි එල්එස්සි -29.12.2016 -31.12.2016

13. **<u>ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු</u>**

මේජර් ජෙනරාල් පීඩීඅයි කරුණාරත්න ආර්එස්පි පීඑස්සී - 01.01.2016 -31.12.2016

14. **<u>ප්‍රධාන සංඥා නිලධාරි</u>**

මේජර් ජෙනරාල් කේ ආර් පි රොවෙල් ආර්ඩබ්ලිව්පි යුඑස්පි
එන්ඩියු පීඑස්සී - 01.01.2016 -31.12.2016

15. **<u>අධ්‍යක්ෂ ජෙනරාල් ක්‍රීඩා</u>**

මේජර් ජෙනරාල් පීඑම්ආර් බංඩාර ඩබ්ඩබ්වී යූඑස්පි එන්ඩියූ පීඑස්සී -03.08.2016 -31.12.2016

16. **<u>යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්</u>**

මේජර් ජෙනරාල් එස් එච් මුණසිංහ ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යුඑස්පි - 01.01.2016 -31.12.201

17. **<u>විනිසුරු අධිනීතිඥ ජෙනරාල්</u>**

බ්‍රිගේඩියර් ආර් පි රාජපතිරණ ආර්එස්පි යුඑස්පි පීඑස්සී - 01.01.2016 -31.12.2016

18. **<u>සහකාර යුධ සේවා ලේකම්</u>**

බ්‍රිගේඩියර් එස් එස් වඩුගේ ආර්ඩබ්පී ආර්එස්පි යුඑස්පි පීඑස්සී - 01.01.2016 -31.12.2016

19. **ක්‍රියාන්විත අධ්‍යක්ෂ**
    - අ. බ්‍රිගේඩියර් එච් එච් ඒ එස් පි කේ සේනාරත්න ආර්එස්පි පීඑස්සී - 01.01.2016 -15.12.2016
    - ආ. බ්‍රිගේඩියර් එච් එම් ජේ කේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පි ආර්එස්පි පීඑස්සී - 15.12.2016 -31.12.2016

20. **පුහුණු අධ්‍යක්ෂ**
    - අ. මේජර් ජෙනරාල් කේ පී ඒ ජයසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පි යූඑස්පි එන්ඩීසි පීඑස්සී -01.01.2016 -09.09.2016
    - ආ. බ්‍රිගේඩියර් ජී වී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්පී එන්ඩියූ අයිජී -09.09.2016 -31.12.2016

21. **සැලසුම් අධ්‍යක්ෂ**
    - අ. බ්‍රිගේඩියර් ඩබ්ලිව් ආර් පි ද සිල්වා යූඑස්පි එන්ඩියූ අයිජී -01.01.2016 -24.10.2016
    - ආ. බ්‍රිගේඩියර් එච් කේ එස් ගුණවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී -24.10.2016 -31.12.2016

22. **බුද්ධි අධ්‍යක්ෂ**
    - අ. බ්‍රිගේඩියර් ටි එස් සලේ ආර්ඩබ්ලිව්පි යූඑස්පි පීඑස්සී -01.01.2016 -02.11.2016
    - ආ. බ්‍රිගේඩියර් එම් ඩි යූ වී ගුණතිලක පීඑස්සී - 02.11.2016 -31.12.2016

23. **මනෝ විද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ**
    - අ. බ්‍රිගේඩියර් ඩබ්ලිව් බි ඩි පි ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යූඑස්පි පීඑස්සී - 01.01.2016 -11.01.2016
    - ආ. බ්‍රිගේඩියර් එම් ඩි විජේසුන්දර ආර්එස්පී - 11.01.2016 -31.12.2016

24. **මාණ්ඩලික රාජකාරි අධ්‍යක්ෂ**
    - අ. බ්‍රිගේඩියර් එච් ඩබ්ලිව් එස් ඩි බි පතන්වල ආර්එස්පි එන්ඩියූ - 01.01.2016 -29.10.2016
    - ආ. බ්‍රිගේඩියර් එස්පී සෙනෙවිරත්න - 03.11.2016 -31.12.2016

25. **ජනමාධ්‍ය අධ්‍යක්ෂ**
    - අ. බ්‍රිගේඩියර් කේ ජේ ජයවීර ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යූඑස්පි -01.01.2016 -30.08.2016
    - ආ. බ්‍රිගේඩියර් ඒ ඩබ් එම් පී ආර් සෙනෙවිරත්න ආර්එස්පි යූඑස්පි එන්ඩියූ අයිජී -30.08.2016 -31.12.2016

26. **අධ්‍යක්ෂ ජෙනරාල් පාබල**
    බ්‍රිගේඩියර් ඩබ් ඒ වන්නිආරච්චි ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී අයිජී -01.01.2016 -05.09.2016

27. **ක්‍රීඩා අධ්‍යක්ෂ**
    - අ. බ්‍රිගේඩියර් පි ජේ ඒ ඩබ්ලිව් ගලගමගේ - 01.01.2016 -21.12.2016
    - ආ. බ්‍රිගේඩියර් ඩබ් ඒ වී ඒ සුදසිංහ යූඑස්පී එන්ඩීසී අයිජී -21.12.2016 -31.12.2016

28. **තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ**
    බ්‍රිගේඩියර් කේ එම් ආර් පී කරුණාතිලක පීඑස්සී - 01.01.2016 -31.12.2016

29. **අයවැය හා මූල්‍ය කළමණාකරණ අධ්‍යක්ෂ**
    - අ. බ්‍රිගේඩියර් ඩබ්ලිව් ආර් පලිහක්කාර යූඑස්පි - 01.01.2016 - 02.08.2016
    - ආ. බ්‍රිගේඩියර් ඩබ් පී එල් පද්මකුමාර පීඑස්සී එච්ඩීඑම්සී - 02.08.2016 - 31.12.2016

30. **අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ**
    බ්‍රිගේඩියර් එම් එස් සී පෙරේරා යූඑස්පී - 01.01.2016 - 31.12.2016

31. **වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ**
බ්‍රිගේඩියර් කේ ඒ ඩී එස් එල් පෙරේරා එල්එස්සි - 01.01.2016 -31.12.2016

32. **වත්කම් කලමණාකරණ අධ්‍යක්ෂ**
අ. බ්‍රිගේඩියර් ආර් ෂන්මුහනාදන් එච්ඩීඑම්සි එල්එස්සි - 31.08.2016 -15.11.2016
ආ. බ්‍රිගේඩියර් ඒඑස්ඩී ලියනගේ පීඑස්සී එල්එස්සී - 15.11.2016 -31.12.2016

33. **යහසාධක අධ්‍යක්ෂ**
අ. මේජර් ජෙනරාල් ඒ වී රූපසිංහ -01.01.2016 -21.01.2016
ආ. බ්‍රිගේඩියර් ඩබ් ජී එල් පද්මකුමාර පීඑස්සී එච්ඩීඑම්සී -21.01.2016 -29.07.2016
ඇ. කර්නල් එල් විජේසුන්දර ආර්එස්පී -29.07.2016 -31.12.2016

34. **කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ**
කර්නල් ඒ කේ ඒ බි ගුණරත්න - 01.01.2016 -31.12.2016

35. **පිරිස් පරිපාලන අධ්‍යක්ෂ**
බ්‍රිගේඩියර් ඒ එල් එස් කේ පෙරේරා ආර්එස්පී යූඑස්පී එන්ඩියු - 01.01.2016 -31.12.2016

36. **යුද්ධ හමුදා තූර්ය වාදක හා රංග කලා අධ්‍යක්ෂ**
අ. බ්‍රිගේඩියර් පී එම් එස් ඒ පල්ලේමුල්ල යූඑස්පී අයිජී -01.01.2016 -27.01.2016
ආ. මේජර් ජෙනරාල් එම් එච් පී මිහිදු කුලසූරිය යූඑස්පී පීඑස්සී එල්එස්සී -27.01.2016 -28.07.2016
ඇ. බ්‍රිගේඩියර් එම්එච්එෆ් යුසෆ් යූඑස්පී එල්එස්සී -28.07.2016 -31.12.2016

37. **වෛද්‍ය සේවා අධ්‍යක්ෂ**
බ්‍රිගේඩියර් කේ පී සුමණපාල - 01.01.2016 - 31.12.2016

38. **දන්ත වෛද්‍ය සේවා අධ්‍යක්ෂ**
බ්‍රිගේඩියර් ඊ ජී ජයකොඩි යූඑස්පී - 01.01.2016 - 31.12.2016

39. **වෛද්‍ය උපර්ජන අධ්‍යක්ෂ**
බ්‍රිගේඩියර් ටි ජේ ලියනාරච්චි - 01.01.2016 -31.12.2016

40. **කළමණාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ**
බ්‍රිගේඩියර් බි එස් විදානගේ - 01.01.2016 - 31.12.2016

41. **යුද්ධ හමුදා නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ**
බ්‍රිගේඩියර් එච් ටි වික්‍රමසේකර - 01.01.2016- 31.12.2016

42. **නීතිසේවා අධ්‍යක්ෂ**
බ්‍රිගේඩියර් ඊ එස් ජයසිංහ යූඑස්පී - 01.01.2016 -31.12.2016

43. **විනයාරක්ෂක අධ්‍යක්ෂ**
බ්‍රිගේඩියර් ඩි කේ පී ඩි සිරිසේන යූඑස්පී - 01.01.2016 -31.12.2016

44. **සුභසාධක අධ්‍යක්ෂ**
අ. බ්‍රිගේඩියර් ඩි සි එස් වන්නිආරච්චි එල්එස්සි -01.01.2016 -04.08.2016
ආ. බ්‍රිගේඩියර් ඩබ් ආර් පලිහක්කාර යූඑස්පී -04.08.2016 -31.12.2016

45. **<u>රණවිරු සේවා අධ්‍යක්ෂ</u>**
බ්‍රිගේඩියර් එන් ඒ පි සි නාපාගොඩ යූඑස්පි අයිපි - 01.01.2016 -31.12.2016

46. **<u>පුනරුත්ථාපන අධ්‍යක්ෂ</u>**
බ්‍රිගේඩියර් එස් කේ තිරුණාවුකරසු ආර්එස්පී යූඑස්පි - 01.01.2016 - 31.12.2016

47. **<u>මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ</u>**
බ්‍රිගේඩියර් ජේ ආර් අම්පෙමොහොට්ටි ආර්එස්පි - 01.01.2016 - 31.12.2016

48. **<u>භට නිවාස සම්පාදන අධ්‍යක්ෂ</u>**
බ්‍රිගේඩියර් කේ එන් එස් කොටුවේගොඩ අයිපි - 01.02.2016 -31.12.2016

49. **<u>ගමන් පාලන අධ්‍යක්ෂ</u>**
අ. මේජර් ජෙනරල් එම් මුදන්නායක ආර්එස්පි යූඑස්පි - 01.01.2016 -20.07.2016
ආ. බ්‍රිගේඩියර් එල්එච්එස් වනිගසිංහ ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පි - 20.07.2016 -31.12.2016

50. **<u>ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ</u>**
අ. බ්‍රිගේඩියර් ආර් එම් පෙරෙමුනේ එල්එස්සි -01.01.2016 -14.10.2016
ආ. බ්‍රිගේඩියර් කේජ්පීජේ රත්නායක එල්එස්සී - 14.10.2016 -31.12.2016

51. **<u>සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ ජෙනරල්</u>**
අ. මේජර් ජෙනරල් ඒ කේ පි වික්‍රමසිංහ යූඑස්පි - 01.01.2016 -12.07.2016
ආ. මේජර් ජෙනරල් ඒ වී රූපසිංහ - 19.10.2016 -31.12.2016

52. **<u>යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ</u>**
අ. බ්‍රිගේඩියර් එච් පී අයි විද්‍යානන්ද යූඑස්පි ඒප්ටීඕ එල්එස්සි - 01.01.2016 -27.10.2016
ආ. බ්‍රිගේඩියර් එච් එම් යූ බි හේරත් ආර්එස්පී යූඑස්පී ඒප්ටීඕ එල්එස්සි- 27.10.2016 -31.12.2016

53. **<u>විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ ජෙනරල්</u>**
බ්‍රිගේඩියර් පි එස් ආර් එල් රාජකරුණා එල්එස්සි - 01.01.2016 - 31.12.2016

54. **<u>ආධුනිකයින් බඳවා ගැනීමේ අධ්‍යක්ෂ</u>**
බ්‍රිගේඩියර් ඩී එම් ඩබ්ලිව් ඩබ්ලිව් ඩබ්ලිව් එම් ආර් බි එම්
දවුලගල ආර්එස්පි - 01.01.2016 - 31.12.2016